| 1. | එස්.ඒ ලියනගේ<br>පීඨාධිපති<br>ජ්‍යෝෂ්ඨ කතිකාචාර්ය II ශ්‍රේණිය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. පරිගණක ආශ්‍රිත භාෂා ඉගෙනීම<br>2. වෘත්තීය සංවර්ධනය<br>3. අවසන් වසර ව්‍යාපෘති |
| 2. | එල් ඩබ්ලිව් එස් කුලරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. ඉංග්‍රීසි ඉගෙනීම පිළිබඳ සමාලෝචනය<br>2. භාෂා පන්තිකාමරයේ සාහිත්‍යය<br>3. වෘත්තීය සංවර්ධනය<br>4. ලිවීම ඉගැන්ව<br>5. අවසන් වසර ව්‍යාපෘති අධීක්ෂණය |
| 3. | වයි ජී පද්ම ශාන්ති මෙනවිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව<br><br>ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය<br>2. ඉගැන්වීමේ ඉගෙනුම් ක්‍රම I සහ II<br>3. අවසාන ව්‍යාපෘති අධීක්ෂණය<br>4. සීමාවාසික පුහුණුව |
| 4. | යි එස් මනතුංග මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය<br>අංශ ප්‍රධානි, අධ්‍යාපනය සහ පුහුණු අධ්‍යන අංශය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව<br>තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. අධ්‍යාපනික මනෝවිද්‍යාව<br>2. වෘත්තිකයන් සඳහා මනෝවිද්‍යාව<br>3. උපදේශන මාධ්‍ය<br>4. වෘත්තීය සංවර්ධනය පර්යේෂණ අධීක්ෂණය තේමා පත්රිකා<br>5. සීමාවාසික පුහුණුව |
| 5. | එල් එච් ඩී එල් රණසූරිය මෙනවිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය<br><br>අංශ ප්‍රධානි, භාෂා අධ්‍යන අංශය | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී පාඨමාලාව<br><br>ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. නාට්‍ය<br>2. විශේෂිත අරමුණු සඳහා ඉංග්‍රීසි<br>3. සන්නිවේදන කුසලතා<br>4. උසස් සන්නිවේදනය<br>5. අවසාන වසර ව්‍යාපෘති අධීක්ෂණය |
| 6. | ජේ ඒ එම් බී කරුණාරත්න මෙනවිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව<br>මාධ්‍ය සහ කලා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව | 1. ඉංග්‍රීසි I සහ II හි සන්නිවේදන කුසලතා<br>2. කියවීම ඉගැන්වීම<br>3. ව්‍යවහාරික වාග් විද්‍යාව<br>4. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ |

| | | | |
|---|---|---|---|
| | | අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ව්‍යාපෘති අධීක්ෂණය |
| 7. | ඒ. ඒ ගුණවර්ධන මහත්මිය<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව<br><br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. වාග් විද්‍යාව හැඳින්වීම<br>2. ඉංග්‍රීසි භාෂාව හැඳින්වීම<br>3. ඉංග්‍රීසි ව්‍යුහය<br>4. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ ව්‍යාපෘති අධීක්ෂණය |
| 8. | කේ ටී පී සී සෝමරත්න මෙනවිය කථිකාචාර්ය (පරිවාස) | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. ප්‍රබන්ධ<br>2. භාෂා පරීක්ෂාව සහ ඇගයීම<br>3. සාහිත්‍යය හැඳින්වීම<br>4. පර්යේෂණ අධීක්ෂණය |
| 9. | එල්.ඒ.එම්.එච්.පී.උදයකුමාරි මෙනවිය<br>කථිකාචාර්ය (පරිවාස) | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව<br><br>තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | 1. විෂයමාලා සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම<br>2. අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම<br>3. සීමාවාසික පුහුණුව<br>4. පර්යේෂණ අධීක්ෂණය |
| 10. | ආචාර්ය එස් ඒ එන් ධනුෂ්ක මහතා ගුරු සහායක | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී පාඨමාලාව | 1. අධ්‍යාපනයේ දාර්ශනික සහ සමාජ පදනම<br>2. ඉගෙනීමේ තක්සේරුව<br>3. උපදේශන මාධ්‍ය<br>4. විෂයමාලා සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම<br>5. අධ්‍යාපන කළමනාකරණය<br>6. අවසාන ව්‍යාපෘති අධීක්ෂණය<br>7. සීමාවාසික පුහුණුව |

වගුව 7.6: පීඨයේ ආරාධිත කාර්ය මණ්ඩලයේ සාරාංශය-2022

| උපාධි පාඨමාලාවේ නම | **ලියාපදිංචි වර්ෂය** | **කණ්ඩායම** | සමාසිකය | **බාහිර කථිකාචාර්යවරුන් සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී පාඨමාලාව | 2018/19 | B1 | 6 | 6 (අවසන් වසර ව්‍යාපෘතිය) |
| | | B2 | | 4 (අවසන් වසර ව්‍යාපෘතිය) |
| | 2019/20 | B2 | 4 | 1 |
| | 2020/21 | B2 | 2 | 2 |
| | | B2 | | 2 |
| පරිවර්තන අධ්‍යයන උපාධිය | 2021/22 | B2 | 1 | 6 |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ සිව් අවුරුදු වැඩසටහන | 2021/22 | B2 | 7 | 2 |
| තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | 2021/22 | B1 | 1 | 5 (ICT)<br>3 (Bio)<br>4 (Eng)<br>1 (CT) |
| | | B2 | 1 | 4(ICT) |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 3 (Bio)<br>4 (Eng) |

## 7.6 තාක්ෂණවේදී ශිෂ්‍යයන්ට ලබාදුන් මොඩියුල නිදහස්කිරීම්

මොඩියුල වලින් නිදහස් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කරන ලදී. සිසුන් මොඩියුල වලින් නිදහස් කිරීම් සඳහා සුදුසුකම් ලබන්නේ ඔවුන් NVQ 6 ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් ඇත්නම් පමණි. ශිෂ්‍යයා ඩිප්ලෝමා මට්ටමින් සමාන විෂය සාර්ථකව සම්පූර්ණ කර ඇත්නම් මොඩියුල සඳහා නිදහස් කිරීම් ලබා දෙන ලදී. සාක්ෂි වශයෙන් ඩිප්ලෝමාවේ මුල් පිටපත ඉදිරිපත් කිරීමට සිසුන්ට නියම විය.

නිදහස් කිරීම් අපේක්ෂා කරන සිසුන්ට කාණ්ඩ දෙකක් යටතේ ඉල්ලුම් කළ යුතුව තිබුණි. 01 වන කාණ්ඩයේ සිසුන් සඳහා දේශන හා ප්‍රායෝගික පන්තිවලට සහභාගී වීමට අමතරව, අධ්‍යයන වාර විභාගය ද ඇතුළුව සියලුම තක්සේරු කිරීම් සඳහා නිදහස් කිරීම් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, එම අදාල මොඩියුලයේ ඔහුගේ/ඇයගේ ක්‍රියාකාරිත්වය, ජීපීඒ (GPA) ගණනය කිරීම සඳහා සාමාන්‍ය සාමාර්ථයකට සමාන යැයි සලකන ලදී. 02 වන කාණ්ඩයට අයත් සිසුන් සඳහා දේශන හා ප්‍රායෝගික පන්තිවලට සහභාගී වීමෙන් නිදහස් කිරීම් ලබා දී ඇත. නමුත් අඛණ්ඩ තක්සේරු කිරීම් සම්පූර්ණ කර අධ්‍යයන වාරයේ විභාග සඳහා පෙනී සිටීමට ඔවුන්ට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම ඇගයීම් වලදී සිසුන් ලබාගත් කාර්ය සාධන මට්ටම් ඔවුන්ගේ GPA ගණනය කිරීම සඳහා ගණනය කරන ලදී.

## 7.7 කාර්මික පුහුණු

මාස හයක කාලයක් පවතින කාර්මික පුහුණුව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා වල වැදගත් අංගයකි. විෂයමාලා ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු, මෙම මොඩියුලය 5 වන අධ්‍යයන වාරයේ දී පිරිනමනු ලැබේ. සිසුන් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමඟ එක්ව එහි උපාධි අපේක්ෂක පුහුණු ස්ථානගත කිරීමේ යෝජනා ක්‍රමය යටතේ කර්මාන්තයේ යොදවනු ලැබේ. වැඩසටහන්වල ගුණාත්මක භාවයට හානියක් නොවන පරිදි පාඨමාලා නියමිත පරිදි අවසන් කළ හැකි බවට වග බලා ගැනීම සඳහා වසංගතය හේතුවෙන් ඇති වූ ගැටළු කළමනාකරණය කළ හැකි මට්ටමකට ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම පාඨමාලා සංරචකය සංශෝධනය කරන ලද බව මෙහිදී සටහන් කළ යුතුය.

## 7.8 කාර්මික සම්බන්ධතා කමිටු

පීඨයේ කාර්මික සම්බන්ධතා කමිටු අලුතින් පිහිටුවා ඇති අතර විෂය මාලාව හා විෂය සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම ගැන කමිටුවේ නිරීක්ෂණ ලබා ගැනීමට නියමිතය.

## 7.9 උපාධි වැඩ සටහන්වල විෂයමාලා සංශෝධන

පීඨය මගින් පිරිනමනු ලබන සියලුම උපාධි පාඨමාලා වල පළමු විෂයමාලා සංශෝධන වටය2017 වසර අවසන් වන විට අවසන් කර ඇත. පීඨය මගින් පිරිනමනු ලබන සියලුම උපාධි වැඩසටහන් වල සංශෝධිත විෂයමාලා 2019 වසරේ සිට ක්‍රියාත්මක කර ඇත. තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී උපාධියේ විෂයමාලාව 2022 දී සංශෝධනය කර ඇති අතර ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයේ සම්පූර්ණ වෙනසක් සමඟ වැඩසටහන තාක්ෂණික විෂය ධාරාවන් තුනකින් පැවැත්වීමට හැකි වේ.

## 7.10 පර්යේෂණ

පීඨයේ අලුතින් බඳවා ගත් සාමාජිකයින්ද ඇතුළු සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පර්යේෂණ ක්‍රියාකරකම් වලට අදාල කටයුතු මෙහෙයවා ඇත. 2021 දී පර්යේෂණ සඳහා යෝජනා ඉදිරිපත් කළ පිරිස සිය පර්යේෂණ අවසන් කර එම පර්යේෂණ වාර්තා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කර ඇත. ඔවුන් 2023 දී සිදු කිරීමට නියමිත නව යෝජනා ඉදිරිපත් කර ඇත. සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින් දේශීය හා ජාත්‍යන්තර සඟරාවලට ද ලිපි ඉදිරිපත් කිරීමේ කාර්යයේ නිරත වේ. තවද පීඨ කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකු විසින් පීඨයේ සිසුන් විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනය හා අධීක්ෂණ කටයුතු සිදු කර ඇත.

වගුව 7.7: පර්යේෂණ පත්‍රිකා විස්තර

| # | නම | යෝජනා නාමය |
|---|---|---|
| 1. | පූජ්‍ය ගුරුළුවානේ චන්ද්‍රසිරි හිමි, පද්ම ශාන්ති වයි.ගමගේ | තොරතුරු තාක්ෂණය ප්‍රාථමික පිරිවෙන් විෂයක් ලෙස හඳුන්වාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රත්නපුර අධ්‍යාපන කලාපයේ පිරිවෙන් ගුරුවරුන්ගේ ආකල්ප |
| 2. | ජේ.සී .විදානපතිරණ, එල්.ඩබ්ලිව්.එස්. කුලරත්න | නිපුණතා මත පදනම් වූ විෂය මාලාව පිළිබඳ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ ආකල්ප පිළිබඳ විශ්ලේෂණයක් |
| 3. | එල්.ඩබ්ලිව්.එස්. කුලරත්න, ඩී.ඩී.ඩී. සුරවීර | වෘත්තීය විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිධාරීන්ගේ වෘත්තීය ප්‍රගතිය |
| 4. | කේ.පී.ටී.සී.සෝමරත්න | දෙවන භාෂා පන්ති කාමරයක් ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම සහ ඉගෙනීම සඳහා අව්‍යාජ ද්‍රව්‍ය භාවිතා කිරීම පිළිබඳ ආකල්ප: ගුරුවරුන්ගේ දෘෂ්ටිකෝණය |
| 5. | ඩබ්ලිව්.පී. ඉශංක, ඒ.ඒ. ගුණවර්ධන | ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ඉංග්‍රීසි උච්චාරණය ඉගැන්වීමේ සඵලතාවය : කැබිතිගොල්ලෑව කලාපය පදනම් කරගත් අධ්‍යයනයක් |
| 6. | යූ.පී.එන්.එස්.ගුණතුංග, දිලිනි රණසූරිය | මාර්ගගත ඉදිරිපත් කිරීම් පිළිබඳ සංජානන: කොවිඩ් – 19 වසංගතය අතරතුර මාර්ගගත ඉදිරිපත් කිරීම් සිදු කිරීම පිළිබඳ උපාධි අපේක්ෂක ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳ සිසුන්ගේ අදහස් පිළිබඳ අවබෝධයක් |
| 7. | අයි.යූ.එන්. ලියනගේ, ඒ.ඒ. ගුණවර්ධන | ශ්‍රී ලංකාවේ 6 ශ්‍රේණියේ ESL හදාරන්නන් අතර ස්වර නිෂ්පාදනය /O:/ සහ / Ↄ:/ වෙත විශේෂ සඳහනක් සහිතව උච්චාරණ කුසලතා වර්ධනය කිරීම |
| 8. | මධුෂානි කේ වීරකෝන්, පද්මා ශාන්ති වයි ගමගේ | Zoom තාක්ෂණය ඔස්සේ ඉගැන්වීම් සැසි සඳහා අඩු පැමිණීමට බලපාන සාධක: ශ්‍රී ලංකාවේ ඉබ්බාගමුව අධ්‍යාපන කොට්ඨාසයේ 02 වර්ගයේ පාසල්වල හත ශ්‍රේණියේ සිසුන් මත පදනම් වූ සිද්ධි අධ්‍යයනයක් |
| 9. | ඒ.ඒ. ගුණවර්ධන, ජේ ඒ එම් බී කරුණාරත්න | අධ්‍යාපනය මත ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ සමාලෝචනයක් |
| 10. | එල්. ඒ. එම් හංසනී ප්‍රමිලා උදයකුමාරි | බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ අධ්‍යාපන කලාපයේ කනිෂ්ඨ ද්විතීයික සිසුන් සඳහා මාර්ගෝපදේශ හා උපදේශන අවශ්‍යතා |

**7.11** පීඨ මණ්ඩල රැස්වීම්

වසංගතය හේතුවෙන් පනවා ඇති සීමාවන් හේතුවෙන් පීඨ මණ්ඩල රැස්වීම් සෑම මසකම නොපවත්වන ලද නමුත් පීඨ මණ්ඩලය මාර්ගගත හා භෞතික ක්‍රම දෙකෙන්ම රැස් වූ අතර විස්තර පහත පරිදි වේ.

වගුව 7.8 :පීඨ මණ්ඩල රැස්වීම්

| රැස්වීම් අංකය | මාසය | පැවැත්වූ දිනය |
|---|---|---|
| 18 | ජනවාරි | 06-01-2022 |
| 19 | පෙබරවාරි | 21-02-2022 |
| 20 | මාර්තු | 08-03-2022 |

| | | |
|---|---|---|
| 21 | මැයි | 05-05-2022 |
| 22 | ජුනි | 09-06-2022 |
| 23 | ජුලි | 08-07-2022 |
| 24 | සැප්තැම්බර් | 15-09-2022 |
| 25 | ඔක්තෝම්බර් | 12-10-2022 |
| 26 | නොවැම්බර් | 03-11-2022 |
| 27 | දෙසැම්බර් | 08-12-2022 |

### 7.12 ශිෂ්‍ය නියෝජිතයන්ගේ විස්තර

එච්.එම්.ඩී.එස්. හේරත් මෙනවිය සහ එල්.ජී.එන්.එස්. ගමගේ මහතා අධ්‍යාපන පීඨයේ ශිෂ්‍ය නියෝජිතයන් ලෙස පත් කර තිබුණි.

### 7.13 ශිෂ්‍ය ක්‍රියාකාරකම්

2022 හි විශ්ව විද්‍යාල ශිෂ්‍ය සභාව සමඟ 2022/12/04 දින කෑගල්ල හලගිරිය ප්‍රාථමික විද්‍යාලයේ පැවති "සිසු සිතට සිසිලක්" ලෙස නම් කරන ලද සමාජ සත්කාර ක්‍රියාකාරකම් වැඩසටහන සඳහා සිසුන් සහභාගී විය.

### 7.14 කාර්ය මණ්ඩල බඳවාගැනීම්

2022 දී පීඨයට පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු බඳවා ගන්නා ලදී.

වගුව 7.9 : කාර්ය මණ්ඩල බඳවාගැනීම්

| # | නම | තනතුරු නාමය |
|---|---|---|
| 1. | එල් ඒ එම් එච් පී උදයකුමාරි මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) |

### 7.15 2023 වසරේ ඉලක්ක

භාෂා අධ්‍යයන සහ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තු පවතින්නේ අධ්‍යාපන පීඨය ලෙසින් නම් කරන ලද පීඨයේය. 2022 වර්ෂයේදී පීඨය මඟින් පිරිනමනු ලැබූ උපාධි පාඨමාලා 2023 වර්ෂයේදී තත්ව සහතිකකරණය හා සිසුනට උපරිම ප්‍රතිලාභ සැලසීම අවධාරණය කරමින් පිරිනමනු ලැබේ. සියලුම වැඩසටහන්වල සිව්වන වසර ලෙස විශේෂ උපාධිය ආරම්භ කිරීම ක්‍රියාත්මක කර ඇත.

භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් පරිවර්තන අධ්‍යයනය පිළිබඳ නව උපාධි වැඩසටහනක් ආරම්භ කර ඇත.

පාඨමාලා මාර්ගගතව පිරිනැමීම සහ ප්‍රායෝගික සහ අධ්‍යයන වාර විභාගවල භෞතික සැසි සංවිධානය කිරීම මගින් වසංගතය නිසා ඇති වූ අභියෝග ඉතා සතුටුදායක ලෙස හසුරුවනු ලැබේ.

### 7.16 නව වැඩසටහන්

#### 7.16.1 පශ්චාත් උපාධි වැඩසටහන්

2020 වසරේදී ඇරඹීමට නියමිතව තිබූ අධ්‍යාපන කළමනාකරණ ශාස්ත්‍රපති වැඩසටහනක් කල් දමන ලදී. ඊට හේතු වූයේ ශාස්ත්‍රපති මට්ටමේ වැඩසටහන් ඇරඹීමට පෙර සියලුම උපාධි වැඩසටහන්වලට සිව්වන වසර අධ්‍යයන කටයුතු ඇරඹීමට අධ්‍යයන සභාව විසින් ගත් තීරණයයි.

# 8. කාර්මික තාක්ෂණ පීඨය

## 8.1 හැඳින්වීම

කාර්මික තාක්ෂණ පීඨය 2019 දෙසැම්බර් මස ස්ථාපිත කරන ලද අතර 2021 ජනවාරියේදී පීඨාධිපතිවරයා පත් කිරීමත් සමග පියයේ කටයුතු විධිමත්ව ඇරඹී ඇත.

- කෘෂිකර්ම හා ආහාර අධ්‍යයන අංශය
- සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයන අංශය
- ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයන අංශය
- කළමනාකරණ අධ්‍යයන අංශය

**ඒ අනුව, පීඨය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් පහත පරිදි වේ.**

වගුව 8.1: පීඨය විසින් පිරිනමන උපාධි වැඩසටහන්

| # | උපාධිය | පිරිනැමීම් ක්‍රමය |
|---|---|---|
| 1. | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සති අන්ත වැඩසටහන(B2) |
| 2. | ආහාර පිරිසැකසුම පිළිබඳ තාක්ෂණවේදී | සතියේ දින(B1) හා සති අන්ත (B2) |
| 3. | සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණවේදී | සති අන්ත වැඩසටහන(B2) |
| 4. | මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණවේදී | සතියේ දින |
| 5. | කාර්මික කළමනාකරණ තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සතියේ දින(B1) හා සති අන්ත (B2) |
| 6. | හෝටල් කළමනාකරණය උපාධිය | සති අන්ත වැඩසටහන(B2) |

**2022 වර්ෂයේදී පීඨ පැතිකඩ පහත පරිදි පුළුල් කරමින් නව අධ්‍යයන දෙපාර්තමේන්තු දෙකක් පීඨයට එක් කරන ලදී. මෙම නව දෙපාර්තමේන්තු පිටුපස ඇති තාර්කිකත්වය පහත විස්තර කෙරේ.**

- **සංචාරක අධ්‍යයන දෙපාර්තමේන්තුව**
- **රෙදිපිළි හා ඇඟලුම් තාක්ෂණ දෙපාර්තමේන්තුව**
-

**2023 වසරේ සිට සියලුම උපාධි** වැඩසටහන් **සතියේ දින සහ සති අන්ත යන කණ්ඩායම් දෙකටම පිරිනැමීමට තීරණයක් ගන්නා ලදී.**

**4** වන වසර ගෞරව උපාධි වැඩසටහන්

විශ්ව විද්‍යාලය ප්‍රතිපත්තිමය තීරණයක් වශයෙන් දැනට පවතින සියලුම උපාධි පාඨමාලා 4 වන වසර ගෞරව උපාධි දක්වා උසස් කල අතර තුන්වන වසර අවසානයේ පිටවීමේ ලක්ෂ්‍යයක් සහිතව ඕනෑම සිසුවෙකුට සාමාන්‍ය උපාධියක් ලබා රැකියා බළකායට බැඳීමට ඉඩ සලස්වන ලදී . ගෞරව උපාධි හඳුන්වා දෙන ලද්දේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා යොමු වීමට අදහස් කරන අය සඳහා වඩාත් තීව්‍ර විෂය විශේෂඥතාවක් පිරිනැමීමේ අරමුණින් වන අතර මෙමඟින් දෙපාර්තමේන්තුව සඳහා අදාළ වෘත්තීය ආයතනවලින් ප්‍රතීතනය ලබා ගැනීම, පර්යේෂණ පෝෂණය කිරීම සහ විශ්වවිද්‍යාලයේ නව අධ්‍යයන පරම්පරාව නිෂ්පාදනය කිරීම සඳහා රුකුලක් ලැබේ. ගෞරව උපාධි යනු උපාධි මට්ටමින් උසස් මට්ටමේ ජයග්‍රහණ සහ අධ්‍යාපනය පෙන්නුම් කිරීමකි. හෝටල් කළමනාකරණ උපාධි පාඨමාලා (තවමත් තෙවන වසර සම්පූර්ණ කර නොමැති සිසුන්) සහ කාර්මික කළමනාකරණය (ප්‍රමාණවත් සිසුන් අයදුම් කර නොමැත) හැර අනෙකුත් පාඨමාලා සඳහා ගෞරව උපාධිය සඳහා පළමු බඳවා ගැනීම 2022 ජූලි මාසයේදී සිදු විය.

ඒකාබද්ධ උපාධි වැඩසටහන්

**විශ්ව විද්‍යාලයට බාහිර සහයෝගීතාවය සඳහා වන පුහුණු සංග්‍රහයක් ඇති අතර එමඟින් අදාළ කර්මාන්තයේ පිළිගැනීමක් ඇති තුන්වන ආයතනයක් සමඟ උපාධිය සැලසුම් කිරීම සහ පැවැත්වීම සක්‍රීය කරයි. ඒ අනුව 2022 මාර්තු මාසයේදී විශ්වවිද්‍යාලය සහ පහත සඳහන් ආයතන අතර අවබෝධතා ගිවිසුම් තුනක් අත්සන් කර** ඇත.

- **ජාතික වැවිලි කළමනාකරණ ආයතනය** (NIPM)
- **රෙදිපිළි හා ඇඟලුම් ආයතනය** (SLITA)
- **ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය** (SLITHM)

සංචාරක අධ්‍යයන දෙපාර්තමේන්තුව

හෝටල් කළමනාකරණය නමින් උපාධි පාඨමාලාව 2019 වසරේ වැඩසටහන දියත් කළ දින සිට කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වනු ලැබේ. මෙම අංශයේ සුවිශේෂත්වය සහ පරිපාලනමය අරමුණු සලකා බලා එහිම විනයකින් යුත් දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට පසුව තීරණය විය.

**රෙදිපිළි හා ඇඟලුම් තාක්ෂණ දෙපාර්තමේන්තුව**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ උපාධි වැඩසටහනක් සඳහා ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය (SLITA) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සලකා බැලීමෙන් අනතුරුව, SLITA සහ විශ්ව විද්‍යාලය අතර රෙදිපිළි හා ඇඟලුම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණ උපාධියක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
ඒකාබද්ධ උපාධි වැඩසටහන් සලකා බැලිය හැක්කේ අභ්‍යන්තර අධ්‍යයන පැතිකඩ සමඟ අනුකූල නම් පමණි. එබැවින් මෙම ඒකාබද්ධ උපාධි වැඩසටහන කළමනාකරණය කිරීම සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලදී.

**ආහාර සැකසුම් තාක්ෂණ දෙපාර්තමේන්තුව**

භෝග තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ තාක්ෂණ උපාධිය නමින් ඒකාබද්ධ උපාධි වැඩසටහනක් කාර්මික තාක්ෂණ පීඨය විසින් ආරම්භ කර ඇති අතර ජාතික වැවිලි කළමනාකරණ ආයතනය (NIPM) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම 2022 මැයි මස 13 වන දින සිදු කරන ලදී. NIPM සමඟ ගිවිසුම 2022 දෙසැම්බර් 6 වන දින අත්සන් කරන ලදී.

**නව උපාධි වැඩසටහන්**

විලාසිතා නිර්මාණ සහ ව්‍යවසායකත්වය පිළිබඳ උපාධිය

නව දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟ, හරිත නිෂ්පාදන සංවර්ධන ශිල්පීය ක්‍රම සහ විලාසිතා සහ ව්‍යාපාරවල පරිසර හිතකාමී ක්‍රියාවලීන් සම්බන්ධයෙන් චක්‍රලේඛන විලාසිතා, මන්දගාමී විලාසිතා සහ සවිඥානික විලාසිතා පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා අවධාරණය කරනු ලැබේ. නව උපාධි වැඩසටහනක් මඟින් ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා තිරසාර විලාසිතා නිෂ්පාදන සැලසුම් සහ සංවර්ධනය, ද්‍රව්‍ය මූලාශ්‍ර,

නිෂ්පාදනය, අලෙවිකරණය, විකිණීම සහ පරිභෝජනය පිළිබඳ තාක්ෂණික දැනුම යෙදවීමට උපාධි අපේක්ෂකයින්ට අවස්ථාව සැලසේ.
එබැවින් මෙම වැඩසටහනේ අරමුණ වන්නේ විලාසිතා නිර්මාණකරණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය යනු ව්‍යාපාරයක් ලෙස විලාසිතා ලාභය ඉහළ නැංවීම සඳහා තිරසාර විලාසිතා භාවිතයන් සහ නවීන විලාසිතා ව්‍යාපාර ආකෘති සඳහා දායක විය හැකි උපාධිධාරීන් බිහි කිරීමයි. විෂයමාලා සංවර්ධනය සිදු වෙමින් පවතී.

**පසු අස්වනු ආහාර රසායනාගාරයක් පිහිටුවීම**

ආහාර සැකසුම් සහ පසු අස්වනු හැසිරවීමේ නවෝත්පාදන විද්‍යාගාරය වටිනාකම් දාමය ඔස්සේ ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය වැඩි කිරීමට කටයුතු කරයි.
නවෝත්පාදන විද්‍යාගාරය කුඩා වතු ගොවීන්ගේ වියලීමේ සහ ගබඩා කිරීමේ ධාරිතාව වැඩිදියුණු කිරීම මගින් මෙම වර්ධනය සාක්ෂාත් කර ගන්නා අතර එමගින් ගුණාත්මක නිෂ්පාදන වෙළඳපොළට ගෙන ඒමට හැකි වේ.
පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා සැකසූ නිෂ්පාදනවල වර්ග සහ පෝෂණ ගුණය විවිධාංගීකරණය කිරීමෙන් වෙළඳපල අවස්ථා පුළුල් කිරීමට ද රසායනාගාරය ක්‍රියා කරයි. රසායනාගාරය 2022 මැයි මාසයේදී ආහාර දෙපාර්තමේන්තුවට යාබදව පිහිටුවා ඇත.

**ආගන්තුක සත්කාර පිළිබඳව කුඩා විද්‍යාගාරයක් පිහිටුවීම**

සංචාරක අධ්‍යයන දෙපාර්තමේන්තුව එහි දැනට පවතින හෝටල් කළමනාකරණය පිළිබඳ උපාධිය සඳහා සතියේ දින වැඩසටහන සඳහා 2022 බඳවා ගැනීම (2023 මාර්තු මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත) සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟ ඒකාබද්ධ ආගන්තුක සත්කාර කළමණාකරණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි වැඩසටහනක් ( SLITHM) ආරම්භ කිරීම සඳහා මෙය මඟ පෙන්වයි. විද්‍යාගාරය 2 වන මහලේ, නව ගොඩනැගිල්ලේ පිහිටා ඇත.

## 8.2 සිසුන් බඳවා ගැනීම- 2021/2022 අධ්‍යයන වර්ෂය

වගුව 8.2: සිසුන් බඳවා ගැනීම –2021

| # | උපාධි වැඩසටහන | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | **සතියේ දින (B1)** | **සතිඅන්ත (B2)** |
| 1 | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | NA | 61 |
| 2 | ආහාර සැකසුම පිළිබඳ තාක්ෂණවේදී | 49 | 52 |
| 3 | සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණවේදී | NA | 21 |
| 4 | මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 48 | NA |
| 5 | කාර්මික කළමනාකරණ තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 37 | 50 |
| 6 | හෝටල් කළමනාකරණය | NA | 25 |
| ***සතියේ දින සහ සති අන්ත වැඩසටහන් සඳහා කාර්මික තාක්ෂණ පීඨයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය එකතුව*** | | **134** | **209** |

## 8.3 2021/2022 නවක සිසුන් බඳවා ගැනීම සඳහා සමාරම්භක උත්සවය

2021/22 අධ්‍යයන වර්ෂය සඳහා සමාරම්භක උත්සවය 2022 මාර්තු 09 වන දින ZOOM මාර්ගගත වේදිකාව ඔස්සේ පවත්වන ලදී. මෙම අවස්ථාව පුළුල් ආවරණය සඳහා YouTube සහ Facebook සමාජ මාධ්‍ය යෙදුම භාවිතයෙන් සජීවීව විකාශය කරන ලදී. දිශානති වැඩසටහන 2022 මාර්තු 15 සහ 17 දිනවල සතියේ දින වැඩසටහන් සඳහා ද 20 සහ 21 සති අන්ත වැඩසටහන් සඳහා ද සැලසුම් කර ඇත. ZOOM වේදිකාව හරහා මාර්ගගත මාදිලිය භාවිතා කරමින් දිශානති වැඩසටහන පවත්වන ලදී.

සතියේ දින වැඩසටහන සඳහා තෝරාගත් සිසුන්ගේ දැනුම පරතරය පිරවීම සඳහා / පදනම් වැඩසටහන (සති 04) පැවැත්වූ අතර පළමු අධ්‍යයන වාරය සති 15ක කාලයකට සැලසුම් කර තිබිණි. දිශානතිගතකිරීම් වැඩසටහනෙන් පසු සති අන්ත සිසුන් සඳහා වැඩසටහන් ආරම්භ කරන ලද අතර එය සති අන්ත 22කට සැලසුම් කර තිබිණි.

## 8.4 කාර්මික තාක්ෂණ පීඨය විසින් පිරිනමන උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය ගහනය

කාර්මික තාක්ෂණ පීඨය විසින් පිරිනමන තාක්ෂණවේදී උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය ගහනය පිළිබඳ තොරතුරු 8.3. වගුවෙහි දක්වා ඇත.

වගුව 8.3 කාර්මික තාක්ෂණ පීඨයේ සමස්ත ශිෂ්‍ය ගහනය

| උපාධි වැඩසටහන | 2016 සතිඅන්ත | 2017 සතියේ දින | 2017 සතිඅන්ත | 2018 සතියේ දින | 2018 සතිඅන්ත | 2019 සතියේ දින | 2019 සතිඅන්ත | 2020 සතියේ දින | 2020 සතිඅන්ත | 2021 සතියේ දින | 2021 සතිඅන්ත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආහාර පිරිසැකසුම් තාක්ෂණය | 45 | 42 | 44 | 41 | 52 | 49 | 43 | 52 | 54 | 52 | 43 |
| කාර්මික කළමනාකරණ තාක්ෂණය | 24 | 42 | 20 | 40 | 33 | 40 | 41 | 53 | 50 | 53 | 41 |
| සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය | 31 | -- | 36 | -- | 26 | -- | 27 | -- | 21 | -- | 27 |
| ප්‍රමාණ සමීක්ෂණය | 56 | -- | 83 | -- | 63 | -- | 59 | -- | 57 | -- | 59 |
| මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය | -- | -- | -- | -- | -- | 39 | -- | 40 | -- | 40 | -- |
| හෝටල් කළමනාකරණය | -- | -- | -- | -- | -- | -- | 16 | -- | 15 | -- | 15 |
| **එකතුව** | 156 | 84 | 183 | 81 | 174 | 128 | 186 | 145 | 196 | 145 | 185 |

**සිසුන්ගේ ඉල්ලීම්**

වගුව 8.4 : සිසුන්ගේ ඉල්ලීම්

| **පීඨ මණ්ඩල රැස්වීම් අංකය** | **සිසුන්ගේ ඉල්ලීම්** | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **වෛද්‍ය නිර්දේශ මත පළමු පෙනීසිටීම ලෙස සැලකීම්** | **ලියාපදිංචිය අවලංගු කිරීම්** | **අධ්‍යන කටයුතු කල්තැබීම්** | **කණ්ඩායම් මාරුවීම්** | **වෙනත්** | **පීඨ මණ්ඩල රැස්වීම් සඳහා නැවත සලකා බැලීම්** | **අධ්‍යන කවුන්සිල අනුමැතිය නොලැබීම්** |
| 18 | 04 | 03 | | 01 | | 02 | 01 |
| 19 | 03 | 01 | 01 | | 01 | 06 | 01 |
| 20 | | 02 | | | | | |
| 21 | 01 | 02 | | | 02 | 01 | 02 |
| 22 | 04 | 02 | | | | 04 | |
| 23 | 13 | 02 | | 01 | 02 | | 01 |
| 24 | 03 | 02 | 02 | | | 10 | |
| 25 | | 01 | 01 | | 02 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 26 | 01 | 04 | 01 | | | 01 | 01 |
| එකතුව | 27 | 19 | 05 | 02 | 07 | 24 | 06 |

## 8.5 2022 දී පීඨය සඳහා පවත්වනු ලබන විභාග

**සතියේ දිනවල සහ සති අන්ත කාණ්ඩ සඳහා 2022 අවසානය වන විට පවත්වනු ලබන විභාග පිළිබඳ විස්තර 8.5 වගුවේ දක්වා ඇත.**

**<u>සතියේ දින වැඩසටහන්</u>**

- මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය

**<u>සතිඅන්ත වැඩසටහන්</u>**

- ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී
- සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය
- හෝටල් කළමනාකරණය

**<u>සතියේ දින සහ සතිඅන්ත වැඩසටහන්</u>**

- ආහාර සැකසුම් තාක්ෂණය
- කාර්මික කළමනාකරණ තාක්ෂණය

| Batch | B1 | | | | | | B2 | | | | | | B1 | | | | | | B2 | | | | | | B1 | | | | | | B2 | | | | | | B1 | | | | | | B2 | | | | | | B1 | | | | | | B2 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S1 | S2 | S3 | S4 | S5 | S6 | S7 | S8 |
| ප්‍රමාණ සමීක්ෂණය සඹබඳ තාක්ෂණවේදී | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | √ | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | √ | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | | | | | | √ | |
| ආහාර සැකසුම් තාක්ෂණය | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | | | √ | √ | √ | √ | | | √ | √ | | | | | √ | √ | | | | | √ | | | | | | √ | | | | | | | |
| සිතුවම හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | √ | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | √ | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | | | | | | √ | |
| මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය | බඳවාගැනීම් නොමැත | | | | | | ~~බඳවාගැනීම් නොමැත~~ | | | | | | ~~බඳවාගැනීම් නොමැත~~ | | | | | | ~~බඳවාගැනීම් නොමැත~~ | | | | | | √ | √ | √ | √ | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | | |
| කාර්මික කළමනාකරණ තාක්ෂණය | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | | | √ | √ | √ | √ | | | √ | √ | | | | | √ | √ | | | | | | | | | | | | | | | | | | |
| හෝටල් කළමනාකරණය | බඳවාගැනීම් නොමැත | | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | √ | √ | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | √ | | | | | බඳවාගැනීම් නොමැත | | | | | | √ | | | | | | | |

වගුව 8.6 2022 වසරේ පවත්වන ලද විභාග

වගුව 8.7 පීය මණ්ඩල රැස්වීම්

| පීය මණ්ඩල රැස්වීම අංක | දිනය |
|---|---|
| 18 | 2022 ජනවාරි 05 |
| 19 | 2022 පෙබරවාරි 10 |
| 20 | 2022 මාර්තු 07 |
| 21 | 2022 මැයි 05 |
| 22 | 2022 ජුනි 09 |
| 23 | 2022 ජූලි 14 |
| 24 | 2022 සැප්තැම්බර් 13 |
| 25 | 2022 ඔක්තෝබර් 13 |
| 26 | 2022 නොවැම්බර් 08 |

**ප්‍රදර්ශනය සහ තරඟ සඳහා සහභාගී වීම**

PROFOOD PROPACK & AGBIZ 2022 **ජාත්‍යන්තර ප්‍රදර්ශනය,** 2022 **නොවැම්බර්** 18 **සිට** 20 **දක්වා,** BMICH

## 8.6 බාහිර කථිකාචාර්යවරුන් 2022

**පහත සඳහන් කරුණු හේතුවෙන් පීඨය බාහිර කථිකාචාර්යවරුන්ගේ සහ සම්පත් දායකයින්ගේ සේවය ලබා ගනිමින් සිටී.**

- ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඌණතාවය
- විවිධ ක්ෂේත්‍රයන්හි විද්වතුන් සහ අනෙකුත් විශ්ව විද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය අංශයන් සමඟ වඩා ශක්තිමත් සබඳතාවයක් ස්ථාපිත කර ගැනීම

**සියලුම උපාධි වැඩසටහන් සඳහා පීඨය විසින් සේවයේ යොදවා ඇති බාහිර කථිකාචාර්යවරුන්ගේ විස්තර** 8.7 **වගුවේ දක්වා ඇත.**

වගුව 8.8: බාහිර කථිකාචාර්යවරුන් - 2022

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | ලියාපදිංචි වූ පළමු වර්ෂය | පැවැත්වුණු අයුරු | අධ්‍යයන වාරය | බාහිර කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017/2018 | B2 | 05 | - |
| | | 2018/2019 | B2 | 04 | 9 |
| | | 2019/2020 | B2 | 02 | 7 |
| | | 2017/2018 | B1 | 06 | 3 |
| | | 2018/2019 | B1 | 04 | 10 |
| | | 2019/2020 | B1 | 02 | 4 |
| 02 | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017/2018 | B2 | 05 | 1 |
| | | 2018/2019 | B2 | 04 | 9 |
| | | 2019/2020 | B2 | 02 | 11 |
| 03 | සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017/2018 | B2 | 05 | - |
| | | 2018/2019 | B2 | 04 | 11 |
| | | 2019/2020 | B2 | 02 | 12 |
| 04 | මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ | 2019/2020 | B1 | 02 | 5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තාක්ෂණවේදී | 2019/2020 | B1 | 03 | 5 |
| 05 | කාර්මික කළමනාකරණ තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017/2018 | B2 | 05 | - |
| | | 2018/2019 | B2 | 04 | 7 |
| | | 2019/2020 | B2 | 02 | 7 |
| | | 2017/2018 | B1 | 06 | 4 |
| | | 2018/2019 | B1 | 04 | 4 |
| | | 2019/2020 | B1 | 02 | 4 |
| 06 | හෝටල් කළමනාකරණය | 2019/2020 | B2 | 02 | 5 |
| | | 2019/2020 | B2 | 03 | 6 |

## 8.7 කාර්ය පාදක කාර්මික පුහුණුව

කාර්ය පාදක කාර්මික පුහුණුව මාස හයක කාලයක් පුරා නිරත විය යුතු, තාක්ෂණ උපාධි පාඨමාලා වල ඉතා වැදගත් අනිවාර්ය අංගයකි. මෙම මොඩියුලය සාමාන්‍යයෙන් පස්වන අධ්‍යයන වාරයේ දී පිරිනමනු ලැබේ. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ එක්ව එහි උපාධි අපේක්ෂක පුහුණු ස්ථානගත කිරීමේ යෝජනා ක්‍රමය යටතේ සිසුන් ඔවුන්ට අදාළ විවිධ කර්මාන්ත සඳහා ඇතුළත් කරනු ලැබේ. සිසුන්ගේ ශ්‍රේණියේ ශ්‍රේණියේ ලකුණු සාමාන්‍යය (GPA) ගණනය කිරීමේදී මෙම සංරචකය සලකා බලන බැවින් සිසුන්ගේ කාර්ය පාදක කාර්මික පුහුණුව තක්සේරු කිරීම සඳහා විස්තීරණ ඇගයීම් ක්‍රමයක් සකස් කරන ලදී.

වගුව 8.9: සිසුන් සඳහා රැකියා පුහුණුව පිළිබඳ විස්තර

| වසර | උපාධි වැඩසටහනේ නම | සිසුන් සංඛ්‍යාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 2017 | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 40 | ප්‍රමාණ සමීක්ෂණය |
| 2018 | | 41 | |
| 2019 | | 27 | |
| 2020 | | මෙතෙක් ආරම්භ කර නොමැත | |
| 2021 | | මෙතෙක් ආරම්භ කර නොමැත | |
| 2017/B1 | ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 40 | ආහාර සහ කෘෂිකර්ම |
| 2017/B2 | | 22 | |
| 2018/B1 | | 39 | |
| 2018/B2 | | 33 | |
| 2017 | හෝටල් කළමනාකරණය | අදාල නොවේ | අදාල නොවේ |
| 2018 | | | |
| 2019 | | | |
| 2020 | | | |
| 2021 | | | |
| 2017 B2 | සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 15 | සිනමා හා රූපවාහිනී |
| 2018 B2 | | 13 | |
| 2019 B2 | | 14 | |
| 2020 | | අදාල නොවේ | |

| | | | |
|---|---|---|---|
| 2021 | | අදාල නොවේ | |
| 2017 B1 | මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | - | |
| 2018 B1 | | - | |
| 2019 B1 | | 35 | මාධ්‍ය |
| 2020 B1 | | අදාල නොවේ | |
| 2021 B1 | | අදාල නොවේ | |
| 2017 B1 | කාර්මික කළමනාකරණ තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 42 | කර්මාන්ත පුහුණුව |
| 2018 B1 | | 38 | |
| 2019 B1 | | 40 | |
| 2020 | | | |
| 2021 | | | |
| 2017 B2 | | 14 | වැඩ පදනම් කරගත් පුහුණුව |
| 2018 B2 | | 17 | |
| 2019 B2 | | 20 | |
| 2020 | | | |
| 2021 | | | |

## 8.8 උපාධි ප්‍රදානෝත්සවය - 2022

වගුව 8.10: උපාධිධාරීන්ගේ විස්තර

| # | උපාධි වැඩසටහන | 2016 B2 | | 2017 B1 | | 2017 B2 | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | ගැහැණු | ගැහැණු | ගැහැණු | ගැහැණු | එකතුව |
| 1 | ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 14 | 12 | 4 | 25 | - | - | 55 |
| 2 | කාර්මික කළමනාකරණ තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 6 | 4 | 9 | 9 | - | - | 28 |
| 3 | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 25 | 12 | - | - | - | - | 37 |
| 4 | සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 16 | 4 | - | - | - | - | 20 |
| 5 | මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | - | - | - | - | - | - | 0 |
| 6 | හෝටල් කළමනාකරණය | - | - | - | - | - | - | 0 |

## 8.9 මාර්ගගත බෙදාහැරීමේ ද්වාරය

දත්ත සමුදායන් මත පදනම් වූ මාර්ගගත බෙදාහැරීමේ ද්වාරය මාර්තු මස අවසානයේදී හඳුන්වා දෙන ලද අතර අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසීමෙන් විශ්වවිද්‍යාලය විසින් පිරිනමන වැඩසටහන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඕනෑම කෙනෙකුට එමගින් ලබාගත හැක. මෙම මාර්ගගත වැඩසටහන් බෙදා හැරීමේ වේදිකාව කාර්ය මණ්ඩල සාමාජිකයන් වැඩ කරන කාලය අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් සහිත මෙන්ම ඔවුන්ගේ භෞතික පිහිටීම ද ග්‍රහණය කර ගන්නා මාර්ගගත උපකරණ පුවරුවට ප්‍රවේශය ලබා දී ඇත. මෙය මෙම පද්ධතියේ වටිනා අංගයක් වන අතර, මෙමගින් විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩලයේ සංචලතාව සහ හදිසි

අවස්ථා සඳහා ප්‍රවේශය හෝ වසාදමා ඇති කාලය තුළ ඕනෑම උපකාරයක් සොයාගත හැකිය. මෙමගින් සිසුන්ට දේශන පැවැත්වීමේ වේලාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට හැකි වූ අතර අමාත්‍යාංශ නිලධාරීන්ට ද මෙම වේදිකාව හරහා මාර්ගගත බෙදාහැරීමේ වැඩසටහන පිළිබඳ වත්මන් තොරතුරු ලබා ගත හැකිය.

## 8.10 විෂයමාලා සංවර්ධනය සහ සංශෝධන

**ගුණාත්මක පාඨමාලා සංවර්ධනයට පමණක් නොව අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහතික කරන ප්‍රතිපෝෂණ ගමනකට සහාය වීම සඳහා පර්යේෂණ පදනම් වූ කඩිනම් සංවර්ධන රාමුවක් නිර්මාණය කර ඇත. මෙම ක්‍රියාවලිය විශ්ලේෂණය, සැලසුම් කිරීම, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම යන අංග ඇතුළත් විය. සියලුම උපාධි පාඨමාලා 4 වන වසර සංරචකය ඇතුළත් සුසංයෝගී විෂයමාලා සංශෝධනයකට භාජනය විය.**

වගුව 8.11 : විෂයමාලා සංවර්ධනය/සංශෝධන තත්ත්වය

| # | **උපාධි වැඩසටහන** | නව සංවර්ධනය / සංශෝධනය |
|---|---|---|
| 1. | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සංශෝධනය |
| 2. | ආහාර සැකසුම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සංශෝධනය |
| 3. | සිනමා හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සංශෝධනය |
| 4. | මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සංශෝධනය |
| 5. | කාර්මික කළමනාකරණ තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | සංශෝධනය (කරමින් පවතී) |
| 6. | හෝටල් කළමනාකරණය | සංශෝධනය |
| 7. | සංචාරක අධ්‍යයනය | සංශෝධනය |
| 8. | රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය | නව පාඨමාලාව (කරමින් පවතී) |

# 9 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨය

## 9.1 හැඳින්වීම

තොරතුරු තාක්ෂණ පීඨය 2019 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර එම පීඨය අධ්‍යයන අංශ හතරකින් සමන්විත වේ.

1. මෘදුකාංග තාක්ෂණ අධ්‍යයන අංශය
2. ජාල තාක්ෂණ අධ්‍යයන අංශය
3. බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණ අධ්‍යයන අංශය
4. අන්තර් විෂය අධ්‍යයන දෙපාර්තමේන්තුව-(මේ වනතුරු කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන නොමැත)

වගුව 9.1:තොරතුරු තාක්ෂණ පීඨයෙන් පිරිනමන උපාධි පාඨමාලා ;

| # | උපාධි පාඨමාලාව | පිරිනමන ආකාරය |
|---|---|---|
| 7. | මෘදුකාංග තාක්ෂණය පිලිබඳ තාක්ෂණවේදී | සතියේ දින (B1) හා සති අන්ත(B2) පාඨමාලා |
| 8. | ජාල තාක්ෂණය පිලිබඳ තාක්ෂණවේදී | සතියේ දින (B1) හා සති අන්ත(B2) පාඨමාලා |
| 9. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිලිබඳ තාක්ෂණවේදී | සතියේ දින (B1) හා සති අන්ත(B2) පාඨමාලා |

## 9.2 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම

2022/2023 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් මාර්ගගත ක්‍රමවේදය හරහා අයදුම් කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා මේ වන විට යෝග්‍යතා පරීක්ෂණය පවත්වා ඇති අතර අයදුම් කරුවන් යෝග්‍යතා පරීක්ෂණයේ ලබා ගත් ලකුණු මත පදනම්ව ලියාපදිංචිය සඳහා පෙලගස්වා ඇත.

### අධ්‍යයන වර්ෂය 2021/2022 සඳහා සිසුන් බඳවා ගැනීම

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 2022 වර්ෂයේදී බඳවා ගත් අතර එම සිසුන් මේ වන විට අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් සිටී. විශේෂයෙන්ම 2022 වසරේ සිට ගෞරව උපාධි පාඨමාලා ආරම්භ කිරීමත් සමඟ 2022 වර්ෂයේ සිට සිව්වැනි අධ්‍යයන වර්ෂයක් හඳුන්වා දී ඇත. ගෞරව උපාධි පාඨමාලා සඳහා සුදුසුකම් ලත් සිසුන් මේ වන විට සිය අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් සිටී.

සති අන්ත උපාධි වැඩසටහන්වල ධාරිතාව අනුව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5/6 ඇති සිසුන් ඔවුන්ගේ යෝග්‍යතා පරීක්ෂණ ලකුණු මත පදනම්ව බඳවාගන්නා ලදී. සතියේ දින උපාධි වැඩසටහන් වලට සිසුන් ඇතුලත් කරගැනීමේදී යෝග්‍යතා පරීක්ෂණ ලකුණු නොතකා ජාතික වෘත්තීය සුදුසුකම් ඇති සිසුන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. ඔවුන්ට අවස්ථාව ලබා දීමෙන් පසු ඉතිරි පුරප්පාඩු උසස් පෙළ ඉසෙඩ් ලකුණු මත පදනම්ව අ.පො.ස උසස් පෙළ (විශේෂයෙන් තාක්ෂණ/ විද්‍යා විෂය ධාරාව හැදෑරූ) සිසුන්ගෙන් පුරවනු ලැබේ.

2021/22 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම් පිළිබඳ විස්තර 9.2 සහ 9.3. වගුවල දක්වා ඇත. අදාළ උපාධි සඳහා ඇතුළත් වීමේ සුදුසුකම් ලෙස සලකනු ලබන උසස් පෙළ විෂය ධාරාවන් පිළිබඳ විස්තර සහ ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව පිළිබඳ විස්තර 9.4 වගුවෙහි දක්වා ඇති අතර ජාතික වෘත්තීය සුදුසුකම් සහ අ.පො.ස. (උ / පෙළ) විෂය ධාරා මගින් ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව වගුව 9.5. හි දැක්වේ. සිව්වන වසර සඳහා ඇතුලත් වීමේ සුදුසුකම් ලෙස සලකනු ලබන සුදුසුකම් පිළිබඳ විස්තරයක් වගුව 9.6 මගින් පෙන්වා දී ඇත.

වගුව: 9.2 සිසුන් බඳවා ගැනීම – තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨය - අධ්‍යයන වර්ෂය 2021/2022 - සතියේ දින

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 5. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 28 |
| 6. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 34 |
| 7. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 34 |
| ***සතියේ දින වැඩසටහන් උදෙසා තො. සහ සන්නිවේදන තා. පීඨයේ ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව*** | | 96 |

වගුව: 9.3 සිසුන් බඳවා ගැනීම – තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨය - අධ්‍යයන වර්ෂය 2021/2022 - සති අන්ත

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 5. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 41 |
| 6. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 39 |
| 7. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 43 |
| 8. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී - සිව්වන වසර | 10 |
| 9. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී- සිව්වන වසර | 13 |
| 10. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී- සිව්වන වසර | 13 |
| ***සති අන්ත වැඩසටහන් උදෙසා තො. සහ සන්නිවේදන තා. පීඨයේ ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව*** | | 159 |

වගුව: 9.4 සිසුන් බඳවා ගැනීම – විවිධ උපාධිවල ඇතුළත්වීමේ සුදුසුකම් ලෙස සැලකෙන උසස්පෙළ සුදුසුකම් degrees

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | උසස්පෙළ විෂය ධාරාව |
|---|---|---|
| 5. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | ඕනෑම විෂය ධාරාවක් යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ භෞතික විද්‍යාව විෂයක් ලෙස හදාරා තිබීම හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් උසස් පෙළ හදාරා තිබීම (2020 වසරේ උ.පෙළ ප්‍රථිපල පමණක් සලකණු ලැබේ) |
| 6. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | |
| 7. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | |

වගුව: 9.5 සිසුන් බඳවා ගැනීම – විවිධ උපාධි උදෙසා ජාතික වෘත්තීය සුදුසුකම් හා උසස්පෙළ ප්‍රතිඵල අනුව සතියේ දින හා සති අන්ත පාඨමාලා සඳහා ඇතුලත් කර ගත් සිසුන් වර්ගීකරණය-අධ්‍යයන වර්ෂය 2021/2022.

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | ජා.වෘ.සු. (NVQ) | උ/පෙළ |
|---|---|---|---|
| **සතියේ දින** | | | |
| 5. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | **10** | **18** |
| 6. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | **04** | **31** |
| 7. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 14 | 20 |
| **සති අන්ත** | | | |
| 8. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 41 | -- |
| 9. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 39 | -- |

| | | | |
|---|---|---|---|
| 10. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 43 | -- |

වගුව: 9.6 සිව්වන අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේදී ප්‍රවේශ සුදුසුකම් ලෙස සැලකෙන සුදුසුකම්

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | |
|---|---|---|
| 8. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී - සිව්වන වසර | මෘදුකාංග තාක්ෂනය/ ජාල තාක්ෂනය/ බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තුන් අවුරුදු උපාධිය |
| 9. | ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී- සිව්වන වසර | |
| 10. | බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී- සිව්වන වසර | |

## 9.3 2021/22 අධ්‍යයන වර්ෂය සඳහා පැවති සමාරම්භක වැඩසටහන

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා පැවැත්වූ සමාරම්භක වැඩසටහන 2022 මාර්තු මස 09 වැනි දින මාර්ගගත (Zoom) ක්‍රමවේදය හරහා පවත්වන ලද අතර වඩාත් පුළුල් ආවරණයක් මෙම වැඩසටහන් වෙත ලබාගැනීමේ අරමුණ ඇතිව මෙම සමාරම්භක වැඩසටහන YouTube හා Facebook යන සමාජ ජාලා ඔස්සේ සජීවීව විකාශය කිරීමටද කටයුතු කරන ලදී.

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා දිශානති (Orientation) වැඩසටහන මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ 2022 මැයි 05 හා 06 යන දිනයන්වල පවත්වන ලදී.

සතියේ දින ශිෂ්‍ය කණ්ඩායම සඳහා පදනම් වැඩසටහන (සති 04 කින් යුක්ත) පවත්වන ලද අතර පලමු සමාසිකය සති 15 කින් සම්පූර්ණ කිරීමට නියමිතව තිබිණි. දිශාභිමුඛ වැඩසටහනෙන් පසු සති අන්ත වැඩසටහන් ආරම්භ කරන ලද අතර සති අන්ත 22ක් පැවැත්වීමට සැලසුම් කර තිබිණි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨය විසින් පිරිනමන තාක්ෂණවේදී උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය ගහනය පිළිබඳ තොරතුරු 9.7. වගුවෙහි දක්වා ඇත.

වගුව: 9.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨයේ සමස්ත ශිෂ්‍ය ගහනය

| උපාධි වැඩසටහන | ලියාපදිංචි වූ වර්ෂය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | | **2019** | | **2020** | | **2021** | |
| | සතියේ දින | සති අන්ත | සතියේ දින | සති අන්ත | සතියේ දින | සති අන්ත | සතියේ දින | සති අන්ත | සතියේ දින |
| ජාල තාක්ෂණය | 41 | 41 | 43 | 29 | 37 | 40 | 44 | 28 | 41 |
| බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය | 36 | 39 | 37 | 35 | 38 | 40 | 40 | 34 | 39 |
| මෘදුකාංග තාක්ෂණය | 40 | 33 | 40 | 31 | 32 | 40 | 40 | 34 | 43 |
| මුළු සිසුන් සංඛ්‍යාව | **117** | **113** | **110** | **95** | **107** | **120** | **121** | **96** | **123** |

### 9.4 2022 වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨයේ පැවැත්වූ විභාග

2021 වර්ෂය තුළ සතියේ දින සහ සති අන්ත කණ්ඩායම් සඳහා පවත්වන ලද විභාග පිළිබඳ විස්තර වගුව 9.8 හි දක්වා ඇත.

වගුව: 9.8 තොරතුරු තාක්ෂණ පීඨයේ 2022 වර්ෂයේ පැවැත්වූ විභාග

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | පැවැත්වුණු අයුරු | අධ්‍යයන වාර අවසාන විභාගය |
|---|---|---|---|---|
| 5. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017 B2<br>2018 B1/B2 | මාර්ගගත | අධ්‍යයන වාරය 06 |
| 6. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017 B2 | වි.විද්‍යාලය තුල | අධ්‍යයන වාරය 05 |
| 7. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2018 B1/B2 | වි.විද්‍යාලය තුල | අධ්‍යයන වාරය 05 |
| 8. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2018 B1/B2 | මාර්ගගත | අධ්‍යයන වාරය 04 |
| 9. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2019 B1/B2 | මාර්ගගත | අධ්‍යයන වාරය 03 |
| 10. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2019 B1/B2 | මාර්ගගත | අධ්‍යයන වාරය 02 |
| 11. | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2020/21 B1/B2 | වි.විද්‍යාලය තුල | අධ්‍යයන වාරය 01 |

### 9.5 බාහිර කථිකාචාර්යවරුන්-2022

පහත සඳහන් කරුණු මත පීඨයට බාහිර කථිකාචාර්යවරුන්ගේ සහ සම්පත් දායකයින්ගේ සේවය ලබා ගනී.

- ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඌණතාවය
- විවිධ ක්ෂේත්‍රයන්හි විද්වතුන් සහ අනෙකුත් විශ්ව විද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය අංශයන් සමඟ වඩා ශක්තිමත් සබඳතාවයක් ස්ථාපිත කර ගැනීම

සියලුම උපාධි වැඩසටහන් සඳහා පීඨය විසින් සේවය ලබා ගන්නා බාහිර කථිකාචාර්යවරුන්ගේ විස්තර 9.9 වගුවේ දක්වා ඇත.

වගුව: 9.9 -බාහිර කථිකාචාර්ය වරුන්-2022

| # | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | තාක්ෂණවේදී උපාධි වැඩසටහන | පැවැත්වුණු අයුරු | අධ්‍යයන වාරය | බාහිර කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | මෘදුකාංග තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br><br>ජාල තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී<br><br>බහුමාධ්‍ය හා වෙබ් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී | 2017 B2/2018 B2 | මාර්ගගත | 6 | 13 |
| | | 2018 B1 | මාර්ගගත | 6 | 10 |
| | | 2018 B1 | මාර්ගගත | 4 | 07 |
| | | 2018 B2 | මාර්ගගත | 4 | 10 |
| | | 2019 B1 | මාර්ගගත | 4 | 08 |
| | | 2019 B2 | මාර්ගගත | 4 | 10 |
| | | 2019 B1 | මාර්ගගත | 3 | 13 |
| | | 2019 B2 | මාර්ගගත | 3 | 16 |
| | | 2020 B1 | මාර්ගගත | 2 | 4 |
| | | 2020 B2 | මාර්ගගත | 2 | 10 |
| | | 2021 B1 | මාර්ගගත | 1 | 4 |
| | | 2021 B2 | මාර්ගගත | 1 | 10 |

## 9.6 තාක්ෂණවේදී සිසුන් සඳහා ලබා දී ඇති විෂය නිදහස් කිරීම්

අධ්‍යයන සභාව විසින් අනුමත කරන ලද නිදහස් කිරීම් ලබා දීමේ ප්‍රතිපත්තිය මත පදනම්ව සිසුන්ට නිදහස් කිරීම් ලබා දෙනු ලැබේ. නිදහස් කිරීම් සඳහා සිසුන් සුදුසුකම් ලබන්නේ ඔවුන් NVQ 6 ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන හෝ ඉහළ සුදුසුකමක් තිබුනේ නම් පමණි. ශිෂ්‍යයයා විසින් ඩිප්ලෝමා මට්ටමෙහි සාර්ථකව සම්පූර්ණ කර ඇති සමාන විෂය මොඩියුල සඳහා නිදහස් කිරීම් ලබා දී ඇත. සිසුන් විසින් ඩිප්ලෝමාවේ මුල් පිටපත සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ.

නිදහස් කිරීම් අපේක්ෂා කරන සිසුන් කාණ්ඩ දෙකක් යටතේ අයදුම් කළ යුතුය. 01 වන කාණ්ඩයේ සිසුන් සඳහා දේශන හා ප්‍රායෝගික පන්තිවලට සහභාගී වීමට අමතරව, අධ්‍යයන වාර අවසාන විභාගයද ඇතුළුව සියලුම අඛණ්ඩ ඇගයීම් සඳහා නිදහස් කිරීම් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, එම මොඩියුලයේ ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය, GPA ගණනය කිරීමේ අරමුණ සඳහා සාමාන්‍ය සාමාර්ථයකට සමාන ලෙස සැලකේ. 02 වන කාණ්ඩයට අයත් සිසුන් සඳහා දේශන හා ප්‍රායෝගික පන්තිවලට සහභාගී වීමෙන් නිදහස් කිරීම් ලබා දී ඇත. නමුත් ඔවුන් අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ කර අධ්‍යයන වාර අවසාන විභාගය සඳහා පෙනී සිටියයුතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම ඇගයීම් වලදී සිසුන් ලබාගත් කාර්ය සාධන මට්ටම් ඔවුන්ගේ GPA ගණනය කිරීම සඳහා යොදා ගනු ලැබේ.

මීට අමතරව විශ්ව විද්‍යාලයේ විෂය නිදහස්කිරීම් ප්‍රතිපත්තියට අනුකුල වන සේ පළමු සමාසිකය හා දෙවන සමාසිකය සඳහා විෂය නිදහස් වීම් වලට ඉල්ලුම් කල සිසුන්ට කාණ්ඩ දෙකක් යටතේ විෂය නිදහස් කිරීම් ලබා දෙනු ලැබේ.

## 9.7 කාර්ය පාදක කාර්මික පුහුණුව

කාර්ය පාදක කාර්මික පුහුණුව මාස හයක කාලයක් පුරා නිරත විය යුතු, තාක්ෂණ උපාධි පාඨමාලා වල ඉතා වැදගත් අනිවාර්ය අංගයකි. මෙම මොඩියුලය පස්වන අධ්‍යයන වාරයේ දී පිරිනමනු ලැබේ. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ එක්ව එහි උපාධි අපේක්ෂක පුහුණු ස්ථානගත කිරීමේ යෝජනා ක්‍රමය යටතේ සිසුන් ඔවුන්ට අදාළ විවිධ කර්මාන්ත සඳහා ඇතුළත් කරනු ලැබේ. සිසුන්ගේ ශ්‍රේණියේ ලකුණු සාමාන්‍යය (GPA) ගණනය කිරීමේදී මෙම සංරචකය සලකා බලන බැවින් සිසුන්ගේ කාර්ය පාදක කාර්මික පුහුණුව තක්සේරු කිරීම සඳහා විස්තීරණ ඇගයීම් ක්‍රමයක් සකස් කරන ලදී.

### 9.8 පීය මණ්ඩල රැස්වීම්

සෑම මසකම පීය මණ්ඩල රැස්වීම් පවත්වන ලද අතර 2022 වර්ෂය තුලදී පීය මණ්ඩල රැස්වීම් 10ක් පවත්වන ලදී.

**ප්‍රදර්ශන හා තරඟ සඳහා සහභාගී වීම:** 2022 වර්ෂය තුල ප්‍රදර්ශන හෝ තරඟ සඳහා සහභාගී වී නොමැත.

## 9.9 වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය 2021 හා 2022

කොවිඩ් වසංගත තත්වයන් නිසා අධ්‍යයන කටයුතු නියමිත පරිදි සිදු කර ගෙන යාමට නොහැකි වීම හරහා ඇතිවූ ප්‍රමාදයන් නිසා 2021 වසරේ උපාධි ප්‍රධානෝත්සවය 2022 වර්ෂයේදී පැවැත්වූ අතර එම ප්‍රමාදයන්ට අනුකූලව 2022 වසරේ උපාධි ප්‍රදානෝත්සවය 2023 වර්ෂයේ පෙබරවාරි මස 24 වන දින පැවැත්වීමට සැලසුම් කර ඇත.

### 9.10 මාර්ගගත ඉගෙනුම් සහ ඉගැන්වීම් සඳහා සැපයෙන සහාය සහ සහන

විශ්ව විද්‍යාලයේ සමහර පාඨමාලා වල ඉගැන්වීම් තවමත් මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ සිදු කෙරෙන නිසා එම පාඨමාලා සඳහා අවශ්‍ය වන ඉගෙනුම් නිබන්ධන හා වෙනත් උපකාරක යෙදවුම් මූඩ්ල් ( Moodle) හරහා සිසුන්ට http://lms.univotec.ac.lk යන වෙබ් ලිපිනය ඔස්සේ ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මාර්ගගත දේශන පැවැත්වීම සඳහා ZOOM වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම භාවිතා කරයි.

ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන ආයතනය (TRCSL) සමඟ එක්ව විශ්වවිද්‍යාල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වෙත නොමිලේ ප්‍රවේශය ලබා දී ඇත. මේ හරහා ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලයේ (LEARN) සාමාජික ආයතනයක් වන විශ්වවිද්‍යාලයට ZOOM වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ලබාදුන් අතර එමගින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට නොමිලේ ප්‍රවේශය ලබා දෙන ලදී.

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර හා බාහිර යන සියලු ආචාර්යවරුන්ට සිය පහසුව පිණිස ඔවුන්ගේ නිවෙස් වල සිට දේශන පැවැත්වීමට අවස්ථාව හිමිවිය. රට වසා දමා තිබූ කාල සීමාව තුළ විශ්වවිද්‍යාලය භෞතික ප්‍රවේශය සඳහා වසා දමා තිබුණද, අන්තර්ජාලය හරහා ඉගෙනීමට ප්‍රවේශ වීමට අවශ්‍ය මෙවලම් ලබා දුන් අතර මෙහෙයුම්වලට අවම බාධාවක් සහිතව දීර්ඝ කාලයක් දුරස්ථව සේවය කිරීමට ඉඩ ලබා දෙන ලදී.

## 10 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)

මෙමගින් තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (TVET) අංශයේ ඉල්ලුම් අත්‍යවශ්‍යතාවය මත කෙටි කාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන්, පුහුණුකරුවන් පුහුණු කිරීම (ToT) සහ තක්සේරුකරුවන් පුහුණු කිරීම (ToA) යන වැඩසටහන් පවත්වනු ලබයි. TVET අංශයේ විවිධ කර්මාන්තවල සහ ඉගැන්වීම් ක්ෂේත්‍රවල පුද්ගලයින්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා මෙම වැඩසටහන් නිර්මාණය කර ඇත. මෙම වැඩසටහන් කෙටි කාලින වැඩසටහන් වුවද, මේවා වඩාත් ප්‍රායෝගික වූ පුහුණු වැඩසටහන් වන අතර එය සැබෑ වැඩ පරිසරයක් අත්විඳීමට අවස්ථාව සලසා දෙයි.

### 10.1 කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රගතිය -2022

වගුව 10.1: කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රගතිය -2022

| මෙහෙයුම් ප්‍රදේශය | ක්‍රියාකාරකම | ප්‍රගතිය/ගෙන ඇති ක්‍රියාමාර්ග (31.12.2022 දිනට) |
|---|---|---|
| 1. NVQ 5 සහ 6 ඩිප්ලෝමා පාඨමාලා වල ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂයමාලා සංවර්ධනය කිරීම සහ සංශෝධනය කිරීම. | NVQ 5 සහ 6 ඩිප්ලෝමා පාඨමාලා වල ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂයමාලා සංවර්ධනය කිරීම සහ සංශෝධනය කිරීම. | • ජාතික නිපුණතා ප්‍රමිතීන් හා විෂයමාලා 16ක් අවසන් කර ඇත:<br>○ අවසන් කර TVEC වෙත යැවූ ගණන -10<br>○ 2023 ජනවාරි මස භාර දීමට නියමිත ගණන-06<br>○ වැඩමුළු 15ක් පවත්වා ඇති අතර 70% සම්පූර්ණ කර ඇත.<br>• 2023 වර්ෂයේදී වැඩමුළු 100ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.<br>• වැඩසටහන් 07ක් සඳහා ILO මඟින් අරමුදල් සැපයීම ආරම්භ කිරීමට සැලසුම් කර තිබිණි. (මේ සඳහා පහසුකම් සපයන්නන් පත් කර ඇති අතර සම්පත් දායකයන් හඳුනා ගැනීම හා අධ්‍යනන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.) |
| 2. තක්සේරුකරුවන්ගේ පුහුණු කිරීමේ වැඩසටහන් (TOA) | NVQ තක්සේරුකරුවන් සඳහා දින 05 පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම. | • 2021 වසරේ සිට ක්‍රියාත්මක කල නොහැකිව තිබූ පස් දින පුහුණු වැඩමුළු දෙකක් NVQ තක්සේරුකරුවන් 89 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම<br>○ 2022 ඔක් 10 සිට 14 දක්වා - තක්සේරුකරුවන් 49 |

| | | |
|---|---|---|
| | | ○ 2022 ඔක් 31 සිට නොවැ. 04 දක්වා -තක්සේරුකරුවන් 40.<br>• තක්සේරුකරුවන් 81 දෙනෙකු පුහුණු කිරීම අරමුණු කර තිබුනත් පෙර අධ්‍යයන කණ්ඩායම් වල අවස්ථාව මඟ හැරුණු හා සමත් වීමට නොහැකි වූ සිසුන් සඳහාද අවස්ථාව ලබා දීම හරහා තක්සේරුකරුවන් 89 දෙනෙකු පුහුණු කරන ලදී.<br>• සම්පත් දායකයන්ගේ ගෙවීම් වවුචර පත් ගිණුම් අංශය හරහා ලබා ලබා දීමට කටයුතු කර ඇත. |
| 3. පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (TOT) | Pedogeological පිළිවෙත් පිළිබඳව සොහාවී පෞද්ගලික ආයතන සමුහය වෙත පිරිනමන ලද වැඩසටහන. | • පස් දින TOT වැඩමුළුවක් ජුනි 24 වන දින සිට 13වන දින දක්වා සිදු කර ඇත. සහභාගී වූ ගණන 24 ක් වන අතර ඔවුන්ට සහතික පත් ලබා දී ඇත.<br>• සම්පත් දායකයන්ගේ ගෙවීම් සිදු කර ඇත. |
| | Pedogeological පිළිවෙත් පිළිබඳව සොහාවී පෞද්ගලික ආයතන සමුහය වෙත පිරිනමන ලද වැඩසටහන. | • පස් දින TOT වැඩමුළුවක් අගෝස්තු මස01 වන දින සිට 05වන දින දක්වා සිදු කර ඇත. සහභාගී වූ සංඛ්‍යාව 18 ක් වන අතර ඔවුන්ට සහතික පත් ලබා දී ඇත.<br>• සම්පත් දායකයන්ගේ ගෙවීම් සිදු කර ඇත. |
| | Pedogeological පිළිවෙත් පිළිබඳව සොහාවී පෞද්ගලික ආයතන සමුහය වෙත පිරිනමන ලද වැඩසටහන. | • පස් දින TOT වැඩමුළුවක් සැප්තැම්බර් මස16 වන දින සිට 25වන දින දක්වා සිදු කර ඇත. සහභාගී වූ සංඛ්‍යාව 25 ක් වන අතර ඔවුන්ට සහතික පත් ලබා දී ඇත.<br>• සම්පත් දායකයන්ට ගෙවීම් සිදු කිරීම සඳහා වව්චර පත් ගිණුම් අංශය වෙත භාර දී ඇත. |
| | NAITA ආයතනය වෙනුවෙන් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳව ToT වැඩසටහන. | • අයවැය ඉදිරිපත් කර ඇත.<br>• NAITA ආයතනය අයවැය විධිමත්ව අනුමත කරන ලද අතර ToT වැඩමුළුව 2022 නොවැම්බර් මස පැවැත්වීමට ඉල්ලුම් කර ඇත. |
| 4. වෘත්තීය සහ තාක්ෂණික පුහුණු මධ්‍යස්ථාන කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDVTTCM) NVQ 6 | පුහුණුකරුවෙකු ලෙස TVEC ලියාපදිංචිය ලබා ගැනීම. | සම්පූර්ණ කර ඇත |
| | HNDVTTCM සඳහා TVEC ප්‍රතීතනය ලබා ගැනීම | සම්පූර්ණ කර ඇත |
| | වැඩසටහන් අත්පොත නිර්මාණය හා අධ්‍යයන මණ්ඩල අනුමැතිය ලබා ගැනීම | සම්පූර්ණ කර ඇත |

| | | |
|---|---|---|
| | පැවරුම් හා විභාග ලකුණු පරීක්ෂකයන්ගෙන් ලබා ගැනීම | සම්පූර්ණ කර ඇත |
| | සමස්ත විභාග ප්‍රථිපල සැකසීම | සම්පූර්ණ කර ඇත |
| | විභාග ප්‍රථිපල විභාග අංශය වෙත ලබා දීම | සම්පූර්ණ කර ඇත |
| | විභාග මණ්ඩලය පැවැත්වීම හා ප්‍රථිපල නිකුත් කිරීම | සම්පූර්ණ කර ඇත |
| | ප්‍රථිපල නැවත සමීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම | සම්පූර්ණ කර ඇත |
| | ප්‍රථිපල නැවත සමීක්ෂණය | • සිසුන් 07 දෙනෙකු විසින් විෂයයන් 05ක ප්‍රථිපල නැවත සමීක්ෂණය සඳහා අයදුම් කර තිබිණි.<br>• අදාළ විශය පරීක්ෂකයන්ගෙන් උත්තර පත්‍ර ඉල්ලුම් කර ඇත. |
| | NVQ පැවරුම් සඳහා සුදුසුකම් ලත් සිසුන් පිළිබඳව TVEC දැනුවත් කිරීම | සම්පූර්ණ කර ඇත |
| | සුදුසුකම් ලත් සිසුන් ගෙන් NVQ ඇගයීම් කැඳවීම හා පැවැත්වීම | 2022 ඔක්තෝම්බර් මස 09,10,11 යන දිනවල පවත්වන ලදී. |
| | AG හා AP පිවිසුම් නිර්මාණය කිරීම සඳහා TVEC වෙත අදාළ තොරතුරු ලබා දිම. | පලමු අත්සන ලබා ගෙන ඇත ( අධ්‍යක්ෂක ජනරාල් -UoVT) |
| | NVQ ඇගයීම් ප්‍රථිපල TVEC වෙතට අදාළ මාර්ගගත යෙදවුම හරහා ලබා දීම හා සිසුන්ගේ කාර්ය වාර්තා පත්‍රිකාව ලබා දීම. | |

| | | |
|---|---|---|
| | නැවත විභාග පැවැත්වීම (Repeat-Examinations) | |
| 6. ගුරු පුහුණුව සහ අධ්‍යාපනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDTTE) – NVQ 5 | පුහුණු වැඩසටහන් සපයන්නෙකු ලෙස TVEC හි ලියාපදිංචිය ලබා ගැනීම. | |
| | NDTTE පාඨමාලාව සඳහා TVEC වෙතින් ප්‍රතීතනය නැවත ලබා ගැනීම. | ප්‍රතීතනය කල් ඉකුත් වී තිබු බැවින් යලි ප්‍රතීතනය ලබා ගැනීමට කටයුතු සිදු කරන ලදී. |
| | NVQ ඇගයුම් සඳහා සුදුසුකම් ලත් සිසුන් පිළිබඳව විස්තර TVEC වෙත ලබා දීම | සුදුසුමක් ලත් සිසුන්ගේ ලැයිස්තුව TVEC හි මාර්ගගත යෙදවුම් ඔස්සේ උඩුගත කරන ලදී. |
| | සුදුසුකම් ලත් සිසුන් ගෙන් NVQ ඇගයීම් කැඳවීම හා පැවැත්වීම | 2022 අප්‍රේල් මස අදාල NVQ ඇගයීම් සම්පූර්ණ කර ඇත. |
| | NVQ ඇගයීම් ප්‍රතිපල TVEC වෙතට අදාළ මාර්ගගත යෙදවුම හරහා ලබා දීම හා සිසුන්ගේ කාර්ය වාර්තා පත්‍රිකාව ලබා දීම | |
| | AG හා AP පිවිසුම් නිර්මාණය කිරීම සඳහා TVEC වෙත අදාළ තොරතුරු ලබා දීම. | |
| | නැවත විභාග පැවැත්වීම (Repeat-Examinations) | |
| 7. රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDTPP) සහ රූපවාහිනී පශ්වාත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDTPT) | රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDTPP) සහ රූපවාහිනී පශ්වාත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDTPT) සඳහා NVQ 5 සමාන තත්ත්ව සහතිකය ලබා ගැනීම. | අදාළ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා NVQ 05 සමාන තත්ත්වය ප්‍රදානය කිරීමට අවශ්‍ය අවසන් අදියරේ ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙස ඉල්ලුම් කරමින් TVEC අධ්‍යක්ෂක ජනරාල් වෙත 2022 ජුනි මස ලිපියක් යොමු කර ඇත. මේ හරහා ඩිප්ලෝමා ධාරීන්ගේ වෘතීය ජීවිතයේ විශාල ප්‍රගතියක් ඇත පත් කර ගත හැකි බව විශේෂයෙන් පෙන්වා දී තිබේ. |

| | | |
|---|---|---|
| 8. කෙටි කාලීන, ගාස්තු ය කරනු ලබන පාඨමාලා | ප්‍රමාණ සමීක්ෂණ ඉගැන්වීමේ සහතික පාඨමාලාව- පළමු කණ්ඩායම | • ඉගැන්වීම් කටයුතු 2022 ඔක්තෝම්බර් වන විට සම්පූර්ණ කර ඇත.<br>• අවසන් පරීක්ෂණය 2022 නොවැම්බර් 12 වන දින පවත්වනු ලැබිණ.<br>• සියලු විභාග ප්‍රථිපල 2022 දෙසැම්බර් මස සකසා අවසන් කරන ලදී. |
| | Red Hat සහතික කළ පද්ධති පරිපාලනය (RHCSA) වැඩසටහන | • පාඨමාලා යෝජනාවලිය සකස් කර ඒ සදහා අධ්‍යයන සභාවේ අනුමැතිය අධ්‍යයන සභා පත්‍රිකා අංක 120/2022/03/52 මඟින් ලබා ගන්නා ලදී.<br>• පාඨමාලා සම්බන්ධීකාරක වරයෙකු පත් කර ඇත.<br>• නව අයදුම්පත්‍රයක් සකස් කර ඇත.<br>• පාඨමාලාව පිළිබඳ විස්තර හා අයදුම්පත් කැඳවීම සමාජ ම් මාධ්‍ය ජාලා, විශ්වවිද්‍යාල වෙබ් අඩවිය හරහා හා අනෙකුත් TVET අංශයේ ආයතන හරහා සිදු කරන ලදී.<br>• මේ සඳහා අයදුම්පත් 26ක් ලද අතර සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අධ්‍යාන සභාවේ අනුමැතිය පත්‍රිකා අංක 123/2022/06/46 හරහා ලබා ගන්නා ලදී.<br>• කෙසේ වෙතත් ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති වූ බැවින් සැලසුම් කර පරිදි 2022 ඔක්තොම්බර් වන විට පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකි විය.<br>• එම නිසා සමාජ මාධ්‍ය ජාලා, විශ්ව විද්‍යාල වෙබ් අඩවිය හරහා හා අනෙකුත් TVET ආයතන හරහා නැවත අයදුම්පත් කැඳවීමක් 2022 නොවැම්බර් මස සිදු කර ඇත. |
| | ව්‍යවහාරික මාධ්‍යවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | • පාඨමාලා යෝජනාවලිය සකස් කර අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම 2022 නොවැම්බර් මස සිදු කර ඇත.<br>• පාඨමාලා සම්බන්ධීකාරක වරයෙකු පත් කර ඇත.<br>• නව අයදුම්පත්‍රයක් සකස් කර ඇත.<br>• පාඨමාලාව පිළිබඳ විස්තර විවිධ සමාජ මාධ්‍ය ජාලා, විශ්ව විද්‍යාලයීය වෙබ් අඩවිය හා TVET අංශයේ ආයතන හරහා ප්‍රචාරණය කරන ලද අතර ඒ හරහා අයදුම් පත්‍ර කැඳවනු ලැබිණ ( අයදුම් පත් එවීමේ අවසන් දිනය 2022 දෙසැම්බර් 20). |
| | සංචාරක ක්ශේත්‍රයේ විධායකයන් අරමුණු කරගත් ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව. | • පාඨමාලා යෝජනාවලිය සකස් කර අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම 2022 සැප්තැම්බර් මස සිදු කර ඇත.<br>• පාඨමාලා සම්බන්ධීකාරක වරයෙකු පත් කර ඇත.<br>• නව අයදුම්පත්‍රයක් සකස් කර ඇත.<br>• පාඨමාලාව පිළිබඳ විස්තර විවිධ සමාජ මාධ්‍ය ජාලා, විශ්ව විද්‍යාලයීය වෙබ් අඩවිය හා TVET අංශයේ ආයතන හරහා ප්‍රචාරණය කරන ලද අතර ඒ හරහා අයදුම් පත්‍ර කැඳවනු ලැබිණ ( අයදුම් පත් එවීමේ අවසන් දිනය 2022 දෙසැම්බර් 20). |

| | | |
|---|---|---|
| | ප්‍රමාණ සමීක්ෂණ ඉගැන්වීමේ සහතික පාඨමාලාව- දෙවන කණ්ඩායම | • පාඨමාලා යෝජනාවලිය සකස් කර අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම 2022 නොවැම්බර් මස සිදු කර ඇත.<br>• නව අයදුම්පත්‍රයක් සකස් කර ඇත.<br>• පාඨමාලාව පිලිබඳ විස්තර විවිධ සමාජ මාධ්‍ය ජාලා, විශ්ව විද්‍යාලයීය වෙබ් අඩවිය හා TVET අංශයේ ආයතන හරහා ප්‍රචාරණය කරන ලද අතර ඒ හරහා අයදුම් පත්‍ර කැඳවනු ලැබිණ ( අයදුම් පත් එවීමේ අවසන් දිනය 2022 දෙසැම්බර් 30).<br>• පාඨමාලා සම්බන්ධීකාරවරයෙකු පත්කිරීමට යෝජනා වී ඇත. |
| 9. පර්යේෂණ සම්මන්ත්‍රණ මාලාව | පර්යේෂණ සම්මන්ත්‍රණය 01/2022<br>"සාර්ථක අධ්‍යාපන වෘත්තිකයෙකු වීමේ ගමන් මඟ" මැයෙන් පැවති සම්මන්ත්‍රණය- | • 2022 ජූලි මස 05වන දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සාර්ථකව පැවැත්විණි. සම්පත් දායකයන්<br>  ○ ජ්‍යෝෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා- සාර්ථක අධ්‍යාපනවේදියෙකු වන්නේ කෙසේද?<br>  ○ ආචාර්ය නිර්මලී සුරවීර- සාහිත්‍ය විචාරයක් පවත්වන අකාරය<br>• සහභාගී වූ සංඛ්‍යාව - 100<br>• ඇගැයීම් ලිපි නිකුත් කර ඇත<br>• සියලු ගෙවීම් සිදු කර ඇත. |
| | පර්යේෂණ සම්මන්ත්‍රණය 02/2022<br>සාර්ථක පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීමට ඔබ සුදානම්ද මැයෙන් පැවති පර්යේෂණ සම්මන්ත්‍රණය. | • විශ්වවිද්‍යාලය තුල භෞතික සම්මන්ත්‍රණයක් ලෙස සාර්ථකව සංවිධානය කර 2022 සැප්තැම්බර් මස 30 වන දින පවත්වන ලද අතර සම්පත් දායකයන්:<br>  ○ ආචාර්ය මේනහා ත්‍යාපරන්<br>  ○ ආචාර්ය රොෂානි පල්ලියගුරු.<br>• අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලය සඳහා පැවැත්විණි<br>• සහභාගී වූ සංඛ්‍යාව -18<br>• ඇගැයීම් ලිපි නිකුත් කර ඇත<br>• සියලු ගෙවීම් සිදු කර ඇත. |
| | පර්යේෂණ සම්මන්ත්‍රණය 03/2022:<br>"ව්‍යවහාරික විද්‍යාව සඳහා ප්‍රමාණාත්මක දත්ත": නියැදීම, දත්ත එකතු කිරීම සහ විස්තරාත්මක සංඛ්‍යාලේඛන මැයෙන් පැවති පර්යේෂණ සම්මන්ත්‍රණය. | • මාර්ගගත සම්මත්‍රනයක් ලෙස සාර්ථකව සංවිධානය කර 2022 ඔක්තෝම්බර් මස 20 වන දින පවත්වන ලද අතර සම්පත් දායකයන්:<br>  ○ මහාචාර්ය නයනතාරා ද සිල්වා: නියැදීම හා දත්ත එකතු කිරීම<br>  ○ ආචාර්ය පූර්ණිමා ශ්‍රීදරන්: විස්තරාත්මක සංඛ්‍යාලේඛණ<br>• සහභාගී වූ සංඛ්‍යාව -48<br>• ඇගැයීම් ලිපි නිකුත් කර ඇත |

| | | |
|---|---|---|
| | | • සියලු ගෙවීම් සිදු කර ඇත. |
| | පර්යේෂණ සම්මන්ත්‍රණය 03/2022: ව්‍යවහාරික විද්‍යාවන්හි ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය: අනුමාන සංඛ්‍යාලේඛන යෙදුම්" මැයෙන් පැවති පර්යේෂණ සම්මන්ත්‍රණය | • මාර්ගගත සම්මන්ත්‍රණයක් ලෙස සාර්ථකව සංවිධානය කර 2022 ඔක්තෝම්බර් මස 28 වන දින පවත්වන ලද අතර සම්පත් දායකයන්:<br>○ මහාචාර්ය S. සමිතා<br>• සහභාගී වූ ගණන-38<br>• ඇගැයීම් ලිපි නිකුත් කර ඇත |
| 10. අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් | සංශෝධිත අධ්‍යයන කාර්ය මණ්ඩල කාර්ය භාර ආකෘතිය පිළිබඳ පුහුණුව | • භෞතික වැඩමුළුවක් ලෙස සාර්ථකව සංවිධානය කර 2022 අගෝස්තු මස 25 වන දින ආචාර්යය D.D.D සුරවීර මහතා විසින් පවත්වන ලදී.<br>• සහභාගී වූ සංඛ්‍යාව -51 |
| | අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා පැවති ප්‍රේරණ වැඩසටහන | • සම්පත් දායකයන් හත් දෙනෙකුග් සහභාගීත්වයෙන් භෞතික වැඩමුළුවක් ලෙස 2022 සැප්තැම්බර් මස 01 වැනි දින සාර්ථකව පවත්වන ලදී.<br>• සහභාගී වූ ගණන -15කි. |
| | විභාග සහ ඇගයීම් ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණුව | • හිටපු උපකුලපති ජොෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් 2022 නොවැම්බර් මස 16 වැනි දින විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්විණි.<br>• සහභාගී වූ ගණන- 48 |
| 11. අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා පැවති පුහුණු වැඩසටහන් | අභිප්‍රේරණ වැඩසටහන – 01/2022 | • ආචාර්ය අජිත් කොලොන්නේ මහතාගේ සම්පත් දායකත්වයෙන් විශ්ව විද්‍යාලය පරිශ්‍රය තුල 2022 දෙසැම්බර් මස 15 වැනි දින "වඩා සාර්ථක මටටමකට ලඟා වන්නේ කෙසේද" යන මැයෙන් පවත්වන ලදී.<br>• සහභාගී වූ ගණන- 75 |
| 12. භාහිර සහයෝගිතා වැඩසටහන් | EduClass/Global Education සන්ධානය සමඟ යෝජිත ඒකාබද්ධ උපාධි වැඩසටහන | • ඒකාබද්ධ උපාධි වැඩසටහනක් සඳහා ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා EduClass/Global Education Alliance සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.<br>• කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී<br>• 2022 ජනවාරි 04 වැනි දින පැවති රැස්වීමකදී කෙටුම්පත් යෝජනාව ඇගයීමට ලක් කර වැඩිදුර පැහැදිලි කිරීම් ඉල්ලා ඇත. |

| | | |
|---|---|---|
| | සහතික කළ කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) සමඟ යෝජිත ඒකාබද්ධ උපාධි වැඩසටහන | • විශ්ව විද්‍යාලයේ උපකුලපති හා බඳවා ගැනීම්,ප්‍රතීතනය හා තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක සහභාගීත්වයෙන් CMA ආයතනය සමඟ ඒකාබද්ධ උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමේ ප්‍රභවතාවය පිළිබඳව සාකච්චා වට දෙකක් සැප්තැම්බර් මස27 වන දින හා දෙසැම්බර් මස 08 යන දෙදින තුල පවත්වා ඇත.<br>• විශ්ව විද්‍යාලයේ බාහිර සහයෝගීතා ප්‍රතිපත්තියට අනුව යෝජිත සහයෝගිතාව සඳහා කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස CMA ආයතනය වෙත උපදෙස් ලබා දී ඇත. |
| | කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) සමඟ යෝජිත ඒකාබද්ධ උපාධි වැඩසටහන | • ඒකාබද්ධ උපාධි වැඩසටහනක් සඳහා ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා IET සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.<br>• කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කරන ලද නමුත් විශ්වවිද්‍යාලයේ බාහිර සහයෝගීතා ප්‍රතිපත්තියට අනුව නිවැරදි ආකෘතියේ නොතිබුණි. එබැවින්, යෝජනාව නැවත ඉදිරිපත් කරන ලෙස 2022 ඔක්තෝබර් 26 වන දින IET වෙත උපදෙස් දෙන ලදී |
| | ඉදිකිරීම් තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යාලය සමඟ යෝජිත ඒකාබද්ධ උපාධි වැඩසටහන | • ඒකාබද්ධ උපාධි වැඩසටහනක් සඳහා ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඉදිකිරීම් තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යාලය සමඟ මූලික ආරම්භක රැස්වීම පැවැත්විණි. |
| | ජාතික නිර්මාණ මධ්‍යස්ථානය සමඟ යෝජිත ඒකාබද්ධ උපාධි වැඩසටහන | • විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමට ජාතික නිර්මාණ මධ්‍යස්ථානයට විද්‍යුත් තැපෑලෙන් ආරාධනා කරන ලදී.<br>• සිහිකැඳවීම් කීපයක්ම සිදු කරන ලදී |
| | අන්තර් රාජ්‍ය ජාත්‍යන්තර සංවිධානයක් වන "කොළඹ සැලසුම් මාණ්ඩලික විද්‍යාලය" සමග අවබෝධතා ගිවිසුම" | • අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWS&DB) සඳහා තාක්ෂණික සහකාර (සිවිල් සහ යාන්ත්‍රික) තෝරා ගැනීම සඳහා විභාග ප්‍රශ්න පත්‍රය සහ ලකුණු කිරීමේ නිර්ණායක සකස් කිරීම | • 2022 නොවැම්බර් මාසයේදී NWS&DB වෙත යෝජනාවක් සහ අයවැයක් ඉදිරිපත් කරන ලදී. |
| | රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව (SD&CC) සමඟ සහයෝගීතාවය | • රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව 2022 ඔක්තෝම්බර් මස 22 දිනැති ලිපියක් මඟින් විශ්ව විද්‍යාලයේ කටුයුතු කෙරෙහි සිදු කල හැකි ඕනෑම දායකත්වයක් ලබා දීමට ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන ලදී.<br>• රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව වෙතින් විශ්ව විද්‍යාලයට අවශ්‍ය විය හැකි සහය |

| | | |
|---|---|---|
| | | පැහැදිලි කරමින් කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක විසින් 2022 දෙසැම්බර් මස යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදී. |
| 13. නව ප්‍රතිපත්ති/ යෝජනා ක්‍රම | SDC විසින් පවත්වනු ලබන ගාස්තු අයකිරීමේ කෙටි පාඨමාලා සඳහා සම්බන්ධ වූ කථිකාචාර්යවරුන්, සම්බන්ධීකාරකවරුන් සහ අනෙකුත් පිරිස් සඳහා සිදු කරනු ලබන ගෙවීම් හා ගාස්තු සංශෝධනය. | • විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය වෙත කරන ලද ඉල්ලීමක් හරහා ( පාලක මණ්ඩල පත්‍රිකා අංක 2022.117.13) පවතින ගාස්තු සංශෝධනය කිරීමට හා නව ගාස්තු කීපයක් එකතු කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී. |
| | විශ්ව විද්‍යාලයේ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා නව අරමුදල් බෙදා හැරීමේ යෝජනා ක්‍රමය | • විශ්ව විද්‍යාලයේ ස්වයං-මූල්‍යකරණ කටයුතු සඳහා විස්තීරණ අරමුදල් බෙදා හැරීමේ යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී.<br>• අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස උපකුලපති, අධ්‍යක්ෂක ජනරාල් හා අධ්‍යක්ෂක-මූල්‍ය වෙත ඉදිරිපත් කර ඇත. |
| | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ නම වෙනස් කිරීම සඳහා ඉල්ලීම | • 2022 නොවැම්බර් මස අධ්‍යයන මණ්ඩලය වෙත ඉලීමක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.<br>• ඉන්පසුව පාලක මණ්ඩලය වෙත ඉල්ලීම ඉදිරපත් කර පාලක මණ්ඩල අනුමැතියද ලබා ගන්නා ලදී. |
| 14. පුහුණු සැලැස්ම - 2023 | 2023 සඳහා පුහුණු හා සංවර්ධන සැලැස්ම | • 2023 වර්ෂය සඳහා කාර්යය මඩල සංවර්ධන මධ්‍යස්ථානය සඳහා විස්තීර්ණ පුහුණු සහ සංවර්ධන සැලැස්මක් සකස් කරන ලදී.<br>• අවශ්‍ය අනුමැතිය ලබා දීම හා ක්‍රියාත්මක කිරීම සඳහා උපකුලපති, අධ්‍යක්ෂක ජනරාල් හා අධ්‍යක්ෂක- මූල්‍ය වෙත ඉදිරිපත් කරන ලදී. |
| 15. රැස්වීම් | අභ්‍යන්තර | කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් සමඟ දෛනික/සතිපතා රැස්වීම්වලට අමතරව SDC කාර්ය මණ්ඩල රැස්වීම් හතරක් පැවැත්විණි (රැස්වීම් සටහන් වෙන් වෙන්ව ඇත). |
| | කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සහභාගී වූ බාහිර රැස්වීම් | නැණස TV |
| | | NVQ මෙහෙයුම් කමිටු රැස්වීම් |
| | | කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) රැස්වීම් |

| | | |
|---|---|---|
| | | තක්සේරුකරුවන් පුහුණු කිරීම සහ පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ TVEC නිලධාරීන් සමඟ රැස්වීම |
| | | ILO රැස්වීම |
| | | e-RLP පිළිබඳ වැඩමුළුව |
| | | පරිපාලකයින් සඳහා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ e-ITEC වැඩසටහන |
| | | මාසික විෂයමාලා සංවර්ධන ප්‍රගති රැස්වීම් |
| 16. පත්වීම් | කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව පත් කිරීම | පාලක මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ( පාලක මණ්ඩල පත්‍රිකා අංක 2022.120.09) කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සඳහා කළමනාකරණ කමිටුවක් පත් කරන ලදී. |
| | අධ්‍යයන සම්බන්ධීකාරක පත් කිරීම - තක්සේරුකරු නැවුම් කරන්නා - 2022 මැයි | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 120/2022/03/55 වෙතින් ලබා ගන්නා ලදී. |
| | අධ්‍යයන සම්බන්ධීකාරක පත් කිරීම - NDTTE - 2022 මැයි | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 120/2022/03/57 වෙතින් ලබා ගන්නා ලදී. |
| | අධ්‍යයන සම්බන්ධීකාරක පත් කිරීම - RHCSA (අන්තර්ගත කිරීම 01-2022) | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 120/2022/03/54 වෙතින් ලබා ගන්නා ලදී. |
| | අධ්‍යයන සම්බන්ධීකාරක පත් කිරීම - TOA - මැයි 2022 | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 120/2022/03/53 වෙතින් ලබා ගන්නා ලදී. |
| | අධ්‍යයන සම්බන්ධීකාරක පත් කිරීම - TOT - මැයි 2022 | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 120/2022/03/56 වෙතින් ලබා ගන්නා ලදී. |
| | "ව්‍යවහාරික මාධ්‍යවේදය පිළිබඳ සහතිකය (CAJ)" ශාස්ත්‍ර අයකිරීමේ කෙටි පාඨමාලාව සඳහා අධ්‍යයන සම්බන්ධීකාරක පත් කිරීම (පළමු කණ්ඩායම) | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 124/2022/07/48 වෙතින් ලබා ගන්නා ලදී. |

| | | |
|---|---|---|
| | " සංචාරක ක්ෂේත්‍රයේ විධායකයන් සඳහා ඉංග්‍රීසි" සහතික පත්‍ර කෙටි කාලීන ගාස්තු අය කරනු ලබන පාඨමාලාව සඳහා අධ්‍යයන සම්බන්ධීකාරවරයෙකු පත් කිරීම. (පළමු කණ්ඩායම) | අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය අධ්‍යයන මණ්ඩල පත්‍රිකා අංක 124/2022/07/50 වෙතින් ලබා ගන්නා ලදී. |
| 17. අනෙකුත් ක්‍රියාකාරකම් | පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ මිනුම්- සහාය පර්යේෂණ සමීක්ෂණය | • විශ්ව විද්‍යාලය වෙනුවෙන් මෙම සමීක්ෂණය සම්පූර්ණ කරන ලදී (සමීක්ෂණයේ පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ නායකයින්ට සහය වන පර්යේෂකයන්ට විවිධ ප්‍රවේශයන්ට එරෙහිව මිණුම් සලකුණු කිරීමට හැකි කිරීම, පර්යේෂණ ජීවන චක්‍රය හරහා පර්යේෂණ කළඹ කළමනාකරණය කිරීම හා පුළුල් පර්යේෂණ ප්‍රජාවන් සහ අරමුදල් සපයන්නන් සම්බන්ධ කර ගැනීම සහතික කරනයයි)<br>• පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය 2022.11. 25 වන දින කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකට යොමු කරන ලද ඊ- මේල් පණිවුඩයකින් දැනුම් දී ඇත්තේ විශ්ව විද්‍යාලයේ විවිධ සංසන්දනාත්මක කණ්ඩායම් භාවිතා කරමින් දත්ත විසංයෝජනය කිරීමෙන් වැඩි දියුණු කළ අවබෝධයක් ලබා දෙන සංක්ෂිප්ත වාර්තාව නියමිත වේලාවට විද්‍යුත් තැපෑලෙන් එවනු බවයි. |

## 10.2 2023/2024 සඳහා අපේක්ෂිත වැඩසටහන් සහ ප්‍රධාන ක්‍රියාකාරකම්

| # | පුහුණු වැඩසටහනේ නම | අකාරය | පාඨමාලා කාලය | 2024 දී සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන් ගණන | අපේක්ෂිත සහභාගිවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | භෞතිකව | දින 5 | 10 | 360 |
| 2 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | භෞතිකව | දින 5 | 08 | 200 |
| 3 | TVET අංශයේ ගුණාත්මක නායකයින් වර්ධනය කිරීම | භෞතිකව | දින 2 | 05 | 200 |
| 4 | තක්සේරුකරු නැවුම් කිරීමේ වැඩසටහන් | භෞතිකව | දින 2 | 10 | 500 |
| 5 | පුහුණු මධ්‍යස්ථාන කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව | භෞතිකව | අවුරුදු 1 | 01 | 30 |
| 6 | තාක්ෂණික ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | භෞතිකව | අවුරුදු 1 | 01 | 40 |
| 7 | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නව ප්‍රේරණ වැඩසටහන (එක්දින- භෞතික මාදිලිය) | භෞතිකව | දින 1 | 01 | 15 |
| 8 | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෘදු කුසලතා සංවර්ධන පුහුණුව | භෞතිකව | දින 2 | 01 | 50 |
| 9 | විද්වතුන් සඳහා පෞරුෂ වර්ධනය | භෞතිකව | දින 2 | 01 | 50 |
| 10 | විද්වතුන් සඳහා ප්‍රසිද්ධ කථා කිරීම | භෞතිකව | දින 2 | 01 | 50 |
| 11 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අභිප්‍රේරණ සහ පුද්ගලික හැඩගැන්වීමේ වැඩසටහන | භෞතිකව | දින 2 | 02 | 120 |
| 12 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෘදු නිපුණතා සංවර්ධන පුහුණුව (සන්නිවේදනය, කාර්යාල ලිපි හුවමාරුව (ඊමේල් ලිවීම සහ නිල ලිපි ආදිය...) | භෞතිකව | දින 2 | 02 | 120 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා | භෞතිකව | දින 2 | 02 | 120 |
| 14 | පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා "තත්ත්ව සහතිකය" පිළිබඳ වැඩමුළුව | භෞතිකව | දින 2 | 02 | 50 |
| 15 | කාර්යාල සහකාරවරුන් සඳහා පුහුණුව | භෞතිකව | දින 4 | 02 | 40 |
| 16 | NVQ අදියර 5 සහ අදියර 6 වැඩසටහනේ නව සංවර්ධනය | භෞතිකව | | විෂයමාලා ගණන-12 | සම්පත් දායකයින්, 150 පමණ |
| 17 | NVQ 5 සහ 6 මට්ටමේ වැඩසටහන් සංශෝධනය කිරීම | භෞතිකව | | විෂයමාලා ගණන-12 | සම්පත් දායකයින්, 150 පමණ |
| 18 | TVET කාර්ය මණ්ඩලය සඳහා විෂය විශේෂිත දැඩි පුහුණු වැඩසටහන් | | | 10 | 100 |
| 19 | පුද්ගලික ආයතන කාර්ය මණ්ඩලය සඳහා TOT වැඩසටහන | | | | 100 |
| 20 | එක් එක් දෙපාර්තමේන්තු මගින් සංවිධානය කරනු ලබන කෙටි කාලීන පුහුණු වැඩසටහන් | | | | 400 |
| 21 | NVQ 4 මට්ටම සහිත විදුලි, යාන්ත්‍රික, Ref සහ වාතය, මෝටර් රථ, වෙල්ඩර් සහ ඉදිකිරීම් තාක්ෂණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද සහිත පුද්ගලයන් අරමුණු කරගත ඩිප්ලෝමා වැඩසටහන්. | | | | 600 |

# 11 බඳවා ගැනීම්, ප්‍රතීතනය හා තත්ත්ව සහතිකකරණ අංශය

## 11.1 හැඳින්වීම

විශ්ව විද්‍යාලයේ බඳවා ගැනීම්, ප්‍රතීතනය හා තත්ත්ව සහතිකකරණ අංශය (AAQA) විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික (QA) ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය සඳහා වගකීම දරයි. මෙම අංශය සෘජුවම උපකුලපතිවරයා යටතේ තබා ඇති අතර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන අධ්‍යක්ෂවරයෙකු විසින් කළමනාකරණය කරනු ලැබේ. විශ්ව විද්‍යාලයේ ප්‍රමුඛතම අරමුණ වන උපාධි වැඩසටහන් වල ප්‍රමිතීන් මෙම විස්තරාත්මකව විස්තර කර ඇති තත්ත්ව සහතික රාමුවේ සම්පූර්ණ ක්‍රියාකාරකම් මගින් සහතික කෙරේ. විශ්ව විද්‍යාලයීය පණත මඟින් ආයතනයේ නිලධාරීන්ගේ වගකීම්, හා පරිපාලනමය ව්‍යුහයන් වෙනත් ජාතික විශ්ව විද්‍යාල හා සමාන ලෙස පිහිටුවා ඇති අතර ඒ හරහා සාමාන්‍යයෙන් පිළිගත් සම්මතයන් සහ සම්මතයන් තුළ අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම සහතික කිරීම තහවුරු කර ඇත.

## 11.2 බඳවා ගැනීම.

විශ්ව විද්‍යාලයට සිසුන් ඇතුලත් කර ගැනීම සිසුන් කාණ්ඩ තුනක් හරහා සිදු කරනු ලබයි

1. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කර ඇති NVQ 5 හෝ NVQ 6 සුදුසුකම් ලත් සිසුන්
2. විශ්ව විද්‍යාලයේ අධ්‍යයන සභාව විසින් පිළිගත් NVQ 5 හෝ NVQ 6 සමාන සුදුසුකම් ඇති සිසුන්.
3. මෑත වසරේ අ.පො.ස.(උ/පෙළ) සුදුසුකම් ලැබූ සිසුන්

ඉහත දක්වා ඇති පලමු කාණ්ඩ දෙක හරහා විශ්ව විදියාලයට සිසුන් ඇතුලත් කර ගැනීම පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව දක්වා ඇති බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූල වන සේ යෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිපල මගින් සිදු කෙරේ. විශ්වවිද්‍යාලය විසින් ඒ සඳහා සපයා ඇති ආකෘති පත්‍ර මත සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් ප්‍රවෘත්ති පත්‍ර/සමාජ මාධ්‍ය සහ විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ. විශ්ව විද්යාලයට ඇතුලත් වීමට සුදුසුකම් ලබන සියලු අපේක්ෂකයන් වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් වී තිබිය යුතුය

තුන්වන කාණ්ඩයෙන් සිසුන් බඳවා ගැනීම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ අපේක්ෂකයින් විසින් ලබා ගන්නා ලද සාමාන්‍ය ඉසෙඩ් ලකුණු මත ශ්‍රේණිගත කිරීමේ අනුපිළිවෙල මත සිදු කෙරේ. ඒ සඳහා කඩයිම් ඉසෙඩ් ලකුණු විශ්ව විද්‍යාලය විසින් නිකුත් කරනු ලැබේ. මේ කාණ්ඩයෙන් සිසුන් බඳවා ගනු ලබන්නේ සතියේ දින පාඨමාලාව සඳහා පමණි.

විශ්ව විද්‍යාලයේ බඳවා ගැනීම්, ප්‍රතීතනය හා තත්ත්ව සහතිකකරණ අංශය සමස්ත විශ්වවිද්‍යාලය සඳහාම ඩිජිටල් යටිතල පහසුකම් හසුරවයි. සියලුම විශ්ව විද්‍යාලයීය වෙබ් අඩවි, ඇතුළත් වීමේ ක්‍රියාවලිය, ගෙවීම්, ශිෂ්‍ය ගැටළු, සම්මුඛ පරීක්ෂණ, ලකුණු ඉදිරිපත් කිරීම සහ ලියාපදිංචිය මෙම අංශය තුලින් සිදු කරනු ලබන අතර අපගේ කාර්ය මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලැබේ. ඇතුළත් වීමේ සේවාවන්හි ඇති බාධාවන් අවම කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා නව යෙදුම් ස්ථාපිත කිරීමට අවශ්‍ය ගුණත්ව තාක්ෂණික සහාය ලබා දීම මෙම අංශයෙන් සිදු කෙරේ.

2022 අධ්‍යන වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයට සිසුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාල ඉතිහාසයේ ප්‍රථම වතාවට සම්පූර්ණයෙන්ම මාර්ගගත ක්‍රමයෙන් සිදු කරන ලදී. මාර්ගගතව සිදු කරනු ලැබූ කාර්යයන් අතර, අයදුම්පත් ලැබීම, ගෙවීම් ලැබීම, යෝග්‍යතා පරීක්ෂණය සඳහා සන්නිවේදනය, පරීක්ෂණය අතරතුර පැමිණීම සලකුණු කිරීම, ප්‍රතිඵල නිකුත් කිරීම සහ සිසුන් ලියාපදිංචි කිරීම හා වෙනත් නොයෙකුත් ක්‍රියාවලින් ඇතුලත් විය.

## 11.3 2022 සඳහා තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථා

අංශය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ;

I. විශ්ව විද්‍යාලය තුළ බාහිර සමාලෝචන පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම සඳහා තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය සහ TVEC සමඟ සම්බන්ධ වීම.

II. විෂය, වැඩසටහන් හෝ ආයතනික සමාලෝචන වාර්තාවල නිර්දේශිත පසු විපරම් ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.

III. අධ්‍යාපනික වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම සමාලෝචනය කිරීම

IV. ඇගයීම් ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම

V. ශිෂ්‍ය සුභසාධනය අධීක්ෂණය කිරීම

VI. ශ්‍රේණිගත කිරීමේ පද්ධති ක්‍රියාවලීන්හි ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

VII. විශ්ව විද්‍යාලයේ සියලුම තත්ත්ව සහතික (QA) ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

VIII. කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත තත්ත්ව සහතිකකරණය සම්බන්ධ මාර්ගෝපදේශ සහ අත්පොත් සකස් කිරීම.

IX. කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ආකාරයෙන් සමස්ත විශ්ව විද්‍යාලයේ වැදගත් අංගවල වාර්තා සහ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාල දත්ත ඩිජිටල්කරණය කිරීම සඳහා දීර්ඝ කාලීන කැපවීමක් තිබිය යුතු බව AAQA අංශය යෝජනා කර ඇත.

## 11.4 වැඩසටහන් සමාලෝචන

අධ්‍යයන වැඩසටහනක් තුළ අධ්‍යයන වැඩසටහන්, ශිෂ්‍ය ඉගෙනුම් අත්දැකීම් සහ සම්මාන ප්‍රමිතීන් කළමනාකරණය කිරීම සහ සහතික කිරීම සඳහා පීඨයේ හෝ ආයතනයේ ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය වැඩසටහන් සමාලෝචනය හරහා ඇගයීමට ලක් කරයි. එය වැඩසටහන් මට්ටමින් කළමනාකරණය සහ ගුණාත්මකභාවය පිළිබඳ සහතිකය කිරීමේ ක්‍රියාවලියක් වේ. එමෙන්ම කාලයත් සමඟම අධ්‍යාපනික වැඩසටහන් සැපයීමේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතික යෝජනා ක්‍රම මත විශ්වාසය තැබිය හැකි ප්‍රමාණය ඇගයීමට ලක් කිරේම මේ හරහා සිදු වේ.

**තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අනාගත සැලසුම්:**

- සමස්ත විශ්ව විද්‍යාලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ආකාරයෙන් ඩිජිටල් දත්ත සමුදායක් සංවර්ධනය කිරීම.
- TVET අංශයේ තත්ත්ව වැඩිදියුණු කිරීම සඳහා නායකත්වය සැපයීම
- එක් එක් පීඨයේ/ආයතනයේ තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වරින් වර ඇගයීම.
- තත්ත්ව සහතික කරන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- විෂයමාලා සහ අධ්‍යයන සංවර්ධන කමිටුව (හෝ ඊට සමාන), ඉගැන්වීමේ ඉගෙනුම් කමිටුව සහ අනෙකුත් පීඨ කමිටු සහ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධ වෙමින් පීඨය තුළ ගුණාත්මක වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.
- සම සමාලෝචන පෝරම සහ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ පෝරම වැනි පීඨ තත්ත්ව සහතිකකරණ දත්ත එකතු කර විශ්ලේෂණය කිරීමට.

# 12 ආයතන අංශය

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණයට පහසුකම් සැලසීමේ වගකීම දරන ප්‍රධාන අංශය වන්නේ ආයතන අංශයයි. ආයතන අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ:

- සේවක සංඛ්‍යා විස්තර පවත්වාගෙන යාම
- විශ්වවිද්‍යාලයේ වාර්ෂික මිනිස් බල සැලසුම්
- පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
- බඳවා ගැනීම්/දක්ෂතා අත්පත් කර ගැනීම
- වන්දි කළමනාකරණය
- වාර්ෂික කාර්ය සාධන ඇගයීම
- නිවාඩු සහ සම්මාන කමිටු රැස්වීම සම්බන්ධීකරණය කිරීම
- මානව සම්පත් සහ නිපුණතා සංවර්ධනය
- පර්යන්ත ප්‍රතිලාභ කළමනාකරණය

ආයතන අංශය සියලුම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ සමීප සබඳතාවක් පවත්වාගෙන යන අතර විශ්වවිද්‍යාලවල පවතින මානව සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සහතික කරයි. ප්‍රතිඵල ඉලක්ක කරගත් සේවා ස්ථානයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවට පහසුකම් සැලසීමට අංශය අඛණ්ඩව කැපවී සිටී.

## 12.1 නව බඳවා ගැනීම් -2022

විශ්වවිද්‍යාලයේ පත්කිරීමේ බලධාරියා වන්නේ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය වන අතර 2022 වර්ෂයේ බඳවාගැනීම් සඳහා වූ සාරාංශය පහත පරිදි මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

වගුව 12.1- නව බඳවා ගැනීම් - 2022

| # | නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|---|
| 1. | D M L M දිසානායක මිය | කථිකාචාර්ය (පරිවාස) | 26.01.2022 |
| 2. | S V R ගමගේ මහතා | කථිකාචාර්ය (පරිවාස) | 01.02.2022 |
| 3. | L A M H P උදයකුමාරි මිය | කථිකාචාර්ය (පරිවාස) | 01.02.2022 |
| 4. | W N ප්‍රේමකුමාර මහතා | කථිකාචාර්ය (පරිවාස) | 07.02.2022 |
| 5. | L P S S දිසානායක මහතා | කථිකාචාර්ය (පරිවාස) | 10.02.2022 |
| 6. | A A S U ගුණරත්න මිය | කථිකාචාර්ය (පරිවාස) | 02.03.2022 |
| 7. | N K A H රූපසිංහ මිය | කථිකාචාර්ය (පරිවාස) | 02.03.2022 |
| 8. | R W වෙදගේ මහතා | කථිකාචාර්ය (පරිවාස) | 21.03.2022 |
| 9. | J P T D ප්‍රේමචන්ද්‍ර මහතා | සහකාර ලේඛකාධිකාරී | 2/2/2022 |
| 10. | M G M S ජයසිංහ මිය | සහකාර ලේඛකාධිකාරී | 15-02-2022 |
| 11. | V G S ලක්ෂාන් මහතා | ප්‍රදර්ශක (තාවකාලික) | 7/2/2022 |
| 12. | K A D P අනුෂිකා මිය | ප්‍රදර්ශක (තාවකාලික) | 7/2/2022 |
| 13. | M H M T රත්නපාල මිය | කථිකාචාර්ය (පරිවාස) | 30-06-2022 |




රූප සටහන 12.1- නව බඳවා ගැනීම් සාරාංශය - 2022

විශ්වවිද්‍යාලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව අධ්‍යයන කාර්ය මණ්ඩලය 56කින් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය 148කින් සමන්විත වේ. 2022 වර්ෂය ආරම්භයේදී පුරප්පාඩු සංඛ්‍යාව 33ක් පැවති අතර එම වර්ෂය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් අනුමැතියට සමගාමීව වසර තුළ පුරප්පාඩු 13ක් පුරවන ලදී.

## 12.2 ඉල්ලා අස්වීම්/සේවය හැරයෑම්/ කොන්ත්‍රාත්තු අවසන් වීම් හා විශ්‍රාම යෑම්- 2022

2022 වර්ෂය සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යාව 13 ක් විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්වීම සඳහා ඉල්ලා අස්වීම් ලබා දුන් අතර සේවකයන් 3 දෙනෙකු විශ්‍රාම ගොස් ඇත. අදාළ දත්ත වගුව 12.2 දක්වා ඇත.

වගුව 12.2– ඉල්ලා අස්වීම්/සේවය හැරයෑම්/ කොන්ත්රාත්තු අවසන් වීම් හා විශ්‍රාම යෑම්- 2022 සාරාංශය

| | නම | තනතුර | පත්වීම් දිනය | ඉවත් වූ දිනය | හේතුව |
|---|---|---|---|---|---|
| 1 | H M K R B කිරිඇල්ල මහතා | ආශ්‍රිත නිලධාරී | 6/9/2016 | 15-01-2022 | ඉල්ලා අස්වීම |
| 2 | P B G R L කුමාරි මිය | ආශ්‍රිත නිලධාරී | 2018.01.02 | 13-01-2022 | ඉල්ලා අස්වීම |
| 3 | H H බන්දුලසේන මහතා | කාර්යාල සහායක හා කොන්දොස්තර | 1/9/2000 | 1/2/2022 | විශ්‍රාම යාම |
| 4 | J K C දිසානායක මහතා | උපදේශක | 3/3/2020 | 31-01-2022 | ඉල්ලා අස්වීම |
| 5 | P දයානි මිය | ප්‍රදර්ශක | 19-04-2021 | 31-03-2022 | ඉල්ලා අස්වීම |
| 6 | M C L පීරිස් මිය | කළමනාකරණ සහායක | 6/7/2015 | 20-05-2022 | ඉල්ලා අස්වීම |
| 7 | Y W M කශ්‍යපනී මිය | සහකාර ලේකම්ධිකාරී | 5/8/2021 | 17-06-2022 | ඉල්ලා අස්වීම |
| 8 | A.T.අබේසුන්දර මහතා | කථිකාචාර්ය (පරිවාස) | 21-06-2021 | 8/7/2022 | ඉල්ලා අස්වීම |
| 9 | K A D P අනුෂිකා මිය | ප්‍රදර්ශක( තාවකාලික) | 7/2/2022 | 22-07-2022 | ඉල්ලා අස්වීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | V C කන්නන්ගර මිය | සහකාර ලේකඛාධිකාරී | 2018.03.12 | 21-08-2022 | ඉල්ලා අස්වීම |
| 11 | D M L M දිසානායක මිය | කථිකාචාර්ය (පරිවාස) | 26.01.2022 | 30-08-2022 | ඉල්ලා අස්වීම |
| 12 | D M N මුණසිංහ මිය | කළමනාකරණ සහායක | 4/6/2019 | 5/10/2022 | ඉල්ලා අස්වීම |
| 13 | W N ප්‍රේමකුමාර මහතා | කථිකාචාර්ය (පරිවාස) | 07.02.2022 | 21-10-2022 | ඉල්ලා අස්වීම |
| 14 | M G M S ජයසිංහ මිය | සහකාර ලේකඛාධිකාරී | 15-02-2022 | 30-11-2022 | ඉල්ලා අස්වීම |
| 15 | K උපුල් මහතා | කාර්යාල සහායක | 1/2/2021 | 31-12-2022 | විශ්‍රාම යාම |
| 16 | M S S V ජයවර්ධන මිය | සහකාර පුස්තකාලයාධිපති | 15-08-2000 | 31-12-2022 | විශ්‍රාම යාම |




රූප සටහන 12.2– ඉල්ලා අස්වීම්/සේවය හැරයෑම්/ කොන්ත්රාත්තු අවසන් වීම් හා විශ්‍රාම යෑම්- 2022 සාරාංශය

## 12.3 අභ්‍යන්තර උසස් වීම්

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ එක්(01) සාමාජිකයෙකු නියමිත සේවා කාලය තහවුරු කිරීම හා නියමිත පශ්චාත් උපාධි සුදුසුකම සපුරා ලීමත් සමඟ නියමිත ශ්‍රේණියට උසස් කරන ලදී. අදාළ තොරතුරු වගුව 12.3 යටතේ දක්වා ඇත.

වගුව 12.3 -අභ්‍යන්තර උසස්වීම්-2022

| | නම | තනතුර | උසස් වීම ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|---|
| 1. | ඉංජිනේරු D.T ගණේගොඩ මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය -II වන ශ්‍රේණිය | **4/7/2021** |

## 12.4 මානව සම්පත් සංවර්ධනය

විශ්වවිද්‍යාලය එහි සාර්ථකත්වයට මූලික වන්නේ එහි කාර්ය මණ්ඩලය බව හඳුනාගෙන ඇත. කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා උපායමාර්ගික, වෘත්තීය ප්‍රවේශයක් ලබා ගැනීම තුලින් විශ්ව විද්‍යාලයට එහි අරමුණු ඉටු කිරීමට අවශ්‍ය කුසලතා සහ නිපුණතා සමඟ ඉහළ මට්ටමේ කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට හැකියාවක් ලැබේ. මූලෝපායික සැලසුම් සන්දර්භය තුළ දෙපාර්තමේන්තු සහ විශ්වවිද්‍යාල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුද්ගල සහ දෙපාර්තමේන්තු පූර්ණ දායකත්වය ලබා දීමට හැකි වන බව සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලයට සංවර්ධන අවස්ථා ලබා දීම විශ්වවිද්‍යාලයේ ආයතනික අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියට අනුව, සේවකයන් රැකියාවේ හොඳින් ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම, හැකියාවන් සහ නිපුණතා වැඩිදියුණු කිරීම මගින් සේවකයන් අවශ්‍ය දිශානතියට පත් කිරීම, පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. පුද්ගලික සහ වෘත්තීය වෘත්තීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන්, කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ ලාභදායිත්වය වැඩිදියුණු කිරීමට විශ්වවිද්‍යාලයට හැකියාව ලැබේ.

ඒ අනුව 2022 වර්ෂයේදී විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ අතර විශ්වවිද්‍යාල ප්‍රජාවගේ දැනුම, මෘදු හා දෘඪ කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා කැපී පෙනෙන මුදල් කොටසක් ආයෝජනය කරන ලදී. එබැවින්, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සහ පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලය අනුග්‍රහය දක්වා ඇත.

### 12.4.1 අධ්‍යයන සාමාජිකයින් සඳහා කෙටි කාලීන පුහුණුව - විදේශීය සහ දේශීය

විශ්ව විද්‍යාලයේ වාර්ෂික මානව සම්පත් සංවර්ධන සැලැස්මට සමගාමීව, තෝරාගත් අධ්‍යයන සාමාජිකයින්ට විශ්වවිද්‍යාල ධාරිතා සංවර්ධන අරමුදලට වෙන් කරන ලද රජයේ අරමුදල් සහ නිපුණතා අංශයේ සංවර්ධන අරමුදලේ අරමුදල් මගින් අරමුදල් සපයන නිශ්චිත විදේශීය හා දේශීය පුහුණු වැඩසටහන් සඳහා අවස්ථාව ලබා දෙන ලදී..2022 වර්ෂයේ ප්‍රදානවල සාරාංශය පහත වගු වල දක්වා ඇත.

2021 වසරට සාපේක්ෂව, රටේ සීමා සහිත ආර්ථික පසුබිමට සමගාමීව සීමිත විදේශීය පුහුණු සැසි සංඛ්‍යාවක් සඳහා අවසර ලබා දී ඇත. පහත වගුවේ සාරාංශ කර ඇති සියලුම පුහුණුවීම් පාහේ විශ්ව විද්‍යාලයේ නම් කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රදානය කිරීමේ නියෝජිතායතනයෙන් සෘජු ප්‍රදානයන් විය.

වගුව 12.4– 2022 වසර සඳහා විදේශ පුහුණුවීම්

| | වැඩසටහන | කාල වකවානුව | රට | නම | තනතුර |
|---|---|---|---|---|---|
| | TESS වැඩමුළුව | 04.02.2022-15.02.2022 | නොර්වේ | N L B ඕෂධී මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය |
| | | | | U සිවවේල්වී මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය |
| | | | | K G N P රාජපක්ෂ මිය | අධ්‍යයන සහකාර |
| | "අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සහ අගය කිරීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව " | 12.06.2022-18.06.2022 | නොර්වේ | A S K වරාහෙන මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය |
| | | | | U A S K එදිරිසිංහ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය |
| | | | | H N W ගුණසේකර මහතා | කථිකාචාර්ය (පරිවාස) |
| | TESS ව්‍යාපෘතියේ සම්මුති රැස්වීම සහ පුහුණු වැඩසටහන | 07.09.2022-16.09.2022 | ඩෙන්මාර්කය | A S K වරාහේන මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය |
| | | 07.09.2022-11.09.2023 | ඩෙන්මාර්කය | N L B ඕෂධී මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 07.09.2022-11.09.2024 | ඩෙන්මාර්කය | R L W කොග්ගලගේ මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය |
| | | 12.09.2022-16.09.2023 | ඩෙන්මාර්කය | U A S K එදිරිසිංහ මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය |
| | | 12.09.2022-16.09.2024 | ඩෙන්මාර්කය | H N W ගුණසේකර මහතා | කථිකාචාර්ය (පරිවාස) |

### 12.4.2 සියලුම කාර්ය මණ්ඩලය සඳහා සංවර්ධන අවස්ථා - දේශීය

විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියට සමගාමීව සියලුම කාර්ය මණ්ඩලය සඳහා දැනුම සාධකය, කුසලතා සංරචකය හෝ හැකියාවන් කෙරෙහි අවධානය යොමු කරමින් පුහුණුව ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශය ඇතිව සහ ඔවුන්ගේ වාර්ෂික වර්ධක ආකෘති පත්‍රවල සමාලෝචනවලට අනුකූලව මෙම පුහුණු සැසි නිශ්චිතවම නියමිත සේවකයා සඳහා තෝරා ගන්නා ලදී. විශ්ව විද්‍යාලයේ ධාරිතා අරමුදලෙන් සැලකිය යුතු කොටසක් මෙම පුහුණුවීම් සඳහා ආයෝජනය කෙරේ. එහි සාරාංශය අංක 12.5 සහ 12.6 වගුවේ දක්වා ඇත

වගුව 12.5 – අධ්‍යයන කාර්යය මණ්ඩලය වෙත ප්‍රදානය කල දේශීය පුහුණු වැඩසටහන් -2022

| # | නම සහ තනතුර | වැඩසටහන | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|---|
| 1. | ආචාර්ය J A E C ජයවර්ධන මිය<br>කථිකාචාර්ය (පරිවාස) | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 21/01/2022 – 21/06/2022 |
| 2. | L A M H P උදයකුමාරි මිය<br>කථිකාචාර්ය (පරිවාස) | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 21/01/2022 – 21/06/2022 |
| 3. | A T අබේසුන්දර මහතා<br>කථිකාචාර්ය (පරිවාස) | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 21/01/2022 – 21/06/2022 |
| 4. | H M J ප්‍රදීපමාලි මිය<br>කථිකාචාර්ය (පරිවාස) | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 21/01/2022 – 21/06/2022 |

වගුව 12.6 අනධ්‍යයන කාර්යය මණ්ඩලය වෙත ප්‍රදානය කල දේශීය පුහුණු වැඩසටහන් -2022

| # | නම සහ තනතුර | වැඩසටහන | ආයතනය | වටිනාකම |
|---|---|---|---|---|
| 01. | D M S R P විජේකෝන් මිය<br>කළමනාකරන සහකාර | නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය සහ වගකීම් | 2022/02/07,08 | Rs. 8500.00 |
| 02. | P A චමින්ද ප්‍රසාද් මහතා | ප්‍රවාහන කළමනාකරණය | 2022/02/14,15 | Rs. 7000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | කලමනාකරන සහකාර | | | |
| 03. | K S K ද සිල්වා මිය කලමනාකරන සහකාර | රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ වරප්‍රසාද | 2022/02/14,15 | Rs. 7000.00 |
| 04. | V V රණතුංග මිය කලමනාකරන සහකාර | සාමාන්‍ය ලිපිගොනුකරණය | 2022/02/23,24 | Rs. 7000.00 |
| 05. | K L N සෙව්වන්දි මිය කලමනාකරන සහකාර | සාමාන්‍ය ලිපිගොනුකරණය | 2022/02/23,24 | Rs. 7000.00 |
| 06. | සමිතා චන්ද්‍රමාලි මිය කලමනාකරන සහකාර | සාමාන්‍ය ලිපිගොනුකරණය | 2022/02/23,24 | Rs. 7000.00 |
| 07. | M C L පීරිස් මිය කලමනාකරන සහකාර | සාමාන්‍ය ලිපිගොනුකරණය | 2022/02/23,24 | Rs. 7000.00 |
| 08. | N දියබෙදනගේ මහත්මිය අධ්‍යක්ෂක ජනරාල් | ධනාත්මක මනෝවිද්‍යාව සහ ආතති කළමනාකරණය | 2022/02/28 2022/03/02 | Rs. 7000.00 |
| 09. | J P T D ප්‍රේමචන්ද්‍ර මහතා සහකාර ලේඛකාධිකාරී | විනය පටිපාටිය | 2022/10/12,19, 26 | Rs.15,000.00 |
| 10. | N K මීපෙගමගේ මිය (වැඩසටහන් නිලධාරී) | රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීමේ ක්‍රියා පටිපාටිය | 2022/09/08 | Rs. 5000.00 |

# 13 පාලන අංශය

## 13.1 පරිපාලන අංශය සහ එහි රාජකාරි

විශ්ව විද්‍යාලයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සහකාර රෙජිස්ට්‍රාර් (පරිපාලන) ගේ සහාය ඇතිව අධ්‍යක්ෂ ජනරාල් විසින් පරිපාලන අංශය පරිපාලනය කරනු ලැබේ. සාමාන්‍ය පරිපාලන අංශය පහත උප අංශ/සේවා වලින් සමන්විත වේ.

- සාමාන්‍ය පරිපාලන අංශය
- ප්‍රවාහන අංශය
- නඩත්තු අංශය
- ආරක්ෂක සේවය
- පිරිසිදු කිරීම් සේවය
- කාර්ය මණ්ඩල නිල නිවාස
- ශිෂ්‍ය නේවාසිකාගාර

### 13.1.1 ප්‍රවාහන අංශය

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ප්‍රවාහන අංශය සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ නිල ප්‍රවාහන අවශ්‍යතා සපුරාලයි. ප්‍රවාහන අංශයේ අඛණ්ඩ සේවය සහතික කිරීම සඳහා එක් බලයලත් නිලධාරීවරයෙකු සහ රියදුරන් (04) හතර දෙනෙකු (තටාකයක) කටයුතු කරයි. මීට අමතරව

විශ්වවිද්‍යාලයේ උපකුලපති, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ (මුදල්) ඇතුළු නිලධාරීන්ගේ නිල වාහන සඳහා රියදුරන් තිදෙනෙකු (03) අනුයුක්ත කර ඇත. සියලුම වාහන සඳහා ජීපීඑස් (GPS) ට්‍රැකින් පද්ධතියක් සවි කර තිබූ අතර නියමිත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අදාළ පද්ධතිය මිලදී ගන්නා ලදී. විශ්වවිද්‍යාලයට උසස් තත්ත්වයේ, කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමේ අරමුණින් එම පද්ධතිය සවි කර ඇත. මීට අමතරව විශ්වවිද්‍යාල බස් රථයේ භාරකරු ලෙස කොන්දොස්තරවරයෙකු පත්කර ඇත.

ප්‍රවාහන අංශයට අනුයුක්ත සියලුම රියදුරන් සහ කාර්ය මණ්ඩලය සහකාර ලේකබාධිකාරී/පරිපාලන විසින් සමීපව අධීක්ෂණය කර පරිපාලනය කරනු ලැබේ. වසර ආරම්භයේදී සියලුම රියදුරන් සඳහා රාජකාරි ලැයිස්තුව නිකුත් කරන ලද අතර, ඔවුන්ගේ ආකල්ප, චිත්ත ධෛර්යය ආදිය වර්ධනය කර ගැනීමට සහ ඔවුන්ගේ අභිප්‍රේරණය වැඩිදියුණු කිරීමට පුහුණුවක් ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසා දෙන ලදී. තවද ඔවුන්ට විශ්වවිද්‍යාලය තුළ නවාතැන් පහසුකම් සහ විවේකාගාරය වැනි පහසුකම් ද සපයා ඇත. ප්‍රවාහන අංශය සතියේ දින හතම වැඩ කළ යුතුය. සති අන්ත දිනවල රියදුරන් හා සියලු කාර්යය මණ්ඩලය රෝස්ටර් ක්‍රමයක් හරහා සේවයට කැඳවා ඇත. විශ්ව විද්‍යාලය විසින් සති අන්තයේ උපාධි වැඩසටහන් වල B2 කාණ්ඩයේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් පවත්වනු ලබන අතර, එබැවින් ගාලු පාර සහ විශ්ව විද්‍යාල පරිශ්‍රය අතර උදේ සහ සවස ප්‍රවාහන සේවාව ඉහළට සහ පහළට යෙදවීමට අවශ්‍ය කටයුතු සකසා ඇත.මීට අමතරව යම් සිසුවෙකුට හෝ කාර්යය මණ්ඩල සාමාජිකයෙකුට ඇතිවිය හැකි හදිසි සෞඛ්‍ය තත්වයකදී හෝ වෙනත් යම් හදිසි අවස්ථාවකදී ඉක්මනින් ක්‍රියාත්මක වීම සඳහා එක් රියදුරෙකු සෑම විටම අනුයුක්ත කර ඇත.
සියලුම වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සිදු කරනු ලබන්නේ නියමිත ක්‍රියා පටිපාටිය අනුගමනය කර විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි කර ඇති සමාගම්/අලුත්වැඩියා කරන්නන් විසිනි. එවැනි සමාගම්/අලුත්වැඩියා කරන්නන්ගේ සේවය ලබාගැනීමට පෙර අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබාගෙන ලබා ගැනීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.
වාහන සඳහා පොම්ප කරන ලද ඉන්ධන (පෙට්‍රල් සහ ඩීසල්) වාහන ලොග් පොත් සහ අනෙකුත් වාහන ලේඛන නිසි ලෙස නඩත්තු කිරීම සහතික කරමින් අධීක්ෂණය සහ පාලනය කිරීම සහකාර ලේකබාධිකාරී පරිපාලන විසින් සිදු කරනු ලබයි. පසුගිය සමයේ පැවති ඉන්ධන හිඟතාව යටතේ විශ්ව විද්‍යාලය සෑම විටම ඉන්ධන මිලට ගැනීම සිදු කරන ලද්දේ තෝරාගත් පෞද්ගලික හා රාජ්‍ය අනුග්‍රහය සහිත ඉන්ධන පිරවුම්හල් කීපයකින් පමණි.
2022 මැයි සිට ජූලි දක්වා කාලය තුළ රට තුළ ඉන්ධන අර්බුදයක් ඇති වූ අතර පොදු ප්‍රවාහනය සීමිත වූ අතර කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සේවාවන් අවශ්‍ය වූ විට සහ විශ්ව විද්‍යාලයට ප්‍රවාහන පහසුකම් සපයන ලදී

### 13.1.2 පිරිසිදු කිරීමේ සේවාව

පිරිසිදු කිරීමේ සේවාව නිසි ටෙන්ඩර් පටිපාටියට අනුව පිළිගත් සමාගමකට පවරා ඇත. මෙම සේවාව මගින් උද්‍යානය ඇතුළු පරිශ්‍ර පිරිසිදු කිරීම සහ සනීපාරක්ෂක කටයුතු ආවරණය කරන ලදී. තවද සියලුම සනීපාරක්‍ෂක කටයුතු නිරන්තරව සිදු කෙරෙන බවට සහතික කෙරෙන අතර පරිපාලන අංශය විසින් අදාළ ස්ථාන වෙත නිරන්තර පරීක්‍ෂා කිරීම් සිදු කරමින් සේවාවේ ගුණාත්මකභාවය සහ සම්පූර්ණත්වය අධීක්‍ෂණය කරනු ලැබේ. සේවා සපයන්නාගේ කාර්ය සාධනය තක්සේරු කිරීම මත පදනම්ව ගෙවීම් සිදු කරන අතර මේ හරහා අධීක්ෂණ යාන්ත්‍රණය මගින් පිරිසිදු කිරීමේ සේවාවන්හි සඵලතාවය සහතික කරනු ලැබේ..

### 13.1.3 ආරක්ෂක අංශය

නිසි ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් අදාළ කාලසීමාව තුළ විශ්වවිද්‍යාලයේ ආරක්‍ෂක සේවය පිළිගත් පෞද්ගලික සමාගමකට පවරා ඇත. පැය දොළහක පදනම මත එක් එක් දිවා මුරය සහ රාත්‍රී සේවා මුරය සඳහා යොදවා ඇති ආරක්ෂක නිලධාරීන් 17 දෙනෙකුගෙන් (17) ආරක්ෂක කාර්ය මණ්ඩලය සමන්විත වේ. CCTV කැමරා පද්ධතියක් මගින් පරිශ්‍රයේ ආරක්ෂාව තර කර ඇති අතර මෙම පද්ධතිය 2011 වසරේ සිට ක්‍රියාත්මක වේ. ආරක්ෂක කාර්ය මණ්ඩලයට කාලසටහනකට අනුව රාජකාරි පවරා ඇත. රට තුළ පවතින Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර Covid 19 පොකුරු ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගෙන තිබුණි. විශ්ව විද්‍යාලයේ ප්‍රධාන දොරටුවේ සහ ප්‍රධාන ගොඩනැගිලිවල සෞඛ්‍ය මාර්ගෝපදේශ ප්‍රදර්ශනය කරන ලදී. විශ්වවිද්‍යාලයට ඇතුළත් වූවන්ගේ ශරීර උෂ්ණත්වය පරීක්‍ෂා කිරීම සඳහා ආරක්‍ෂක නිලධාරීන්ට සායනික උෂ්ණත්වමාන ලබා දෙන ලදීඑසේම, ස්වයං ප්‍රකාශන පෝරමයක් සකස් කර මුර කුටියේ තබා ඇති අතර, විශ්ව විද්‍යාල පරිශ්‍රයට ඇතුළු වන විට සියලුම ඇතුල්වන්නන් එය පුරවා ගත යුතු විය. සෞඛ්‍ය බලධාරීන් විසින් Covid-19 වසංගතයේ යම් යම් සීමාවන් ලිහිල් කිරීමත් සමඟ විශ්ව විද්‍යාලයද සර්ට අනුපාත වන ලෙස යම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**එසේම විශ්වවිද්‍යාල පරිශ්‍රයට ඇතුළු වන සහ පිටවන අමුත්තන්ගේ වාහන ඇතුළු වාර්තා පවත්වාගෙන යාම ආරක්‍ෂක නිලධාරීන්ගේ යුතුකම හා වගකීම වේ. විශ්වවිද්‍යාල වාහන පරිශ්‍රයෙන් පිටවී පරිශ්‍රයට ඇතුළු වන විට ඒවායේ ඕඩෝමීටර වාර්තා නිරීක්ෂණය කිරීම ද සිරිත් ලෙස සිදු කරනු ලබයි. පරිපාලන අංශයේ අධීක්‍ෂණය යටතේ දෛනික පදනමින් පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයේ පැමිණීම පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම ද ආරක්ෂක අංශය සතු වගකීමක් වේ.**

**එසේම විශ්වවිද්‍යාලයේ ස්ථානගතව සිටින ආරක්‍ෂක අංශ භාර නිලධාරියාට හදිසි අවස්ථා වලදී භාවිත කිරීමට අවශ්‍ය දූරකථන පහසුකම් ද විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති තර විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ**

**නවාතැන් පහසුකම්ද අදාළ නිලධාරියාට ද සපයා ඇත. විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් සඳහා නේවාසිකාගාර පහසුකම් (අංශ දෙකක්) සපයා ඇති අතර, අදාළ ප්‍රනේවාසිකාගාර වල ආරක්ෂාව සඳහා කාන්තා ආරක්ෂක නිලධාරිනියන් 04 දෙනෙකු යොදවා තිබුණි.**

### 13.1.4 නඩත්තු අංශය

විශ්වවිද්‍යාලයේ සියලුම ඉදිකිරීම් සහ ගොඩනැගිලි නඩත්තු කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මඟපෙන්වීම යටතේ විශ්වවිද්‍යාලයේ නඩත්තු අංශය විසින් සිදු කරනු ලැබේ. අදාළ කාල සීමාව තුළ නඩත්තු අංශය විසින් සිදු කරන ලද ප්‍රාග්ධන කටයුතු පිළිබඳ සාරාංශයක් මේ සමඟ ඇතුලත් කර ඇත.

## 13.2 ප්‍රාග්ධන වැඩ සහ සැලසුම්

### 13.2.1 හැඳින්වීම

2022 වර්ෂයේදී නඩත්තු අංශය සිදු කල කාර්යයන් පහත පරිදි වර්ග කළ හැක.

i) 2017 වර්ෂයේ ආරම්භ කර මෙම කාලසීමාව දක්වා සිදු කර ගෙන යනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති
   a. ස්ටුඩියෝ හා පන්ති කාමර සංකීර්ණය සැලසුම් කිරීම හා ඉදිකිරීම් ඉතිරි කටුතු
      ආයෝජනය රුපියල මිලියන 75.

ii) 2019 වර්ෂයේ ආරම්භ කර මෙම කාලසීමාව දක්වා සිදු කර ගෙන යනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති
   a. පීඨ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
      ආයෝජනය රුපියල මිලියන 13.97

iii) 2021 වර්ෂයේ ආරම්භ කර මෙම කාලසීමාව දක්වා සිදු කර ගෙන යනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති
   a. වායු සමීකරණ යන්ත්‍ර 20ක් සැපයුම් කිරීම ස්ථාපනය , හා සවි කර සක්‍රීය ලෙස පවත්වාගෙන යාම
      ආයෝජනය රුපියල මිලියන 3.73

iv) 2022 දී ආරම්භ කිරීමට අපේක්ෂිත නව ඉදිකිරීම් ව්‍යාපෘති
   a. යෝජිත ශිෂ්‍ය නේවාසිකාගාරය, වැඩමුළුව සහ ආපන ශාලාව ඉදිකිරීම
      ආයෝජනය රුපියල මිලියන 927.34

සටහන: ආරම්භ කර තිබු බොහෝ ව්‍යාපෘති හා 2020 හා 2021 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිතව පැවති බොහෝ ව්‍යාපෘති පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතු කොට ගෙන ආරම්භ කර සම්පූර්ණ කිරීමට නොහැකි විය.

කොවිඩ් 19 වසංගත තත්වයන් හා නිරන්තර නඩත්තු කටයුතු හේතුවෙන් පැන නැගුනු ගැටළු වලට පිළියම් යෙදීම සඳහා නඩත්තු අංශයට විශාල කාර්යය භාරයක් පැවරී ඇත. එවැනි කටයුත්තු කීපයක් නම්:

- කාර්ය මණ්ඩල නිල නිවාස ඇතුළු විශ්වවිද්‍යාල ගොඩනැගිලිවල සියලුම නඩත්තු කටයුතු
- හදිසි වැඩවලට සහභාගී වීම සහ එවැනි වැඩ සඳහා සහභාගී වීමට කාර්ය මණ්ඩලය පැවරීම.
- නිතර විදුලිය විසන්ධි වූ විට විශ්වවිද්‍යාලයේ ජනක යන්ත්‍රය නඩත්තු කිරීම. එබැවින් ඉන්ධන පිරවීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් විය.

- විශ්වවිද්‍යාල නිල නිවාස භාරදීමේදී ඉන්වෙන්ටරි පරීක්ෂා කිරීම. නිෂ්කාශන වාර්තාව සකස් කිරීම නඩත්තු අංශයේ වගකීම විය.
- පිරිසිදු කිරීමේ සේවාව මගින් වළවල් සහ මලාපවහන මාර්ග පිරිසිදු කිරීම අධීක්ෂණය කිරීම.

### 13.2.2 කාර්ය මණ්ඩල නිල නිවාස

ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් නවාතැන් ඉල්ලා සිටින කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් සැපයීම සඳහා විශ්ව විද්‍යාලය සතුව නිල නිවාස 16 ක් ඇත. පොරොත්තු ලේඛනයට අනුව පරිපාලන අංශය විසින් අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් කාර්ය මණ්ඩලය සඳහා පහසුකම් සපයා දෙනු ලැබේ. අධ්‍යයන මණ්ඩල හා විධායක නිලධාරීන් සඳහා නිල නිවාස වෙන් කිරීම, රැඳී සිටිය යුතු කාල සීමාව නිර්ණය කිරීම සඳහා කමිටුවක් පත් කොට ඇත. නියමිත අනුපාතය මත පදනම්ව, අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පිළිවෙලින් අවුරුදු 05 සහ අවුරුදු 02 සඳහා නවාතැන් සපයනු ලැබේ. ඉන් එක් නිල නිවාසයක් නේවාසිකාගාර පාලිකාවට වෙන් කර ඇත. ඊට අමතරව, අධ්‍යක්ෂ ජනරාල්වරයාටද එක් නිල නිවාසයක් වෙන් කර ඇත.

### 13.2.3 නේවාසිකාගාර

විශ්වවිද්‍යාලයට සතුව නේවාසිකාගාර 02ක් පවතී. විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් ගනු ලැබූ තීරණයක් මත ශිෂ්‍යාවන් සඳහා පමණක් නවාතැන් පහසුකම් සැලසනු ලබන අතර ඔවුන්ගේ නිවෙස්වල සිට විශ්වවිද්‍යාලයට යා යුතු දුර ප්‍රමාණය නේවාසිකාගාර ලබා දීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායකය විය. නව නේවාසිකාගාරය කාමර 31 කින් සමන්විත වන අතර එහි සෑම කාමරයකම සිසුන් 06 දෙනෙකුට නවාතැන් ගත හැකියාව පවතී. පැරණි නේවාසිකාගාරය කාමර 30 කින් සමන්විත වන අතර සෑම කාමරයකම සිසුන් 04 දෙනෙකුට නවාතැන් ගැනීමේ හැකියාව ඇත/

නේවාසිකාගාරයේ පූර්ණ කාලීනව නවාතැන් ගත් සිසුන් මාසිකව විශ්වවිද්‍යාලයට නවාතැන් ගාස්තු ගෙවිය යුතු අතර සති අන්තයේ පමණක් නවාතැන් ගන්නා සිසුන් ගෙන් දෛනික ගාස්තුවක් ය කරනු ලබයි.

නේවාසිකාගාර පහසුකම් පරිපාලනය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විෂය පථය යටතේ පවතී. නේවාසිකාගාර පාලිකාව ලෙස ස්ථිර ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකාවක් පත් කරන අතර කාන්තා උප පාලිකාව පත් කරනු ලබනුයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය තුළිනි.

## 14. මූල්‍ය වාර්තාව

- මූල්‍ය තත්ව ප්‍රකාශය
- මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය
- අයවැය හා සත්‍ය මුදල සංසන්දනය කිරීමේ ප්‍රකාශය
- ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති
- ගිණුම් සටහන්

## 14.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2022 | 2021 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | | (රුපියල්) | (රුපියල්) |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| | | | |
| මුදල් හා මුදල් සමාන දේ | 2 | 20,587,988 | 18,714,869 |
| අත්තිකාරම්, අයවිය යුතු තැන්පතු | 3 | 569,430 | 252,460 |
| තොග | | 6,419,498 | 4,331,186 |
| පෙර ගෙවීම් | 4 | 1,095,230 | 1,211,187 |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් | 5 | 7,260,690 | 6,894,713 |
| ණයගැතියෝ හා වෙනත් අයවිය යුතු දේ | 6 | 8,364,269 | 5,898,712 |
| | | **44,297,105** | **37,303,127** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| | | | |
| ආයෝජන | 7 | 82,338,542 | 67,807,126 |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 1,945,857,463 | 1,228,371,030 |
| සිදුකෙරෙමින් ඇති ප්‍රාග්ධන කාර්ය | 9 | 328,364,573 | 330,624,193 |
| අස්පෘශ්‍ය වත්කම් | 10 | 1,892,796 | 1,046,564 |
| | | **2,358,453,375** | **1,627,848,913** |
| **මුළු වත්කම්** | | **2,402,750,479** | **1,665,152,040** |
| | | | |
| **බැරකම්** | | | |
| **ජංගමබැරකම්** | | | |
| | | | |
| | | | |
| ගෙවිය යුතු ගිණුම් හා වෙනත් වගකීම් | 11 | 31,924,357 | 32,971,517 |
| ආපසු ගෙවිය යුතු කෙටි-කාලීන තැන්පතු | 12 | 13,855,275 | 9,270,200 |
| කල්බදු වගකීම | 13 | 2,812,497 | 2,494,894 |
| | | **48,592,129** | **44,736,611** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| | | | |
| පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම | 14 | 118,252,228 | 110,514,814 |
| ආපසු ගෙවිය යුතු දිගු-කාලීන තැන්පතු | 15 | 50,560,000 | 44,345,000 |
| කල්බදු වගකීම | 16 | 1,275,052 | 4,087,550 |
| | | | |
| | | **170,087,280** | **158,947,364** |
| | | | |
| **මුළු බැරකම්** | | **218,679,409** | **203,683,975** |
| | | | |
| **මුළු ශුද්ධ වත්කම්** | | **2,184,071,070** | **1,461,468,065** |
| | | | |
| **ශුද්ධ වත්කම්/ කොටස්හාරය** | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 821,360,737 | 27,837,891 |
| සමුච්චිත අරමුදල | 17 | 1,362,091,021 | 1,433,010,862 |
| වෙනත් අරමුදල් | 18 | 619,312 | 619,312 |
| **මුළු ශුද්ධ වත්කම්/ කොටස්හාරය** | | **2,184,071,070** | **1,461,468,065** |

පිටු අංක 06 සිට 10 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා ඇති සටහන් මේ මූල්‍ය ප්‍රකාශයන්හිම කොටසක් වේ.

පිළියෙළ කලේ

ජී.ඒ.ඒ.කේ. දිල්රුක්ෂි
සහකාර මූල්‍යාධිකාරි

**සහතිකය**

ඉහත මූල්‍ය ප්‍රකාශන 2022.12.31 දිනට කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවත් 2022.12.31 අවසන් වර්ෂය සඳහා එහි අතිරික්තය / හිඟය පවතින බවත් මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය තුළ පවතින බවත් ඒ සඳහා වරින් වර සමාලෝචන සිදු කරන බවත් අපි සහතික කරමු. මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීම සහ ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කරයි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා
උප කුලපති

ඒ.පී අළුත්ගේ
අධ්‍යක්ෂ මුදල්

පාලක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර, ඒ වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

එස්. සී. ජගත්
සාමාජික

එම්.ඒ.එස්. දාබරේරා
සාමාජික

2023 පෙබරවාරි 22 වන දින කොළඹදීය.

## 14.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | සටහන | 2022 | 2021 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | | (රුපියල්) | (රුපියල්) |
| **මෙහෙයුම් ආදායම** | | | |
| **හුවමාරු නොවන ගනුදෙනු වලින් වන අයභාරය - පුනරාවර්තන** | | | |
| පුනරාවර්තන ප්‍රදානය - භාණ්ඩාගාරය | | **382,900,000** | **341,350,000** |
| කාර්ය මණ්ඩල සංවර්ධන ප්‍රදානය | | **282,850** | **73,650** |
| නිපුණතා ආංශික සංවර්ධන ප්‍රදානය | 19 | **-** | **2,764,973** |
| පුනරාවර්තන අරමුදල් - TESS | 20 | **11,386,598** | |
| | | **394,569,448** | **344,188,623** |
| **හුවමාරු ගනුදෙනු වලින් වන අයභාරය** | | | |
| අධ්‍යනය කටයුතු වලින් ලද අදායම | 21 | 2,015,594 | |
| අධුකලා - අධ්‍යනය කටයුතු සඳහා සෘජු වියදම | 22 | **164,747** | |
| අධ්‍යනය කටයුතුවලින් ලද ශුද්ධ ආදායම | | **1,850,847** | |
| උපාධි වැඩසටහන්වලින් ආදායම | 23 | **31,344,115** | **21,327,209** |
| TVEC ආදායම | 24 | **381,965** | **942,300** |
| වෙනත් ආදායම් | 25 | **13,514,187** | **8,543,508** |
| | | **47,091,114** | **30,813,017** |
| **මුළු ආදායම -පුනරාවර්තන** | | **441,660,562** | **375,001,640** |
| **හුවමාරු නොවන ගනුදෙනු වලින් වන අයභාරය - ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල් - භාණ්ඩාගාරය | | 21,722,218 | 5,126,350 |
| ප්‍රාග්ධන අරමුදල් - TESS | | 6,871,922 | |
| **මුළු ආදායම - ප්‍රාග්ධන** | | **28,594,140** | **5,126,350** |
| **මුළු ආදායම** | | **470,254,702** | **380,127,990** |
| | | | |
| | | | |
| **මෙහෙයුම් වියදම් - පුනරාවර්තන** | | | |
| සේවක වියදම | 26 | **322,862,302** | **302,753,308** |
| සැපයුම් හා අවශ්‍ය දේ | 27 | **10,861,471** | **6,976,940** |
| නඩත්තු වියදම් | 28 | **6,621,145** | **4,777,006** |
| සේවා | 29 | **86,338,189** | **69,736,406** |
| නිපුණතා අංශික සංවර්ධන වැඩසටහන වියදම් | 30 | | **2,764,973** |
| TVEC වියදම | 31 | **381,965** | **942,300** |
| TESS ව්‍යාපෘති වියදම් | 32 | **11,386,598** | **8,550** |
| | | | |
| | | **438,451,670** | **387,959,483** |
| | | | |
| මෙහෙයුම් නොවන වියදම් | | | |
| දේපළ පිරියත සහ උපකරණ මත ක්ෂය සහ ක්‍රමක් ක්ෂය | 33 | **88,875,194** | **89,369,519** |
| | | **88,875,194** | **89,369,519** |
| | | | |
| මුළු වියදම | | **527,326,864** | **477,329,002** |
| | | | |
| කාල සීමාව සඳහා මුළු අතිරික්තය /හිගය | | **(57,072,162)** | **(97,201,012)** |

කාලපරිච්ඡේදය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන අතිරික්තය /හිගය සහ කාලපරිච්ඡේදය සඳහා මුළු අතිරික්තය / හිගය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය/(හිගය) | 3,208,892 | (12,957,842) |
| කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිගය) | (60,281,054) | (84,243,170) |
| | ~~(57,072,162)~~ | ~~(97,201,012)~~ |

පිටු අංක 06 සිට 10 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා ඇති සටහන් මේ මූල්‍ය ප්‍රකාශයන්හිම කොටසක් වේ.

## 14.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | 2022 | 2021 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|
| | (රුපියල්) | (රුපියල්) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය වීම්** | | |
| | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් අතිරික්තය/හිඟය | (57,072,162) | (97,201,012) |
| | | |
| **මුදල් නොවන සංචලනයන්** | | |
| විලම්බිත ආදායම/ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | | (88,673,234) |
| ක්ෂය හා ක්‍රමක්ෂය | 88,875,194 | 89,369,519 |
| | ND-5057 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා) | 200,832 | 36,591 |
| | සිබීඑච් 3320 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා) | 118,013 | 95,468 |
| | | | |
| | **පිරියත, යන්ත්‍ර හා උපකරණ** | | |
| | පරිගණක හා උපාංග | 1,150,002 | 40,400 |
| | ගෘහ භාණ්ඩ හා වැද්දුම් | 4,800 | 205,400 |
| | ඡායා පිටපත් හා වායු සමන යන්ත්‍ර සහ විදුලි සෝපාන | 2,232,991 | 2,411,652 |
| | කාර්යාල උපකරණ | 458,590 | 138,500 |
| | වෙනත් | 749,385 | 1,028,268 |
| | **ගොඩනැගිලි ව්‍යුහය** | | |
| | ප්‍රධාන ගොඩනැගිල්ල | 151,250 | |
| | පුහුණු තාක්ෂණ පීඨය | 39,933 | 5,000 |
| | නේවාසිකාගාරය | 68,716 | |
| | කාර්ය මණ්ඩල නිලනිවාස | 21,875 | 55,910 |
| | ශ්‍රවනාගාරය | | 2,500 |
| | සිරීසි | 500 | |
| | වෙනත් | 458,052 | 216,353 |
| | | **6,621,145** | **4,777,006** |
| | | | |
| 29 | **සේවා** | | |
| | **ප්‍රවාහන** | | |
| | වාහන කුලිය | 26,482 | 42,388 |
| | දුම්රිය වාරප්‍රවේශපත්‍ර | 166,070 | |
| | ගමන් වියදම් | 28,315 | 3,695 |
| | තැපැල් ගාස්තු | 366,866 | 94,198 |
| | දුරකථන | 542,694 | 1,899,059 |
| | අන්තර්ජාල සේවය | 9,008,503 | 8,552,811 |
| | නීති ගාස්තු | 739,500 | 323,520 |
| | කුවිතාන්සි සඳහා මුද්දර | | |
| | විදුලිය | 11,516,313 | 6,590,804 |
| | ජලය | 1,678,697 | 1,256,764 |
| | කුලිය | | |
| | බදු | 33,555 | 33,555 |
| | රක්ෂණ හා ලියාපදිංචි ගාස්තු | 671,692 | 647,329 |
| | විෂයමාලා සංවර්ධනය | 95,500 | 537,600 |
| | ආරාධිත කථිකාචාර්ය ගාස්තු | 24,210,766 | 24,813,054 |
| | ශිෂ්‍ය පුහුණු | 1,023,652 | |
| | පුහුණු මාධ්‍යය කළමනාකරණවේදී උසස් ඩිප්ලෝමාව | 100,930 | 58,894 |
| | සංස්ථාමය සාමාජීය වගකීම | | |
| | ඉගෙනුම් ද්‍රව්‍ය | 141,065 | 3,500 |
| | ප්‍රදානෝත්සව/ උපාධි ප්‍රදානෝත්සවය | 6,449,262 | |
| | ප්‍රචාරය (වෙළඳ ප්‍රචාරණය) | 1,451,799 | 2,384,999 |
| | කාර්ය මණ්ඩල සංවර්ධනය | 257,500 | 73,650 |
| | කාර්ය මණ්ඩල සංවර්ධන - එස්ඩීසි | 25,350 | |
| | ප්‍රකාශන | 1,800 | 9,000 |
| | පුවත්පත් හා වාර සඟරා | 145,680 | 136,602 |
| | උත්සව අවස්ථා හා පරිත්‍යාග | | 2,330 |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි භාරකාර සේවාව | 8,807,012 | 11,004,807 |
| | ආරක්ෂක සේවය | 11,845,522 | 7,057,040 |
| | සහභාගිකයින් සඳහා ආහාර | 1,258,122 | 442,893 |

## මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | 2022 | 2021 |
|---|---|---|---|
| | | **රුපියල්** | **රුපියල්** |
| | ප්‍රදර්ශන | 809,971 | |
| | විභාග ගාස්තු | 1,963,270 | 646,900 |
| | පර්යේෂණ | 44,300 | 141,852 |
| | පරිවර්තන | 110,328 | 297,330 |
| | සාමාජිකත්වය | 717,037 | 520,224 |
| | මෘදුකාංග යාවත්කාලීන කිරීම | 678,002 | |
| | මූල්‍ය සහ වෙනත් ගාස්තු | 693,234 | 940,473 |
| | විගණන ගාස්තු | 500,000 | 947,500 |
| | කර්මාන්ත පුහුණුව | | |
| | සාමාජීය අලෙවිකරණය | | 15,960 |
| | විවිධ | 229,400 | 257,675 |
| | | **86,338,189** | **69,736,406** |
| | | | |
| 30 | **මෙහෙයුම් වියදම් - නිපුනතා සංවර්ධන අංශය** | | |
| | විද්වතුන් සඳහා කෙටිකාලීන පාඨමාලා | | 453,419 |
| | තක්සේරුකාර පුහුණුව | | 14,987 |
| | ජාතික නිපුණතා සුදුසුකම් 5 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුකරුවන් සඳහා | | 29,250 |
| | විෂයමාලා සංවර්ධනය | | 942,300 |
| | පශ්චාත් උපාධිධාරීන් | | 1,524,900 |
| | ආයතනික සම්බන්ධීකාරක ගෙවීම් | | 742,417 |
| | | | |
| | **මුළු මෙහෙයුම් වියදම්** | | **2,764,973** |
| | | | |
| 31 | **ටිවීඊසී වියදම** | | |
| | **විෂයමාලා සංවර්ධන** | 381,965 | 942,300 |
| | | **381,965** | **942,300** |
| | | | |
| 32 | **මෙහෙයුම් වියදම් - ටීඑස්එස් ව්‍යාපෘතිය** | | |
| | **විෂයමාලා සංවර්ධන** | 11,386,598 | |
| | | | |
| | | **11,386,598** | |
| | | | |
| 33 | ක්ෂය සහ ක්‍රමක්ෂය | | |
| | **ක්ෂය - ස්ථාවර වත්කම් අත්කර ගැනීම** | | |
| | ගොඩනැගිලි | 26,247,570 | 27,126,841 |
| | වතුර මල | 559,531 | 559,531 |
| | මෝටර් වාහන | 2,665,576 | 3,085,799 |
| | කල්බදු වාහන | 2,989,413 | 2,989,413 |
| | පරිගණක | 8,537,613 | 8,166,424 |
| | ගෘහභාණ්ඩ හා වැද්දුම් | 4,181,481 | 4,038,870 |
| | කාර්යාලීය උපකරණ | 1,062,381 | 2,071,576 |
| | ඉගැන්වීම් උපකරණ | 14,998,219 | 14,789,137 |
| | ග්‍රන්ථ | 1,221,773 | 1,221,760 |
| | පිරියත හා යන්ත්‍රෝපකරණ | 13,217,922 | 12,288,451 |
| | වෙනත් වත්කම් | 702,310 | 639,143 |
| | | **76,383,789** | **76,976,945** |
| | **ක්ෂය - ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය** | | |
| | ගොඩනැගිලි | 10,059,286 | 10,059,286 |
| | ප්‍රධාන ගොඩනැගිල්ල | 880,058 | 880,058 |
| | ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 538,634 | 538,634 |
| | පිරියත හා යන්ත්‍රෝපකරණ | 9,616 | 9,616 |
| | වෙනත් වත්කම් | | |
| | මායිම් තාප්ප | 43,724 | 43,724 |
| | | **11,531,318** | **11,531,318** |

| | | | |
|---|---|---|---|
| | **කාලපරිච්ඡේදය සඳහා මුළු ක්ෂය** | **87,915,107** | **88,508,263** |
| | | | |
| | ක්‍රමක්ෂය | | |
| | **ක්‍රමක්ෂය - ස්ථාවර වත්කම් අත්කර ගැනීම** | | |
| | අස්පෘශ්‍ය වත්කම් | 960,087 | 861,256 |
| | **ක්‍රමක්ෂය - ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා දියුණු කිරීම්** | | |
| | අස්පෘශ්‍ය වත්කම් | | |
| | කාලපරිච්ඡේදය සඳහා මුළු ක්‍රමක්ෂය | 960,087 | 861,256 |
| | මුළු ක්ෂය හා ක්‍රමක්ෂය | **88,875,194** | **89,369,519** |

# 15. විගණන වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. : විඕටී/ඒ/යූවීටී/එෆ්ඒ/2022/03
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2023 මැයි 31 දින

UNIVERSITY OF VOCATIONAL TECHNOLOGY
VICE CHANCELLOR'S OFFICE
08 JUN 2023
UNIVOTEC
No. 100, Kandawala, Ratmalana.
SRI LANKA

උපකුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } විඕටී/ඒ/යූවීටී/එෆ්ඒ/2022/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

උපකුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර

කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 752(2) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් 2020 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ආ) | 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ II කොටස | පනතේ II වන කොටසේ දක්වා ඇති අරමුණු ඉටුවන ආකාරයට 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2014/02/11දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/ 2014 හි 04(i) වගන්තිය | පර්යේෂණ දීමනා සඳහා සුදුසුකම් ලබන අදාල නිලධාරීන් පර්යේෂණ යෝජනාව සම්පූර්ණ කර පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත භාරදී අනුමැතිය ලබාගත යුතු වුවද පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකරන ලද නිලධාරීන් 43 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා ලෙස එකතුව රු. 13,437,487 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**2.3** වෙනත් කරුණු

(අ) සේවක ගැටළු මුල්කරගෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනා මණ්ඩල වල නොවිසඳු නඩු පවතින අතර ඒ වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු. 733,500 ක් විශ්වවිද්‍යාලය විසින් වියදම් දරා තිබුණි.

(ආ) 2018 නොවැම්බර් මාසයේදී ඊ පුස්තකාල සේවාව ස්ථාපිත කිරීම සඳහා රු.4,003,504 ක් වැයකර තිබුණද හය ක්‍රියාකාරීව පවත්වා ගෙන යාමට නොහැකිවීම තුලින් එම දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. තවද ඊ පුස්තකාලයෙන් ඉවත් කරන ලද පරිගණක 20 ක්, ස්ටුඩියෝ කබඩ් 05 ක් හා පුටු 20 ක් ද වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව බාහිර පාර්ශවයන් සමඟ සහයෝගීතාවයෙන් නව උපාධි පාඨමාලා හඳුන්වාදීම යටතේ ජේෂකර්ම හා ඇහලුම් තාක්ෂණය පිළිබඳ උපාධිය, ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ උපාධිය හා අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය යනාදී පාඨමාලා හඳුන්වාදීම සිදුකර නොතිබුණි.

(ඇ) 2017 ජනවාරි 03 දිනැති අංක අමප/16/2673/720/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, සිසුන් 600 ක් සඳහා නේවාසිකාගාරයක් සහ ආසන 300 කින් යුතු ආපන ශාලාවක් ඉදිකිරීමට රු. මිලියන 927.34 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. 2018, 2019 හා 2020 වර්ෂයන්හිදී මේ සඳහා රු. මිලියන 281.36 ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණ ද එම මුදලින් රු. මිලියන 22.5 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඉහළ කළමනාකරණය විසින් නිසි කලට තීරණ නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05 ක් සහ මාස 06 ක් ගත වී ඇතත් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා 2022 ජූනි මාසයේදී රු. මිලියන 3,046.8 කට නැවත ඇස්තමේන්තුගත කර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භක කාලය සමඟ සැසඳීමේදී සියයට 300 කටත් වඩා වැඩි වටිනාකමක් බවට පත් වී තිබුණි.

(ඉ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 434.4 ක් මහා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් වෙන්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 වන විට ඉන් රු. මිලියන 304.5 ක් වියදම් කර තිබූ අතර මෙම ගොඩනැගිල්ලේ හඳුනාගත් දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයට භාරදී නොතිබුණි.

(ඊ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විභාග අංශයේ කටයුතු සඳහා (EMIS) පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබූ අතර එම පද්ධතිය භාවිතා කරන්නන් කළමනාකරණය කිරීම සඳහා නිසි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර පද්ධතිය විගණනය කිරීම සඳහා පහසුකම් (Audit Trails) පද්ධතිය තුල නොතිබුණි. ශිෂ්‍ය කටයුතු කළමනාකරණය කිරීම හා විභාග කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් පද්ධතිය තුල නොමැති බැවින් එම අඩුපාඩු නිවැරදි කිරීමට සහ නවීකරණය කිරීමට නිෂ්පාදිත ආයතනයට නොහැකි වී තිබුණි. තවද මානව සම්පත් කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතිය (SUWAS) වෙනුවෙන් රු. 281,250 ක් වැය කර තිබුණද වාර්තාවේ දින දක්වාම ක්‍රියාත්මක තත්ත්වයට පත් කර නොතිබුණි. තවද විශ්වවිද්‍යාලයේ පවතින පරිගණක විද්‍යාගාර 08ක් ඌන උපයෝජිතව පැවතුණි. ඒ අනුව මෙම පද්ධතිය උපරිම ධාරිතාවයෙන් භාවිතා නොකරන බව අනාවරණය විය.

(උ) පූර්ණ වැටුප් සහිත වසර 01 සිට වසර 2 ½ අතර කාලයක් අධ්‍යයන නිවාඩු ලබා සිටි නිලධාරීන් 04 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.11,086,021 ක්වූ අතර එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණු අතර ඉන් එක් නිලධාරියෙක් සේවයෙන් ඉල්ලා අස් වී තිබුණි.

(ඌ) 2014 ජුනි 23 දිනැති රක්ෂිත වටිනාකම රු. 1,650,000 ක් වූ බස්රථය 2019 මාර්තු 21 දින සිට විගණිත දිනය වූ 2023 ජනවාරි 09 දින දක්වාම නිෂ්කාර්යව නවතා දමා තිබුණි.

(එ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති Director Staff Development Centre නැමති තනතුරක් සඳහා නිලධාරියෙකු 2020 දෙසැම්බර් 30 දින සිට 2022 මාර්තු 30 දින දක්වාත් තවත් නිලධාරියෙකු 2022 අප්‍රේල් 01 සිට නොවැම්බර් 30 දින දක්වාත් පත්කර එකතුව රු. 3,758,629 ක දීමනා ගෙවා තිබුණි.

(ඒ) විශ්වවිද්‍යාල විද්‍යායතනය තුලින් බිහිවන ඩිප්ලෝමාධාරීන්ට අමතරව මෙම විශ්වවිද්‍යාලය ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමය තුලින් උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂිත සිසුන් පදනම්ව ගොඩනැගුණු විශ්වවිද්‍යාලයක් බැවින් පාසල් පද්ධතිය තුල මෙම විශ්වවිද්‍යාලය ප්‍රචලිත

කිරීමෙන් සිසුන් දැනුවත් කල හැකි වුවත් ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**<u>විගණන විමසුම් අංක වීඕටී/ඒ/යූවීටී/එෆ්03/2022/ අංක දරණ සහ 2023.05.31 දිනැති, 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව අවසන් විගණන වාර්තාව සඳහා පිළිතුරු</u>**

<table>
<tr><th>අංකය</th><th>විගණන විමසුම</th><th>වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>2.2.2</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.<br>
<table>
<tr><th></th><th>නීතිරීති / විධානයට යොමුව</th><th>නිරීක්ෂණ</th></tr>
<tr><td>(අ)</td><td>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 752(2)</td><td>වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් 2020 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.</td></tr>
<tr><td>(ආ)</td><td>2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ II කොටස</td><td>පනතේ II වන කොටසේ දක්වා ඇති අරමුණු ඉටුවන ආකාරයට 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.</td></tr>
<tr><td>(ඇ)</td><td>2014/02/11දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/ 2014 හි 04 (i) වගන්තිය</td><td>පර්යේෂණ දීමනා සඳහා සුදුසුකම් ලබන අදාල නිලධාරීන් පර්යේෂණ යෝජනාව සම්පූර්ණ කර පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත භාරදී අනුමැතිය ලබාගත යුතු වුවද පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකරන ලද</td></tr>
</table>
</td><td>2020 වර්ෂයට අදාලව දෙපාර්තමේන්තු 42 ක් හඳුනා ගත්තද, භාණ්ඩ සමීක්ෂණය අදාල දෙපාර්තමේන්තු 29 ක පමණක් අවසන් කර තිබුණි.<br>2021 වර්ෂයට අදාලව දෙපාර්තමේන්තු 35ක් හඳුනා ගත්තද, භාණ්ඩ සමීක්ෂණය අදාල දෙපාර්තමේන්තු 19ක පමණක් අවසන් කර තිබුණි.<br>2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා කාණ්ඩ 20 ක් යටතේ සිදු කරන ලද අතර, 2023.06.30 දින එම වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඇත.<br><hr>ඉංජිනේරු තාක්ෂණ විෂය තුළ ඉදිකිරීම්, නිෂ්පාදනය සහ සේවා අංශවලට අදාළ උපාධි පාඨමාලාවන් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. අනෙකුත් සියළු පීඨවලද ඉහත කී ක්ෂේත්‍ර වලට අදාල සහ සේවා අංශයන්ට අදාලව උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. තවද පසුගිය තුන් වසර තුළ රැකියා වෙළඳපොලෙහි අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් අලුතින් පාඨමාලා හඳුන්වාදීම සිදු වූ අතර, (පරිවර්තන අධ්‍යයනය, ජෛව පද්ධති තාක්ෂණ , තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තවත් පාඨමාලා හඳුන්වා දීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරමින් පවතී.<br>මෙම නිළධාරීන් 43 දෙනා වෙත විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාල පර්යේෂණ දීමනා ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කළ පර්යේෂණ සඟරා (Research journal) සහ පර්යේෂණ සම්මන්ත්‍රණ ප්‍රකාශන (Research Conference Publications) යන පටිපාටිය මත ගෙවීම් කර ඇත. එම නිළධාරීන් අදාල පර්යේෂණ පත්‍රිකා (Research</td></tr>
</table>

| | | |
|---|---|---|
| | නිලධාරීන් 43 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා ලෙස එකතුව රු. 13,437,487 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි. | Publications) වල සහතික පිටපත් විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇත. |
| 2.3 | වෙනත් කරුණු | |
| (අ) | සේවක ගැටළු මුල්කරගෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනා මණ්ඩල වල නොවිසඳු නඩු පවතින අතර, ඒ වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු. 733,500 ක් විශ්වවිද්‍යාලය විසින් වියදම් දරා තිබුණි. | විශ්වවිද්‍යාල පනතේ අංක 36 හා 68 වගන්තිය යටතේ අන්තර්ග්‍රහන අවස්ථාවේ තමාහට යම් අසාධාරණයක් සිදු වූයේ යැයි යන හැඟීමෙන් යුතු සේවකයින් විසින් විශ්වවිද්‍යාලයේ අභියාචනා මණ්ඩලයට අභියාචනා ඉදිරිපත් කරන ලදී.<br><br>මේ දක්වා කාලය තුලදී අභියාචනා මණ්ඩලය 02 ක් ක්‍රියාත්මක වූ අතර පළමු අභියාචනා මණ්ඩලයේ අභියාචනා 03 ක් සඳහා නියෝග ලබාදුන් අතර, තව 21 ක් විභාග කිරීමට නියමිතව ඇත. අභියාචනා මණ්ඩල 02 මගින් අභියාචනා 15 ක් සඳහා නියෝග ලබාදී ඇති අතර එක් අභියාචනයක් විභාග කිරීමට නියමිතය. අභියාචනා මණ්ඩලය මගින් ලබාදුන් සමහර නියෝග සඳහා පාලක මණ්ඩල එකඟත්වය පල නොකල හෙයින් පනතේ 37 වගන්තිය අනුව අභියාචනාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කර ඇත.<br><br>ඒ අනුව, අභියාචනාධිකරණය මගින් තීන්දු 02 ක් විශ්වවිද්‍යාලයට වාසිදායක වන ලෙස ලබාදුන් අතර එම තීරණවලට එරෙහිව එකී නිලධරයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා එම නඩු දෙකම නිශ්ප්‍රභා වී ඇත.<br>විශ්වවිද්‍යාලය විසින් අභියාචනා අධිකරණයේ රිට් පෙත්සමක් මගින් ගොනු කරන ලද නඩුවක් මේ වන විට විභාග වෙමින් පවතී.<br><br>කථිකාචාර්ය (ආධුනික) තනතුරට පත්කරන ලද නිලධරයෙකු එම තනතුරට අදාල සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වීමෙන් පසු එම නිලධරයාගේ සුදුසුකම්වලට අනුව ගුරු සහකාර තනතුරෙහි පිහිටවනු ලැබූ අතර මේ සම්බන්ධයෙන් 2017-12-04 දින නීතිමය උපදෙස් ලබාගෙන ඇත. අනතුරුව අදාල නිලධරයා විසින් විශ්වවිද්‍යාලයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් සම්බන්ධයෙන් 2018-06-08 දින පැමිණිල්ලක් ගොනුකර ඇති අතර මෙය විභාග වෙමින් පවතී. නිසි ලෙස සේවයට වාර්තා |

| | | |
|---|---|---|
| | | නොකරන ලද නිලධරයෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් ගොනු කරන ලද අතර එහිදී තීරණය වූයේ විශ්වවිද්‍යාලය නිවැරදි බවත් ඒ අනුව ඔහු විසින් ගිවිසුම්ගත දණ්ඩන මුදල විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බවත්ය. ඔහු දැනට සේවයේ නොමැති හෙයින් එම දණ්ඩන මුදල අයකර ගැනීම සඳහා ගල්කිස්ස දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.<br><br>මේ අනුව කිසිවිටකත් විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය තුල නඩු ගොනු කර නොමැති අතර, කාර්ය මණ්ඩල නිලධරයෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අවස්ථාවක ඒ සඳහා අවශ්‍ය නීතිමය සහාය නීතිපති දෙපාර්තමේන්තුව මගින් ලබාගෙන ඇත. |
| (ආ) | 2018 නොවැම්බර් මාසයේදී ඊ පුස්තකාල සේවාව ස්ථාපිත කිරීම සඳහා රු.4,003,504 ක් වැයකර තිබුණද එය ක්‍රියාකාරීව පවත්වා ගෙන යාමට නොහැකිවීම තුලින් එම දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. තවද ඊ - පුස්තකාලයෙන් ඉවත් කරන ලද පරිගණක 20 ක්, ස්ටූඩියෝ කබඩ් 05 ක් හා පුටු 20 ක් ද වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | ඊ - පුස්තකාල සේවාව ස්ථාපිතව පැවතියේ ප්‍රධාන පුස්තකාලය පිහිටා ඇති ගොඩනැගිල්ලෙන් පරිබාහිරව වෙනත් ගොඩනැගිල්ලක් තුල වේ. සීමිත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් පුස්තකාලයෙහි සේවයෙහි නියුතුව සිටින බැවින්, ස්ථාන 02ක් වෙත කාර්ය මණ්ඩලය බෙදා හැරීම ඉතා අපහසුය. එක් පරිශ්‍රයක් තුල, ප්‍රධාන පුස්තකාලය සහ ඊ - පුස්තකාලය පවත්වා ගැනීමේ අරමුණින් මෙසේ පරිගණක හා අදාල උපකරණ රැගෙන එන ලද අතර, මේ වන විට එම පරිගණක ප්‍රධාන පුස්තකාල පරිශ්‍රය තුල ස්ථාපිත කර, විදුලි සම්බන්ධතා ලබා දී පරිගණක 05ක් වෙත අන්තර්ජාල පහසුකම් ලබා දී සිසුන්ගේ භාවිතය සඳහා සූදානම් කර ඇත.<br><br>ඊ - පුස්තකාලය පැවති ගොඩනැගිල්ලෙහි පැවති Partition, Network system හා Internet සිනමා, රූපවාහිණී නිශ්පාදන තාක්ෂණ අංශයේ භාවිතය සඳහා යොදවා ඇත. |
| (ඇ) | 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව බාහිර පාර්ශවයන් සමඟ සහයෝගීතාවයෙන් නව උපාධි පාඨමාලා හඳුන්වාදීම යටතේ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය පිළිබඳ උපාධිය, ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ උපාධිය හා අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය යනාදී පාඨමාලා හඳුන්වාදීම සිදුකර නොතිබුණි. | - **පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය පිළිබඳ උපාධිය, ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ උපාධිය**<br><br>ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය හා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යන 02ක සමග 2022.03.23 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම එම ආයතන 02 මගින් ඒකපාර්ශ්විකව උල්ලංඝනය කර ඇති බව දන්වන අතර, ඒ සඳහා හේතු වී ඇත්තේ එකඟවුන ඒකාබද්ධ උපාධිවලට සමාන උපාධියක් එම ආයතන මගින් පසු කාලීනව හඳුන්වා දීමට ගත් පියවරයි. එය නිවැරදි කිරීම සඳහා කැඳවන ලද සාකච්ඡා ද අසාර්ථක වී ඇත. අදාල තොරතුරු ඇමුණුම් අංක |

| | | |
|---|---|---|
| | | 01 මගින් ඉදිරිපත් කර ඇත.<br><br>- **අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හඳුන්වා දීම.**<br><br>ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ආරම්භ කිරීම මෙම පීඨය මගින් සැලසුම් කර තිබුණද අධ්‍යාපනවේදී උපාධිය සිව් වසර දක්වා (ගෞරව උපාධිය) දීර්ඝ කිරීම නිසා අධ්‍යයන කවුන්සලය මගින් අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ආරම්භ කිරීම පසුව සිදු කිරීමට තීරණය කරන ලදී. |
| (ඇ) | 2017 ජනවාරි 03 දිනැති අංක අමප/16/2673/720/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, සිසුන් 600 ක් සඳහා නේවාසිකාගාරයක් සහ ආසන 300 කින් යුතු ආපන ශාලාවක් ඉදිකිරීමට රු. මිලියන 927.34 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. 2018, 2019 හා 2020 වර්ෂයන්හිදී මේ සඳහා රු. මිලියන 281.36 ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණ ද එම මුදලින් රු. මිලියන 22.5 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඉහළ කළමනාකරණය විසින් නිසි කලට තීරණ නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05 ක් සහ මාස 06 ක් ගත වී ඇතත් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා 2022 ජූනි මාසයේදී රු. මිලියන 3,046.8 කට නැවත ඇස්තමේන්තුගත කර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භක කාලය සමඟ සැසඳීමේදී සියයට 300 කටත් වඩා වැඩි වටිනාකමක් බවට පත් වී තිබුණි. | මීට වසර හයකට පමණ පෙර අප ආයතනයේ ඉදිරි අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලෙස වැඩහලක්, නේවාසිකාගාරයක් සහ ආපනශාලාවක් ලෙස ගොඩනැගිලි තුනක් ඉදිකිරීමට අප විසින් තීරණය කරන ලදී. ඊට අදාල ව්‍යාපෘති යෝජනාව 2016 මැයි මස 31 වෙනි දින අප විසින් එවකට අප අමාත්‍යාංශය වූ නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වෙත බාර දෙන ලදී. ඒ සඳහා ජාතික ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය 2016 අගෝස්තු මස 30 වෙනි දින අප වෙත ලැබුණි. අනතුරුව 2017 ජනවාරි 03 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය අදාල ව්‍යාපෘතියට හිමිවිය. ඒ අනුව රු. මිලියන 927.34 ක මුදලක් විශ්ව විද්‍යාලයේ අදාල ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලදී.<br>තවද 2017 සැප්තැම්බර් මස 26 වෙනි දින මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය අදාල ව්‍යාපෘතියේ උපදේශක ලෙස පත්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව අදාල ව්‍යාපෘතියේ උපදේශක ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය 2017 ඔක්තෝම්බර් මස 16 වෙනි දින පත්කරන ලදී.<br>මීට අදාල ගිවිසුමට අප විශ්ව විද්‍යායාලය සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය 2017 නොවැම්බර් මස 30 වෙනි දින එළඹෙන ලදී.<br>අදාල ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලසුම් කිරීමට ප්‍රථම භූ තාක්ෂණික විමර්ශනයක් සිදුකල යුතුව තිබුණි. ඒ සඳහා 2018 ජනවාරි 05 වැනි දින මිල ගණන් කැඳවන ලදී. භූ තාක්ෂණික විමර්ශන වාර්තාව 2018 ජූලි 17 වැනි දින අප වෙත ලැබුණි.<br>අතරතුර කාලයේ දී 2018 මැයි 05 වැනි දින කැබිනට් මණ්ඩලය පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව (CATEC) සහ 2018 මැයි 21 වැනි දින කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) නම් කරන ලදී.<br>මේ අතරතුර තට්ටු හයක උසින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවසරය සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අප වෙත ලැබුණි. මේ සම්බන්දයෙන් |

| | | |
|---|---|---|
| | | අවදානය යොමු කරන ලද අප ආයතනයේ විශ්වවිද්‍යාලයේ, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ දේපල අනුකමිටුව, 2018 ජුලි 16 දින දරන ලිපිය මගින් උප කුලපතිට මෙම ව්‍යාපෘතියේ සඳහන් ආකාරයට වැඩහලක්, නේවාසිකාගාරයක් සහ ආපනශලාවක් ලෙස ගොඩනැගිලි තුනක් ඉදිකිරීම අප ආයතනයට අවාසි සහගත බවත් ඒ වෙනුවට තට්ටු හයකින් සමන්විත තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීම වාසි සහගත බවත් පෙන්වා දෙන ලදී. (ප්‍රදේශයේ ඉඩම සඳහා ඉතා ඉහළ වටිනාකමක් තිබීම සහ වැඩිදුර සංවර්ධනය සඳහා දැනට විශ්වවිද්‍යාලය තුළ ඇත්තේ ඉතා සීමිත ඉඩම් ප්‍රමාණයක් වීම). ඒ අනුව ගොඩනැගිලි තුනක් ඉදිකිරීම වෙනුවට තට්ටු හයකින් සමන්විත තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කරන ලදී.<br>ඒ අනුව සංශෝදනය කරන ලද ලංසු ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුවේ (CATEC) සහ ප්‍රසම්පාදන කමිටුවේ (CAPC) අනුමැතිය සඳහා 2019 ජනවාරි 29 දින අමාත්‍යාංශය වෙත බාර දෙන ලදී. අදාල ලංසු ලේඛන පරික්ෂාකර බලා ගොඩනැගිලි තුනක් ඉදිකිරීම වෙනුවට තට්ටු හයකින් සමන්විත තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ගන්නා ලද තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව අදාල අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදුකරන අතරතුර අදාල ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය විසින් සිදුකරන ලදී. ඒ අනුව 2019 දෙසැම්බර් 18 වෙනි දින ලංසු විවෘත කිරීම සිදුවිය. ඒ වන විටත් ගොඩනැගිලි තුනක් ඉදිකිරීම වෙනුවට තට්ටු හයකින් සමන්විත තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ගන්නා ලද තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. එබැවින් ලංසු ඇගයීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදු නොකරන ලදී.<br>තවද 2019/12/10 දින දරන ගැසට් නිවේදනය අනුව, අප ආයතනය උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමත්‍යාංශය යටතේ ඇති ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද අතර 2020 පෙබරවාරි 24 දින දරන ලිපිය මගින් මෙම ව්‍යාපෘතියට අදාල අංක ADM/02/02/110 දරන ලිපිගොනුව නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමත්‍යාංශයේ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) විසින් නව අමත්‍යාංශය වෙත යොමු කරන ලදී. තවද අදාල ව්‍යාපෘතියට 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ඔවුනට නොහැකි බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර තිබුණි.<br>මේ වනවිට ලංසුවල වලංගු කාලය (2020/03/18) සහ ලංසු ආරක්ෂක බැඳුම්කරවල වලංගු කාලය (2020/06/10) ඉක්මවා ගොස් තිබුණි. එය දීර්ඝ කිරීමට පියවර ගන්නා ලෙස නව අමත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී. 2020 ජුලි 16 වෙනි දින ගොඩනැගිලි තුනක් ඉදිකිරීම වෙනුවට තට්ටු හයකින් සමන්විත තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. |

| | | |
|---|---|---|
| | | මේ වන විට රටේ කොවිඩ් වසංගත තත්ත්වයද උත්සන්න වී තිබුණි. එම තත්ත්වය ක්‍රමයෙන් පහව යද්දී උක්ත ව්‍යාපෘතිය කැබිනට් මණ්ඩලය මගින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් බැවින් මෙහි සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලද්දේ අමත්‍යාංශය මගින් බැවින් අදාල ව්‍යාපෘතිය කඩිනම් කරන ලෙස 2022 පෙබරවාරි 21 දින දරන ලිපිය මගින් අමත්‍යාශයට දැනුම් දෙන ලදී. ඊට පිළිතුරු වශයෙන් මාස තුනකට පමණ පසු 2022/04/26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව අදාල ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනය තාවකාලිකව අත්හිටුවීමට සිදුවන බවට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කාර්යය සම්පාදන) විසින් දැනුම් දෙන ලදී.<br>ඉහත දක්වා ඇති ආකාරයට 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අප විසින් අදාල ව්‍යපෘතිය සාර්ථක කරගැනීම සඳහා ගත යුතු සියලුම ක්‍රියාමාර්ග නිසි පරිදි ගනු ලැබුවද, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුල රටේ උද්ගතවූ කොවිඩ් වසංගත තත්ත්වයත් ආර්ථික සහ දේශපාලන අස්ථාවර බවත්, ඒ අනුව අප අමාත්‍යාංශය සහ ලේකම්වරු වරින් වර මාරුවීම යන කරුණු අනුව අදාල ව්‍යාපෘතිය මුලින් සැලසුම් කළ දින වකවානු වලට සිදුකිරීමට නොහැකි විය.<br>2022 මැයි 04 දිනැති ලිපිය මගින් අදාල ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනය තාවකාලිකව අත්හිටුවීමට අප අමාත්‍යාංශය විසින් දැනුම් දී තිබුනද 2022 ජූනි 03 දින දරන ලිපිය මගින් අදාල ව්‍යාපෘතිය සඳහා නව ඇස්තමේන්තුවක් ලබාගැනීමට පියවර ගන්නා ලදී. තවද අදාල ව්‍යාපෘතිය සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග ගැන විමසමින් අදාල නව ඇස්තමේන්තුව අප විසින් අමාත්‍යාංශය වෙත 2022 ජූනි 30 දිනැති ලිපිය මගින් යොමු කර ඇත.<br>මේ වනවිට අදාල ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනය තාවකාලිකව අත්හිටුවා තිබුනද ඉදිරි කාලයේදී රටේ ආර්ථිකය ස්ථිර වූ පසුව 2022/04/26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ද ජාතික අයවැය චක්‍රලේඛනය අවලංගු කිරීමට රජය ක්‍රියා මාර්ග ගනු ලැබූ වහාම අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මේ වනවිට පියවර ගෙන ඇත.<br>තවද ඒ වනවිට ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් වීමත් සමගම දැනට ආරම්භක කාලයේ මුලික ඇස්තමේන්තුව සියයට 300 ක මට්ටමක පවතින අගය තවදුරටත් සැලකිය යුතු මට්ටමකින් අඩු වීමක් අපේක්ෂා කල හැක. |
| (ඉ) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 434.4 ක් මහා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වෙන්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 වන විට ඉන් රු. | මෙම විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණය සහ දේශනශාලා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අදියර දෙකකින් සිදුකල අතර ශබ්දාගාරයේ ඇතුලත වැඩකටයතු හැර ගොඩනැගිල්ලේ සියළුම අනෙකුත් වැඩකටයතු මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය මගින් සිදුකර විශ්වවිද්‍යාලය වෙත |

| | | |
|---|---|---|
| | මිලියන 304.5 ක් වියදම් කර තිබූ අතර මෙම ගොඩනැගිල්ලේ හඳුනාගත් දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයට භාරදී නොතිබුණි. | භාරදෙන ලදී.<br>අනතුරුව 2016 ජනවාරි මස 08 වෙනි දින විවෘත කරන ලදී. එතැන් සිට මේ දක්වා දේශන ශාලා සියල්ලමත්, පශ්චාත් නිෂ්පාදන චිත්‍රාගාරය (Post Production Studio) සහ ග්‍රැෆික් සහ සජීවිකරණ චිත්‍රාගාරය (Graphic and Animation Studio) යන චිත්‍රාගාරත් අනෙකුත් පරිගණක විද්‍යාගාරත් පූර්ණ වශයෙන් විශ්වවිද්‍යාලය විසින් භාවිතයට ගනු ලැබේ. ඊට අමතරව ප්‍රධාන චිත්‍රාගාරයද (Main Studio) අප විශ්වවිද්‍යාලයේ සහ විශ්වවිද්‍යාල විද්‍යායතන (University Colleges ) වලත් සිසුන්ගේ ප්‍රායෝගික අධ්‍යාන කටයුතු සඳහා භාවිතයට ගනු ලැබේ.<br>දෙවැනි අදියරේදී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට ප්‍රධාන වශයෙන් සිදු කිරීමට තිබුවේ ප්‍රධාන චිත්‍රාගාරයේ (Main Studio) ශබ්ද පරිවරණය (sound insulation) කටයුතු සහ වායු සමීකරණය කිරීමේ කටයුතු පමණි. ඔවුන් විසින් අදාල කාර්යයන් සිදුකර ඇත. නමුත් අප විසින් හඳුනාගත් දෝෂ ඔවුන් විසින් නිවැරදිකරන තෙක් අප විසින් අදාල ගොඩනැගිල්ලේ ප්‍රධාන චිත්‍රාගාරය (Main Studio) නිල වශයෙන් භාරගෙන නොමැත. නමුත් අප විසින් ප්‍රධාන චිත්‍රාගාරයද (Main Studio) මෙම විශ්වවිද්‍යාලයේ සහ විශ්වවිද්‍යාල විද්‍යායතන (University Colleges ) වලත් සිසුන්ගේ ප්‍රායෝගික අධ්‍යාන කටයුතු සඳහා භාවිතයට ගනු ලැබේ.<br>නමුත් හඳුනාගත් දෝෂ ඔවුන් විසින් නිවැරදි කරන තෙක් අප ඔවුන්ට සිදුකල යුතු ගෙවීම් කටයුතු අත්හිටුවා ඇත. තවද මෙම කාර්යන් කඩිනමින් නිමකර දෙනමෙන් ඔවුනට වාචිකව මෙන්ම ලිඛිතවද අඛණ්ඩව දැනුම් දී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අදාල ආයතනයේ බස්නාහිර පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විශ්වවිද්‍යාලයට පැමිණ කඩිනමින් අදාල දෝෂ නිවැරදි කිරීමට එකඟ විය . |
| (ඊ) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විභාග අංශයේ කටයුතු සඳහා (EMIS) පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබූ අතර එම පද්ධතිය භාවිතා කරන්නන් කළමනාකරණය කිරීම සඳහා නිසි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර පද්ධතිය විගණනය කිරීම සඳහා පහසුකම් (Audit Trails) පද්ධතිය තුල නොතිබුණි. ශිෂ්‍ය කටයුතු කළමනාකරණය කිරීම හා විභාග කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් පද්ධතිය තුල නොමැති බැවින් එම අඩුපාඩු නිවැරදි කිරීමට සහ නවීකරණය කිරීමට නිෂ්පාදිත ආයතනයට නොහැකි වී තිබුණි. | විශ්ව විද්‍යාලයේ විභාග අංශයේ කටයුතු සඳහා භාවිතා කරනු ලබන පරිගණක පද්ධතිය (Education Management information System -EMIS) හි එක් ඇඩ්මින් පරිශීලක ගිණුමක් පවතින අතර විභාග අංශයේ එම ගිණුම විභාග අංශ ප්‍රධානියා සතුව පවතී. විභාග අංශයේ අනෙකුත් නිලධාරීන් හට ඔවුන්ගේ රාජකාරීමය වපසරිය අනුව පද්ධතියේ ඔවුන්ට අදාල වන එක් එක් අංශ වෙත පමණක් ප්‍රවේශ පහසුකම ලබා දී ඇත. මීට අමතරව පද්ධතියේ පවත්නා තොරතුරු ඉවත් කිරීමේ හෝ වෙනස් කිරීමේ හැකියාව ඇඩ්මින් ගිණුම හිමි අංශ ප්‍රධානියා සතුව පමණක් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. |

| | | |
|---|---|---|
| | මානව සම්පත් කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතිය (SUWAS) වෙනුවෙන් රු. 281,250 ක් වැය කර තිබුණද වාර්තාවේ දින දක්වාම ක්‍රියාත්මක තත්ත්වයට පත් කර නොතිබුණි.<br><br>විශ්වවිද්‍යාලයේ පවතින පරිගණක විද්‍යාගාර 08ක් ඌන උපයෝජිතව පැවතුණි. ඒ අනුව මෙම පද්ධතිය උපරිම ධාරිතාවයෙන් භාවිතා නොකරන බව අනාවරණය විය. | විශ්වවිද්‍යාලයීය කාර්යමණ්ඩලයේ දෛනික පැමිණීම ගබඩා කරගැනීම ප්‍රමුඛ කොට ගෙන මෙම පරිගණක වෙබ් මෘදුකාංග 2020 වර්ෂයේදී මිලදී ගෙන ඇත. එම වෙබ් මෘදුකාංගය අප විශ්වවිද්‍යාලය වෙනුවෙන්ම නිර්මාණය වූවක් නොවන අතර මෙම පද්ධතිය ලබාගැනීමෙන් අනතුරුව එහි පැවති විශේෂාංග (Features) අප විශ්වවිද්‍යාලයේ නිවාඩු අයදුම් කිරීම ක්‍රියාවලියට යොදාගත හැකි බව හඳුනා ගැනීමත් සමඟ 2020 වර්ෂයේදී ම එම වෙබ්මෘදුකාංගය අප ආයතනයේ ක්‍රමවේදයට උචිත පරිදි සකසා යාවත්කාලීන කොට අප ආයතනයේ සියලුම නිළධරයන් වෙත වෙන් වෙන්වූ පරිහරණ ගිණුම් (User Accounts) ලබාදී ඒ හරහා නිවාඩු අයදුම් කරන ආකාරය පිළිබඳව අදාල සේවා සපයන ආයතනය මඟින් අප කාර්යමණ්ඩලය වෙත දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වා ඔවුන්ව විධිමත්ව පුහුණු කර මෙම මෘදුකාංගය දියත් කල අතර කාර්යමණ්ඩල නිළධරයන් මේ හරහා විධිමත්ව නිවාඩු අයදුම් කිරීම සිදුකරයි. මෙමඟින් කඩදාසි භාවිතය අවම වීම හා පැහැදිලි වාර්තා ලබාගැනීම පහසු වී ඇත.<br><br>නිවාඩු පද්ධතියේ තොරතුරු ගබඩා කිරීමේ වැඩපිළිවෙලක් එය ආරම්භයේ සිට මේ දක්වා විශ්වවිද්‍යාලය තුල ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ද සම්පත් දායකත්වය අදාල සේවා සැපයීමේ ආයතනය මඟින් විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ සේවා අංශය හරහා මේ වන විටත් ලබාදී ඇත. එමෙන්ම මේ දක්වා සියලුම උපස්ථ දත්ත (Backup Data) හා නිවාඩු සම්බන්ධ දත්ත විශ්වවිද්‍යාලයෙන් ලබාගැනීමේ හැකියාව ඇත.<br><br>මෙම පරිගණක විද්‍යාගාර 08 ම වර්තමානයේ සිසුන්ගේ අවශ්‍යතාවය අනුව සතියේ දිනයන්හිදී සහ බොහෝ විට සති අන්තයේදී උපරිම වශයෙන් භාවිතා කිරීම සිදු වේ. |
| (උ) | පූර්ණ වැටුප් සහිත වසර 01 සිට වසර 2 ½ අතර කාලයක් අධ්‍යයන නිවාඩු ලබා සිටි නිලධාරින් 04 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.11,086,021 ක්වූ අතර එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණු අතර ඉන් එක් නිලධාරියෙක් සේවයෙන් ඉල්ලා අස් වී තිබුණි. | මෙම විගණන විමසුමෙහි දැක්වෙන නිලධාරීන් හතර දෙනාගෙන් එක් නිලධාරී මහතෙක් මෙම විශ්වවිද්‍යාලයීය සේවයෙන් ඉවත් වී ඇත. ඔහුගේ බැඳුම්කර වටිනාකම වූ රු. 2,712,556.00 ක මුදලින් රු. 488,369.38ක් මෙම විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති අතර, ඉතිරි මුදල ගෙවීම් කරන ලෙස දැනුම් දී ඇත. නිලධාරීන් දෙදෙනෙකු සිය පශ්චාත් උපාධිය අවසන් කර ඇත. එක් නිලධාරිනියකගේ (එනම්, රු.1,814,469.96 ක් වූ බැඳුම්කර වටිනාකමක් සහිත) |

| | | |
|---|---|---|
| | | පශ්වාත් උපාධි කටයුතු අවසන් කිරීම සඳහා 2023 සැප්තැම්බර් මාසය දක්වා කාලසීමාවක් ඉදිරියට ඇත. |
| (ඌ) | 2014 ජුනි 23 දිනැති රක්ෂිත වටිනාකම රු. 1,650,000 ක් වූ බස්රථය 2019 මාර්තු 21 දින සිට විගණිත දිනය වූ 2023 ජනවාරි 09 දින දක්වාම නිෂ්කාර්යව නවතා දමා තිබුණි. | 62-4816 දරණ බස්රථය අලුත් වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 1.5ක් ලෙස ඇගයීම් කමිටුව විසින් සඳහන් කර තිබුණද ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොතිබුණි. ඒ සඳහා අදාල මුදල් 2021 වසරෙහි ප්‍රතිපාදන වලින් කළමණාකරණය කර ප බ ගන්නා ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලැබුණද 2021 වර්ෂයේ අගභාගයේදී, එම අනුමැතිය ලැබීම හේතුවෙන් කළ නොහැකි වී ඇත. 2022 වර්ෂයේදී අලුත්වැඩියා කටයුතු සඳහා මුදල් නොමැති විය.<br>මෙම බස්රථය German Tech ආයතනය වෙත යොමු කර අළුත්වැඩියාව සිදු කර ගැනීම සඳහා කටයුතු යොදන ලදී. |
| (එ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති Director Staff Development Centre නැමති තනතුරක් සඳහා නිලධාරියෙකු 2020 දෙසැම්බර් 30 දින සිට 2022 මාර්තු 30 දින දක්වාත් තවත් නිලධාරියෙකු 2022 අප්‍රේල් 01 සිට නොවැම්බර් 30 දින දක්වාත් පත්කර එකතුව රු. 3,758,629 ක දීමනා ගෙවා තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්‍රියාකාරකම් සහ භෞතික සංවර්ධනය පුළුල් වීමත් සමඟ ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවනු ලද අතර<br>මෙම මධ්‍යස්ථානයේ රාජකාරි අධීක්ෂණය සඳහා අභ්‍යන්තර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙක් **Director SDC** ලෙස පත්කොට නිලබලයට හිමිවන දුරකථන දීමනාව, ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව පමණක් ගෙවා ඇති අතර අනෙකුත් දීමනා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරෙහි වැටුපට අයත් දීමනා වේ. ඒ අනුව උක්ත නිලධරයන් දෙදෙනාට ගෙවා ඇත්තේ රු 1,878,114.03 ක මුදලක් පමණි.<br>තවද, විශ්වවිද්‍යාල පද්ධතිය තුල අධ්‍යක්ෂ (කාර්ය මණ්ඩල සංවර්ධන) තනතුරක් පවතින අතර එම තනතුර සඳහා අභ්‍යන්තර පත්වීම් සිදුකරනු ලබන අතර මෙම විශ්වවිද්‍යාලයට අනුමත කාර්ය මණ්ඩලයේ පවතින අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණය) තනතුර වෙනුවට මෙම තනතුර භාවිතා කරනු ලැබීය.<br><br>මේ වන විට මෙම මධ්‍යස්ථානය අහෝසි කොට පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවා ඇති අතර මෙය අධීක්ෂණය සඳහා අභ්‍යන්තර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් පත් කොට ඇත. |

| | | |
|---|---|---|
| (ඒ) | විශ්වවිද්‍යාල විද්‍යායතනය තුලින් බිහිවන ඩිප්ලෝමාධාරීන්ට අමතරව මෙම විශ්වවිද්‍යාලය ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමය තුලින් උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂිත සිසුන් පදනම්ව ගොඩනැගුණු විශ්වවිද්‍යාලයක් බැවින් පාසල් පද්ධතිය තුල මෙම විශ්වවිද්‍යාලය ප්‍රචලිත කිරීමෙන් සිසුන් දැනුවත් කල හැකි වුවත් ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය සමාජ මාධ්‍ය වැඩසටහන්, මාධ්‍ය සාකච්ඡා මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වෘත්තීය මාර්ගෝපදේශකවරුන් මගින් පාසල් පද්ධතියද දැනුවත් කරන ලදී. එමෙන්ම විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද වෙලිනාට්‍යයක් මගින්ද සිසුන් දැනුවත් කර ඇත. |

පිළියෙල කිරීම - ........................................
ආර්.ඒ.එන්.ඩී.රූපසිංහ
අභ්‍යන්තර විගණක

පරීක්ෂා කිරීම - ........................................
නිල්මිණි දියබෙදනගේ
අධ්‍යක්ෂ ජනරාල්

අත්සන් කිරීම - ........................................
මහාචාර්ය සී. මහේෂ් එදිරිසිංහ
උපකුලපති

Professor C. Mahesh Edirisinghe
Vice Chancellor
University of Vocational Technology
No.100, Kandawala,
Ratmalana, Sri Lanka

දිනය - 18/07/2027